වාර්ෂික කාර්යසාධන වාර්තාව
வருடாந்த செயற்றிறன் அறிக்கை
ANNUAL PERFORMANCE REPORT

2022

වාරිමාර්ග දෙපාර්තමේන්තුව
நீர்ப்பாசனத் திணைக்களம்
Irrigation Department

වැය ශීර්ෂ - 282

වාරිමාර්ග දෙපාර්තමේන්තුව

2022 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව
වාරිමාර්ග දෙපාර්තමේන්තුව
වැය ශීර්ෂ අංකය- 282

අන්තර්ගතය **පිටු අංක**

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය 1

පරිච්ඡේදය 02 – ප්‍රගතිය හා ඉදිරි දැක්ම 10

පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය 46

පරිච්ඡේදය 04 – කාර්ය සාධන දර්ශක 55

පරිච්ඡේදය 05- තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය 55

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ 56

පරිච්ඡේදය 07– අනුකූලතා වාර්තාව 61

පරිච්ඡේදය 01- ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1. හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ජල සම්පත් සංවර්ධනය සඳහා වගකිවයුතු ප්‍රධාන ආයතනය වාරිමාර්ග දෙපාර්තමේන්තුවයි. විදේශීය හෝ වෙනත් බාහිර උපදේශන නොමැතිව ජල සම්පත් සම්බන්ධ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ශක්‍යතා අධ්‍යයනය, විමර්ශන, ක්‍රම සැලසුම්, සැලසුම් සහ ඉදිකිරීම් කටයුතු සිදු කරන එකම ආයතනය වාරිමාර්ග දෙපාර්තමේන්තුවයි.

මේ වන විට වගා ඉඩම් හෙක්ටයාර 323,786 කට වාරිමාර්ග පහසුකම් සපයන අතර 2030 වර්ෂය වන විට එම ප්‍රමාණය හෙක්ටයාර 350,000 දක්වා වැඩි කිරීමට සැලසුම් කර ඇත. එසේම ජලය හා සම්බන්ධව කටයුතු අනිකුත් රේඛීය ආයතන වන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, පළාත් පාලන ආයතන ආදී වූ පාර්ශවකරුවන් සඳහා තාක්ෂණික සේවා සැපයීම ද සිදු කරනු ලබයි. වාරිමාර්ග දෙපාර්තමේන්තුව සතුව වසර 100කට වැඩි කාලයක් පුරා නඩත්තු කර ඇති විශාල දත්ත ප්‍රමාණයක් ද පවතී.

1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර සහ අරමුණු

1.2.1. දැක්ම

“අහසින් වැටෙන එක දිය බිඳුවකුදු ලෝකෝපකාරයෙන් තොරව මුහුදට ගලා යා නොදෙනු” යන මහා පරාක්‍රමබාහු රජතුමාගේ පාඨය ගුරුතැන්හිලා, පරිසරයද සුරකිමින්, තිරසාර ආර්ථික හා සමාජ සංවර්ධනය සහතික කරනු සඳහා සෑම වැසි ජල බිඳුවක්ම පරිසර හිතකාමී ලෙස තිරසාර අයුරින් මිනිසාගේ යහපත සඳහා යොදා ගැනීමයි.

1.2.2. මෙහෙවර

කෘෂිකර්මයට සෘජුවමත්, පාරසරික, ගෘහස්ත, කාර්මික හා විදුලිජනක අවශ්‍යතා සඳහා වක්‍රවත් අවශ්‍ය ජලය සැපයීම සඳහා සමාන්තර ආයතන සමඟ සහයෝගයෙන් රටේ සම්පත් භාවිතයට ගැනීම, සංවර්ධනය, සංරක්ෂණය, පාලනය, බෙදාහැරීම හා කළමනාකරණය මඟින් එම සම්පත් වලින් රටට උපරිම ප්‍රතිලාභයක් ලබාදීම.

1.2.3. බලතල පැවරී ඇති ප්‍රධාන නෛතික විධිවිධාන

- ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව - ප්‍රතිශෝධිත මුද්‍රණය - 2021 පෙබරවාරි, 9 වන උපලේඛණය - III වන ලැයිස්තුව (සමගාමී ලැයිස්තුව) අර්ථ දැක්වීමට අනුව
- මුදල් රෙගුලාසි 788 අනුව
- 1994 අංක 13 දරන වාරිමාර්ග (සංශෝධන) පනතේ 5 වන වගන්තිය අනුව
- 1946 අංක 32 දරන වාරිමාර්ග ආඥා පනතේ V වන කොටසේ අංක 33 හා 34 වගන්ති අනුව
- 1955 අංක 22 දරන ගංවතුර ආරක්ෂණ ආඥා පනතේ 3 (I), 5(I) හා 6 වගන්ති අනුව
- ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43(1) සහ 46(10(අ) ප්‍රකාරව කැබිනට් අමාත්‍යවරුන් පත් කිරීම සහ විෂය සහ කාර්යයන් වෙන් කිරීම සඳහා ජනාධිපතිවරයා විසින් නිකුත් කරන ලද ගැසට් නිවේදනය

1.2.4. අරමුණු

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණු පහත පරිදි වේ;

i. වාරි කෘෂිකර්මය, ජල විදුලි නිෂ්පාදනය, ගංවතුර ආරක්ෂණය, ගෘහස්ත ප්‍රයෝජනය, කාර්මික ප්‍රයෝජනය, ජල ජීවී වගාව ආදිය සඳහා පරිසරයට හිතකාමී ලෙස ජල සම්පත් සහ ඉඩම් සංවර්ධනය.

ii. වාරි හා ජල අපවහන ව්‍යාපෘතිවල ඇති වගා කළ හැකි ඉඩම් සඳහා උස්සාන වාරිමාර්ග පහසුකම් සැපයීම, ජල අපවහන පද්ධතීන් සැපයීම හා මුහුදු ජලය ගලා ඒම වැලැක්වීම.

iii. පානීය ජලය සැපයීම, ගංවතුර අවදානම ඇති ඉඩම්වලට ගංවතුර ආරක්ෂණ හා ජල අපවහන පද්ධතීන් සැපයීම.

iv. ග්‍රාමීය ජනයාගේ ගොවි ආදායම් වැඩි කිරීම තුළින් ඔවුන්ගේ ජීවන තත්ත්වය නගා සිටුවීම සහ ග්‍රාමීය ප්‍රදේශවල දිළිඳුකම තුරන් කිරීම.

v. තිරසාර කෘෂිකර්මාන්තය සහ වෙනත් භාවිතයන් සඳහා ජලය ආර්ථික වශයෙන් කළමනාකරණය කිරීම.

vi. විශාල සහ මධ්‍යම ප්‍රමාණයේ වාරිමාර්ග ව්‍යාපෘතීන් සඳහා ජලය සහ ඉඩම් සඳහා වූ ඵලදායීතා වර්ධනය.

vii. විශාල සහ මධ්‍යම ප්‍රමාණයේ වාරිමාර්ග පද්ධති සඳහා ඒකාබද්ධ ජලසම්පත් කළමනාකරණය සහ සහභාගීත්ව කළමනාකරණය.

viii. වාරිමාර්ග දෙපාර්තමේන්තුවට පවරා ඇති ගංගා ද්‍රෝණිවල ඒකාබද්ධ ජලසම්පත් කළමනාකරණය සහ සහභාගීත්ව කළමනාකරණය.

1.3. ප්‍රධාන කාර්යයන්

i. පාරිසරික සාධක වලට ප්‍රමුඛතාවය දී ඉඩම් හා ජල සම්පත් ප්‍රශස්ත ලෙස භාවිතා කිරීම සඳහා ගංගා ද්‍රෝණි සංවර්ධනය සම්බන්ධයෙන් ප්‍රධාන සැලසුම් සකස් කිරීම.

ii. වාරිමාර්ග, ජල විදුලිය සහ ගංවතුර පාලනය සඳහා වන නව ව්‍යාපෘති සඳහා සවිස්තර සැලසුම් සකස් කිරීම.

iii. නව හා පවතින ගොවිතැන් කළ හැකි ඉඩම් වල අස්වැන්න වැඩි කිරීම සඳහා ගුරුත්ව හා උස්සාන වාරිමාර්ග ක්‍රම යටතේ ජල සංරක්ෂණය, හැරවීම හා බෙදා හැරීම සිදු කිරීම සඳහා නව ව්‍යාපෘති ඉදිකිරීම සහ ගොවීන් පදිංචි කිරීමේ ව්‍යාපෘති සැකසීම

iv. ජලාපවහන, ගංවතුර පාලන සහ ලවණ දිය බැහැර කිරීමේ ව්‍යාපෘති ඉදි කිරීම මගින් එම බලපෑම් ඇති ඉඩම් වල ගොවිතැන් කිරීමේ කටයුතු අනතුරකින් තොරව කරගෙන යාමට ඉඩ සැලසීම.

v. ගංවතුරෙන් සිදුවන හානිය අවම කිරීම හෝ අවම කිරීම සඳහා ජලාපවහන හා ගංවතුර ආරක්ෂණ පහසුකම් සැපයීම.

vi. මධ්‍යම හා ප්‍රධාන වාරිමාර්ග යෝජනා ක්‍රම, ජලාපවහන හා ගංවතුර ආරක්ෂණ යෝජනා ක්‍රම, ලවණ ජලය බැහැර කිරීමේ යෝජනා ක්‍රම, මෙහෙයුම්, නඩත්තු, වැඩිදියුණු කිරීම්, පුනරුත්ථාපන හා ජල කළමනාකරණය, සහ ප්‍රතිලාභීන්ගේ සහභාගීත්වය ලබා ගනිමින් ප්‍රශස්ත ඵලදායීතාව සඳහා අන්තර් අංශ භාවිතය, ගෘහස්ථ, කාර්මික භාවිතය සහ පාරිසරික අවශ්‍යතා සඳහා ජලය සැපයීම.

vii. කෘෂිකාර්මික හා ගෘහස්ත පරිභෝජනයේ තිරසාර ජල සැපයුම සඳහා වේලි ඇතුළු ජල යටිතල පහසුකම් නඩත්තු කිරීම හා වැඩිදියුණු කිරීම.

viii. ජල සම්පත් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘති සඳහා අවශ්‍ය කරන පර්යේෂණ ජල ශක්ති, ජල විද්‍යා, ඉංජිනේරු ද්‍රව්‍ය, ඉංජිනේරු භූවිද්‍යා, භූවිද්‍යාත්මක තොරතුරු, ඉඩම් පරිහරණ යන අංශ වල සිදු කිරීම.

ix. මානව සම්පත් උපරිම ලෙස භාවිතා කිරීම සඳහා මානව සම්පත් සංවර්ධනය.

x. රජයේ මූල්‍ය රෙගුලාසි වලට අනුකූලව වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ විගණන පද්ධතිය, ගිණුම් වාර්තා කිරීම, මූල්‍ය කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාම.

xi. ජල සම්පත් වැඩි දියුණු කිරීම, ඉංජිනේරුමය මූලික දැනුම, පස් වැඩ සහ කොන්ක්‍රීට් වැඩ වල ගුණාත්මකභාවය පාලනය, ජල ශක්ති ආකෘති පරීක්ෂාවට ලක් කිරීම සහ ඉඩම් පරිහරණ සැලසුම් සැකසීම සම්බන්ධව රාජ්‍ය දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත මණ්ඩල හා සංස්ථා සහ පොදු හා පෞද්ගලික ආයතන සඳහා උපදෙස් ලබා දීම.

1.4. සංවිධාන සටහන



* තනතුරු දෙකම එකම පුද්ගලයා විසින් දරනු ලැබේ.

** තනතුරු දෙකම එකම පුද්ගලයා විසින් දරනු ලැබේ.

වගුව 1: සංචිධාන සටහන සඳහා සංක්ෂිප්තයන්

කෙටි යෙදුම	සටහන	වගකීම් දරන ක්ෂේත්‍රය
වා.අ.ජ.	වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්	සමස්ත කාර්යයන් : ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, සමස්ත අධීක්ෂණය සහ කළමනාකරණය, බාහිර ආයතන සමඟ සම්බන්ධීකරණය, කාර්ය මණ්ඩලය සහ ප්‍රතිපාදන මෙහෙයවීම, පුහුණුව සහ පොදු අවශ්‍යතා වෙනුවෙන් කටයුතු කිරීම තාක්ෂණික කාර්යයන්: විශාල පරිමාණයේ ව්‍යාපෘති සඳහා ක්‍රමසැලසුම් කිරීම, විමර්ශනය, සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම,විශාල හා මධ්‍යම ප්‍රමාණයේ වැඩකටයුතුවල මෙහෙයුම්, වැඩිදියුණු කිරීම් සහ ජල කළමනාකරණය සහ සැලසුම් කිරීම, විමර්ශනය, සැලසුම් කිරීම සහ තත්ත්ව පාලනය සඳහා උපදේශන සේවා ලබා දීම
අති.වා.අ.ජ (වී,සැ.හා නි)	අතිරේක වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් (විමර්ශන, ක්‍රම සැලසුම් හා නිර්මාණ)	වාරිමාර්ග ව්‍යාපෘති සම්බන්ධයෙන් වන විමර්ශන සිදු කිරීම, ක්‍රම සැලසුම් සකස් කිරීම සහ සැලසුම් කිරීම සම්බන්ධයෙන් කටයුතු කරන ශාඛා අධීක්ෂණය, පරිපාලනය සහ සම්බන්ධීකරණය සිදු කිරීම.
අති.වා.අ.ජ (ක්‍රම. කළ.)	අතිරේක වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් (ක්‍රම කළමනාකරණ)	ගුරුත්ව වාරි යෝජනා ක්‍රමවල මෙහෙයුම්,නඩත්තු කිරීම, ජල කළමනාකරණය සහ ඵලදායිතාව වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් කටයුතු කරන ශාඛා අධීක්ෂණය, පරිපාලනය සහ සම්බන්ධීකරණය.
අති.වා.අ.ජ (ඉදි හා සං)	අතිරේක වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් (ඉදිකිරීම් හා සංවර්ධන)	ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ ඉදිකිරීම සම්බන්ධයෙන් කටයුතු කරන ශාඛා අධීක්ෂණය, පරිපාලනය සහ සම්බන්ධීකරණය.
අති.වා.අ.ජ (ගංගා කළ)	අතිරේක වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් (ගංගාධාර කලමනාකරණ)	ජලාපවහනය, ගංවතුර පාලනය සහ ගංගාධාර කළමනාකරණය සම්බන්ධයෙන් කටයුතු කරන ශාඛා අධීක්ෂණය, පරිපාලනය සහ සම්බන්ධීකරණය.
අති. අ.ජ (පාලන)	අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන)	ප්‍රධාන කාර්යාලයට සහ දිවයින පුරා පිහිටා ඇති ප්‍රාදේශීය කාර්යාලවලට අනුයුක්ත කාර්ය මණ්ඩලයේ සියලුම පරිපාලන කටයුතු අධීක්ෂණය සහ සම්බන්ධීකරණය.
ප්‍ර.මූ.නි.	ප්‍රධාන මුල්‍ය නිලධාරී	ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහ අනෙකුත් අදාළ නීතිරීති සහ රෙගුලාසි වලින් පැවරී ඇති බල තල අනුව ගණන්දීමේ නිලධාරියා ලෙස රාජකාරි ඉටු කිරීම සඳහා සහය වීම.
වා.අ. (හෞ.ස.ක)	වාරිමාර්ග අධ්‍යක්ෂ (භෞතික සම්පත් කළමනාකරණ)	දෙපාර්තමේන්තු සහ අමාත්‍යාංශයේ අයවැය ප්‍රතිපාදන නිසි පරිදි යොදා ගනිමින් යන්ත්‍රෝපකරණ සහ වාහන හැර අනෙකුත් සියලුම වත්කම් කළමනාකරණය කිරීම සහ සියලුම ගුරුත්ව වාරිමාර්ග ව්‍යාපාර නඩත්තු කිරීම සහ වැඩිදියුණු කිරීම.
වා.අ. (වා.ඵ.ප්‍ර)	වාරිමාර්ග අධ්‍යක්ෂ (වාරිමාර්ග ඵලදායිතා ප්‍රවර්ධන)	වප් හවුල ක්‍රියාත්මක වාරිමාර්ග ව්‍යාපාර වල සහභාගීත්ව කළමනාකරණ ප්‍රවේශය සමඟින් වාරි කෘෂිකර්මාන්තයේ ඵලදායිතාව ඉහළ නැංවීම සහ වප් හවුල වැඩසටහන කළමනාකරණය කිරීම සහ අධීක්ෂණය කිරීම.
වා.අ. (ප.ස.සහ ක්‍ර.ප්‍ර)	වාරිමාර්ග අධ්‍යක්ෂ (පර්යේෂණ සහාය සහ ක්‍රමවේද ප්‍රවර්ධන)	දෙපාර්තමේන්තුවේ සියලුම සේවාවන් සහ ක්‍රියාවලි වැඩිදියුණු කිරීමට අදාළව සහ අනෙකුත් විශේෂ ක්ෂේත්‍රවල පර්යේෂණ ප්‍රවේශය තුළින් ක්‍රියාවලීන් වැඩිදියුණු කිරීම සඳහා සහාය ලබා දීම.

කෙටි යෙදුම	සටහන	වගකීම් දරන ක්ෂේත්‍රය
වා.අ. (ජල ක)	වාරිමාර්ග අධ්‍යක්ෂ (ජල කළමනාකරණ)	ජල ඒකකයකින් සහ ඉඩම් ඒකකයකින් උපරිම ඵලදායිතාවයක් ලබා ගැනීමට සහ ගොවි ජනතාවගේ ආදායම ඉහළ නැංවීම සඳහා ගොවීන්ගේ සහභාගීත්වයෙන් වාරිමාර්ග පද්ධතිවල කාර්යක්ෂමතාවයට, ඵලදායිතාවයට සහ තිරසාර කළමනාකරණයට අවශ්‍ය පහසුකම් සැලසීම.
වා.අ. (ගං . ක.)	වාරිමාර්ග අධ්‍යක්ෂ (ගංගාධාර කළමනාකරණ)	භෞතික හා පාරිසරික සමතුලිතතාවය පවත්වා ගැනීම සඳහා සියලු පාර්ශ්වයන්ගේ සම්බන්ධීකරණය සහ සහභාගීත්වය ඇතිව ගංගාධාර සංරක්ෂණ කටයුතු සඳහා පහසුකම් සැලසීම.
වා.අ (ජලා. හා ගං. පද්.)	වාරිමාර්ග අධ්‍යක්ෂ (ජලාපවහන හා ගංවතුර පද්ධති)	පහත් බිම්වල ජලාපවහන සහ ලවණ ජලය බැහැර කිරීමේ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම මගින් කුඹුරු වගා කිරීම සඳහා අවශ්‍ය පරිසරය සකස් කිරීම, ගංවතුර ආරක්ෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මගින් මිනිස් ජීවිත, පොදු සහ පෞද්ගලික දේපළ සහ පරිසරය ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට උපදෙස් ලබා දීම.
වා.අ. (ජල.ස.සැ)	වාරිමාර්ග අධ්‍යක්ෂ (ජල සම්පත් සැලසුම්)	සමාජ, ආර්ථික සහ පාරිසරික සංවර්ධන ඉලක්ක දිගුකාලීනව සපුරා ගැනීම සඳහා අවශ්‍ය වන ජාතික ජල සම්පත් සැලැස්ම සකස් කිරීම, වැඩිදියුණු කිරීම සහ යාවත්කාලීන කිරීම.
වා.අ.(ව්‍යා.සැ හා නි)	වාරිමාර්ග අධ්‍යක්ෂ (ව්‍යාපෘති සැලසුම් සහ නිර්මාණ)	නව ජල සම්පත් සංවර්ධන යෝජනා හඳුනා ගැනීම, බහු විධ භාවිතයේ ශක්‍යතා පරීක්ෂා කිරීම, සැලසුම් කිරීම, විස්තරාත්මක සැලසුම් සකස් කිරීම සහ ඉදිකිරීම් සඳහා අවශ්‍ය සැලසුම් සැපයීම.
වා.අ. (ඉං.වී.තා)	වාරිමාර්ග අධ්‍යක්ෂ (ඉංජිනේරු විද්‍යා සහ තාක්ෂණික සේවා)	ඉංජිනේරු, විද්‍යාත්මක, ගණකාධිකාරී, පරිපාලන සහ ඉංජිනේරු සහකාර සේවයේ පරිපාලන කටයුතු සිදු කිරීම සහ අධීක්ෂණය.
වා.අ. (ඉං.භූ.වී)	වාරිමාර්ග අධ්‍යක්ෂ (ඉංජිනේරු භූ විද්‍යා)	ප්‍රධාන හා මධ්‍යම වාරිමාර්ග ව්‍යාපෘති සැලසුම් කරණය සඳහා අවශ්‍ය භූගත පරීක්ෂණ සහ අත්තිවාරම් වැඩිදියුණු කිරීම සඳහා තාක්ෂණික උපක්‍රම යෙදීම. ගොඩබිම සහ වෙරළ ආශ්‍රිතව විමර්ශන සඳහා උපදේශන සේවා සැපයීම., දැනට භාවිතයේ පවතින නිර්මිත වල කාන්දුවීම් සහ ස්ථායීතාවය ආශ්‍රිත ගැටළු සඳහා විසඳුම් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
වා.අ (ඉං.ද්‍රව්‍ය)	වාරිමාර්ග අධ්‍යක්ෂ (ඉංජිනේරු ද්‍රව්‍ය)	ප්‍රධාන හා මධ්‍යම වාරිමාර්ග ව්‍යාපෘති සඳහා ඉදිකිරීම් ද්‍රව්‍ය පරීක්ෂණ කිරීම, පස් වලින් ඉදි කරන වේලි සැලසුම් කිරීම සහ ඉදිකිරීම් ස්ථානවල තත්ත්ව විමර්ශනය සහතික කිරීම. විමර්ශනය කිරීම, සිවිල් ඉංජිනේරු ඉදිකිරීම් කටයුතුවල ගුණාත්මකභාවය සහතික කිරීම සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවට මෙන්ම අනෙකුත් අවශ්‍ය ආයතනවලට සේවා සැපයීම.
වාඅ (තො.ස./භූ. තො.තා)	වාරිමාර්ග අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන / භූගෝලීය තොරතුරු තාක්ෂණ)	වාරිමාර්ග දෙපාර්තමේන්තුව සියලුම අංශ , ශාඛා, කලාප සහ කොට්ඨාශ සඳහා පරිගණක සහ තොරතුරු තාක්ෂණය සම්බන්ධ සේවාවන් සැපයීම සහ අවශ්‍ය අංශ සහ ප්‍රාදේශීය කාර්යාල සඳහා භූගෝලීය තොරතුරු තාක්ෂණික සේවා,සහාය සහ පුහුණුව ලබා දීම.
වා. අ (ජල වි සහ අපදා . කළ.)	වාරිමාර්ග අධ්‍යක්ෂ (ජල විද්‍යා සහ අපදා කළමනාකරන)	ජල සම්පත් සංවර්ධනය සහ ගංවතුර පුරෝකථනය සඳහා ජල විද්‍යාත්මක සහ කාලගුණික දත්ත රැස් කිරීම, සැකසීම සහ බෙදා හැරීම, ප්‍රධාන ගංගා සඳහා පූර්ව අනතුරු ඇඟවීම් නිකුත් කිරීම සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සමඟ සම්බන්ධීකරණය කිරීම.

කෙටි යෙදුම	සටහන	වගකීම් දරන ක්ෂේත්‍රය
වා.අ. (ජල ශක්ති)	වාරිමාර්ග අධ්‍යක්ෂ (ජල ශක්ති)	වාරිමාර්ග ව්‍යාපෘතිවල ආදර්ශ අධ්‍යයනයන් සිදු කිරීම, විෂයය පිළිබඳ ගැටළු සම්බන්ධයෙන් අවශ්‍ය ආයතනවලට උපදේශන සේවා සැපයීම සහ උපකරණ ඒකකය පවත්වාගෙන යාම.
වා.අ (වී.ඉදි)	වාරිමාර්ග අධ්‍යක්ෂ (විශාල ඉදි කිරීම්)	මහා පරිමාණ වාරිමාර්ග හා ජනාවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය කිරීම.
වා. අ (ප්‍රා.සං)	වාරිමාර්ග අධ්‍යක්ෂ (ප්‍රාදේශීය සංවර්ධන)	මධ්‍යම පරිමාණ වාරිමාර්ග ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය කිරීම.
වා. අ (වැ.කළ.)	වාරිමාර්ග අධ්‍යක්ෂ (වැඩසටහන් කළමනාකරණ)	ප්‍රාග්ධන අයවැය සැලසුම් කිරීම, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙළ කිරීම, වැඩසටහන සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා සහාය වීම, ප්‍රගතිය වාර්තා කිරීම සහ අනෙකුත් වාර්ෂික හා කාර්තුමය වාර්තා ඉදිරිපත් කිරීම
වා.අ (කො.හා ප්‍ර)	වාරිමාර්ග අධ්‍යක්ෂ (කොන්ත්‍රාත් හා ප්‍රසම්පාදන)	වැඩ, භාණ්ඩ හා සේවා සඳහා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීම, ප්‍රසම්පාදන ක්‍රියාවලිය දෙපාර්තමේන්තුව තුල නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම සහ ප්‍රමිතීන් පවත්වා ගෙන යාම සඳහා ක්‍රියා පටිපාටි යාවත්කාලීන කිරීම.
වා.අ (පුහුණු)	වාරිමාර්ග අධ්‍යක්ෂ (පුහුණු)	දෙපාර්තමේන්තුවේ සියලුම කාර්ය මණ්ඩල වල කුසලතා වර්ධනය කිරීම සඳහා අවශ්‍ය පුහුණුව සැලසීම සහ සම්බන්ධීකරණය කිරීම, ප්‍රධාන කාර්යාලය, කලාප සහ ගල්ගමුව වාරිමාර්ග පුහුණු ආයතනයේ පුහුණු කටයුතු සම්බන්ධීකරණය, සියලුම කාණ්ඩවල සේවකයින් බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටියට අනුව බඳවා ගැනීමේ විභාග සහ කාර්යක්ෂමතා කඩයිම් විභාග පැවැත්වීමට අවශ්‍ය කටයුතු සම්පාදනය සහ පැවැත්වීම.
වා.අ. (වැ.පො.හා ගොඩ)	වාරිමාර්ග අධ්‍යක්ෂ (වැඩ පොදු හා ගොඩනැගිලි සේවා)	පාර්ලිමේන්තු උපදේශන කමිටු කටයුතු, මහජන පෙත්සම් යනාදී විවිධ කාරණා සම්බන්ධයෙන් කටයුතු කිරීම, රත්මලානේ පිහිටි නිල නිවාස,ප්‍රධාන කාර්යාලය, අංක 34 පරිශ්‍රය පරිපාලනය, නඩත්තු කිරීම, ඉදිකිරීම්, වැඩිදියුණු කිරීම් සහ සම්පත් වෙන් කිරීමේ කටයුතු සිදු කිරීම.
වා.අ. (වා.අ.ආ)	වාරිමාර්ග අධ්‍යක්ෂ (වාරිමාර්ග අභ්‍යාස ආයතනය)	ඉංජිනේරු සහකාරවරුන් සඳහා වාරි ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව පැවැත්වීම, පුහුණු අංශයේ ඉල්ලීම මත සියලුම සේවා කාණ්ඩ සඳහා බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටියට අනුව සේවා පුහුණු වැඩසටහන් පැවැත්වීම, කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම සහ දෙපාර්තමේන්තුවේ සියලුම කාර්ය මණ්ඩල වල කුසලතා වර්ධනය කිරීම සඳහා අවශ්‍ය පුහුණුව සැලසීම.
වා.අ (ක්‍ර. සැ. සහ සැ.මධ්‍යම)	වාරිමාර්ග අධ්‍යක්ෂ- (ක්‍රම සැලසුම් සහ සැලසුම් -මධ්‍යම)	මහනුවර, කුරුණෑගල, පුත්තලම සහ අම්පාර යන කලාප වල මධ්‍යම හා කුඩා වාරිමාර්ග ව්‍යාපෘතිවල ශක්‍යතා අධ්‍යයනය, ක්‍රම සැලසුම් සහ සැලසුම් කටයුතු සිදු කිරීම.
වා.අ. (ක්‍ර. සැ. සහ සැ - ඌව)	වාරිමාර්ග අධ්‍යක්ෂ (ක්‍රම සැලසුම් සහ සැලසුම් - ඌව කලාපය)	බදුල්ල, මොණරාගල, මඩකලපුව සහ හම්බන්තොට කලාප වල මධ්‍යම හා කුඩා වාරිමාර්ග ව්‍යාපෘතිවල ශක්‍යතා අධ්‍යයනය, සැලසුම් සහ සැලසුම් කටයුතු.
වා. අ (ක්‍ර. සැ. සහ සැ -උ.හා උ.මැද)	වාරිමාර්ග අධ්‍යක්ෂ (ක්‍රම සැලසුම් සහ සැලසුම් - උතුරු හා උතුරු මැද කලාපය)	අනුරාධපුර, මන්නාරම, පොළොන්නරුව සහ ත්‍රිකුණාමලය යන කලාප වල මධ්‍යම හා කුඩා වාරිමාර්ග ව්‍යාපෘතිවල ශක්‍යතා අධ්‍යයනය, සැලසුම් සහ සැලසුම් කටයුතු.

කෙටි යෙදුම	සටහන	වගකීම් දරන ක්ෂේත්‍රය
ක.වා.අධ්‍ය	කලාප වාරිමාර්ග අධ්‍යක්ෂ	වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් වෙනුවෙන් කලාපය තුල දෙපාර්තමේන්තුව නියෝජනය කිරීම, සැලසුම් ප්‍රමිතීන් සහ ඉදිකිරීම් වැඩ වල ගුණාත්මකභාවය සහතික කරමින් කලාපයේ පරිපාලනය කිරීම, නිසි ජල කළමනාකරණය සහතික කරමින් කලාපයේ වාරිමාර්ග කටයුතු මෙහෙයවීම සහ නඩත්තු කිරීම, වත්කම් නඩත්තු කිරීම සහ ආරක්ෂා කිරීම, අතිරේක වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්වරුන්ගේ මහපෙන්වීම යටතේ සහ දිස්ත්‍රික් මට්ටමේ අවශ්‍යතා සමඟ සාකච්ඡා කර කලාපයේ වාරිමාර්ග කටයුතු සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සහ අයවැය සකස් කිරීම, තාක්ෂණික පාලනය සඳහා ප්‍රධාන හෝ ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු සහ ඔහු යටතේ සිටින කාර්ය මණ්ඩලයේ සහාය ඇතිව ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම, මූල්‍ය පාලනය සඳහා ගණකාධිකාරී සහ කාර්ය මණ්ඩලය මෙහෙයවීම. කාර්ය මණ්ඩල පාලනය සඳහා පරිපාලන නිලධාරී සහ කාර්ය මණ්ඩලය මෙහෙයවීම, ස්ථාවරයන් සහ මාර්ගෝපදේශ අනුව සුළු හා මධ්‍යම පරිමාණ වාරිමාර්ග වැඩ කටයුතු විමර්ශනය කිරීම, ක්‍රම සැලසුම් හා සැලසුම් කිරීම සහ ඇස්තමේන්තු පිළියෙළ කිරීම. නිවැරදි ක්‍රියා පටිපාටිය අනුගමනය කරමින් ඒකක ගාස්තු ගණනය කිරීම, ප්‍රධාන කාර්යාලයට අවශ්‍ය විමර්ශන, ක්‍රම සැලසුම් සහ සැලසුම් කාර්යයන් ක්‍රියාත්මක කිරීම. භෞතික හා මූල්‍ය ප්‍රගතිය වාර්තා කිරීම, වා.අ (වී.ඉදි) වෙනුවෙන් විශාල ඉදිකිරීම් අංශය මගින් ක්‍රියාත්මක ප්‍රධාන වාරිමාර්ග ව්‍යාපෘති (ය) ක්‍රියාත්මක කිරීමේ සමස්ත අධීක්ෂණය, ක්‍රියාත්මක ප්‍රධාන වාරිමාර්ග ව්‍යාපෘති සම්බන්ධව දිස්ත්‍රික්කයේ අනිකුත් ආයතන වෙත තොරතුරු සැපයීම, කලාපය තුළ පිහිටා ඇති ක්ෂේත්‍ර යාන්ත්‍රික වැඩපළවල් කළමනාකරණය කිරීම.
අධ්‍ය (ඉ. පරි)	අධ්‍යක්ෂ (ඉඩම් පරිහරණ)	වාරිමාර්ග සහ අනෙකුත් සංවර්ධන ව්‍යාපෘති වල ඉඩම් පරිහරණය තීරණය කිරීම සඳහා ගුණාත්මක හා ප්‍රමාණාත්මක විද්‍යාත්මක තොරතුරු සැපයීම.
අධ්‍යක්ෂ (පරිපාලන)	අධ්‍යක්ෂ (පරිපාලන)	පරිපාලන කටයුතු සඳහා අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පරිපාලන) ට සහාය වීම.
යා. අධ්‍ය. (ප්‍ර.කා. සහ ද.)	අධ්‍යක්ෂ යාන්ත්‍රික (ප්‍රධාන කාර්යාලය සහ දකුණ)	ප්‍රධාන කාර්යාලය, කොළඹ, ගාල්ල, හම්බන්තොට සහ මොණරාගල යන කලාපවලට අයත් සියලුම වාහන, යන්ත්‍රෝපකරණ සහ වාරි නිර්මිත හා සම්බන්ද යාන්ත්‍රික ව්‍යුහයන් නඩත්තු කිරීම සහ අලුත්වැඩියා කිරීම.
යා. අධ්‍ය. (මධ්‍යම)	අධ්‍යක්ෂ යාන්ත්‍රික (මධ්‍යම)	මහනුවර, කුරුණෑගල, පුත්තලම, බදුල්ල, අම්පාර සහ මඩකලපුව යන කලාපවලට අයත් සියලුම වාහන, යන්ත්‍රෝපකරණ සහ වාරි නිර්මිත හා සම්බන්ධ යාන්ත්‍රික ව්‍යුහයන් නඩත්තු කිරීම සහ අලුත්වැඩියා කිරීම.
යා. අධ්‍ය. (උතුරු මැද)	අධ්‍යක්ෂ යාන්ත්‍රික (උතුරු මැද)	අනුරාධපුර, පොළොන්නරුව, මන්නාරම සහ ත්‍රිකුණාමලය යන කලාපවලට අයත් සියලුම වාහන, යන්ත්‍රෝපකරණ සහ වාරි නිර්මිත හා සම්බන්ධ යාන්ත්‍රික ව්‍යුහයන් නඩත්තු කිරීම සහ අලුත්වැඩියා කිරීම.
ප්‍ර.ග. (මූල්‍ය)	ප්‍රධාන ගණකාධිකාරී (මූල්‍ය)	ප්‍රධාන කාර්යාලයේ සහ ප්‍රාදේශීය කාර්යාලයේ මූල්‍ය කටයුතු අධීක්ෂණය සඳහා ප්‍රධාන මූල්‍ය නිලධාරීට සහාය වීම.
ප්‍ර.ග. (ගිණුම් හා ඇස්.)	ප්‍රධාන ගණකාධිකාරී (ගිණුම් හා ඇස්තමේන්තු)	වාර්ෂික ඇස්තමේන්තු, ගිණුම්, වියදම් වාර්තා සහ අනෙකුත් වාර්තා සකස් කිරීම, දෙපාර්තමේන්තු සහ අනෙකුත් දෙපාර්තමේන්තු සහ අමාත්‍යාංශ යටතේ ලැබෙන ප්‍රතිපාදන පාලනය සහ අධීක්ෂණය, මාසික වියදම් වාර්තා සහ අනෙකුත් වාර්තා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම.

කෙටි යෙදුම	සටහන	වගකීම් දරන ක්ෂේත්‍රය
ප්‍රා.වා.ඉංජි	ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු	ප්‍රාදේශීය මට්ටමේ අවශ්‍යතා සමඟ සම්බන්ධීකරණයෙන් ප්‍රාදේශීයව වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරකම්වල සමස්ත අධීක්ෂණය සහ කළමනාකරණය සිදු කිරීම, වාරිමාර්ග කටයුතු ක්‍රියාත්මක කිරීමේදී ප්‍රාදේශීයව තාක්ෂණික, මූල්‍ය සහ පරිපාලන කටයුතු පාලනය කිරීම, නිසි ජල කළමනාකරණයක් සහතික කරමින් කොට්ඨාශයේ වාරිමාර්ග කටයුතු මෙහෙයවීම සහ නඩත්තු කිරීම සඳහා කලාප වාරිමාර්ග අධ්‍යක්ෂකට සහාය වීම; සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් වත්කම් නඩත්තු කිරීම සහ ආරක්ෂාව, කලාප වාරිමාර්ග අධ්‍යක්ෂකගේ මහපෙන්වීම යටතේ සහ ප්‍රාදේශීය අවශ්‍යතා සැලකිල්ලට ගෙන වාරිමාර්ග කටයුතු සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සහ අයවැය සැකසීමේදී කලාප වාරිමාර්ග අධ්‍යක්ෂකට සහාය වීම, අනුමත භෞතික හා මූල්‍ය වැඩසටහන්, සැලසුම් සහ ඉදිකිරීම් සැලසුම් අනුව කොට්ඨාශයේ වාරිමාර්ග වැඩ ඉදිකිරීමේ කටයුතු ගුණාත්මක බව සහතික කරමින් ක්‍රියාත්මක කිරීම, ස්ථාවරයන් සහ මාර්ගෝපදේශ අනුව සුළු හා මධ්‍යම පරිමාණ වාරිමාර්ග වැඩ කටයුතු විමර්ශනය කිරීම, ක්‍රම සැලසුම් හා සැලසුම් කිරීම සහ ඇස්තමේන්තු පිළියෙළ කිරීම, අනුමත ක්‍රියා පටිපාටිය අනුගමනය කරමින් අවශ්‍ය අවස්ථාවල ඒකක ගාස්තු සකස් කිරීම, කලාප වාරිමාර්ග අධ්‍යක්ෂක ගේ මහපෙන්වීම යටතේ සහ දෙපාර්තමේන්තු ක්‍රියා පටිපාටි සහ ප්‍රමිතීන්ට අනුව බාහිර ආයතනවල ව්‍යාපෘතිවල වාරිමාර්ග සංරචක ක්‍රියාත්මක කිරීම.

1.5. දෙපාර්තමේන්තුව යටතේ ඇති ප්‍රධාන අංශ

1. විමර්ශන, සැලසුම් සහ නිර්මාණ අංශය
2. ඉදිකිරීම් සහ සංවර්ධන අංශය
3. ක්‍රම සැලසුම් අංශය
4. ගංගාධාර කළමනාකරණ අංශය
5. පාලන අංශය
6. මූල්‍ය අංශය

මීට අමතරව පහත සඳහන් අංශයන් වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්ගේ සෘජු අධීක්ෂණය යටතේ පවතී.

1. වැඩසටහන් කළමනාකරණ අංශය
2. කොන්ත්‍රාත් සහ ප්‍රසම්පාදන අංශය
3. අභ්‍යන්තර විගණන අංශය
4. පුහුණු හා හැකියා ප්‍රවර්ධන අංශය
5. වැඩ පොදු හා ගොඩනැගිලි අංශය
6. යන්ත්‍ර සහ යාන්ත්‍රික වැඩපල අංශය
7. වාරිමාර්ග අභ්‍යාස ආයතනය - ගල්ගමුව

වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සහයට කුඩා කාර්ය මණ්ඩලයක් සිටින අතර, ඔවුන් වැඩකටයුතු කළමනාකරණය සහ සම්බන්ධීකරණය කරනු ලබයි. මෙයට අමතරව අධ්‍යක්ෂවරුන්ගේ රැස්වීම් සහ වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස නිල බලයෙන් සහභාගි විය යුතු රැස්වීම් වලට අදාළ ලියකියවිලි පවත්වාගෙන යාම සිදු කරනු ලබයි.

පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1. විශේෂ ජයග්‍රහණ සහ ප්‍රගතිය

- 2021 යල කන්නය අවසානයේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් ජලාශවල ජල ධාරිතාවය 42%ක් විය. 2021/22 මහ කන්නය සඳහා වගා කිරීම ආරම්භ කළ අතර මුළු බිම් ප්‍රමාණයෙන් 92%ක් සාර්ථකව වගා කරන ලදී. 2022 යල කන්නය ආරම්භයේදී ජලාශවල ධාරිතාවය 66%ක් වූ අතර නිසි ජල කළමනාකරණය හේතුවෙන් 82%ක භූමි ප්‍රමාණයක් සාර්ථකව වගා කිරීමට හැකි විය.

- 2022 යල කන්නයේ වගාවෙන් පසු ජලාශවල ඉතිරිව තිබූ ජලය භාවිතා කරමින් 3 වන කන්නය සඳහා අතිරේක භෝග අක්කර 17,000ක් වගා කිරීමට හැකි විය. 2021/22 වසර සඳහා වගා තීව්‍රතාවය 179% ලෙස වැඩි කිරීමට හැකි විය.

- මඩකලපුව දිස්ත්‍රික්කයේ රූගම් ජලාශය යටතේ අඛණ්ඩව දෙවන වසරටත් මාස දෙකේ වී වර්ගයක් හෙක්ටයාර 642 කට අධික ප්‍රමාණයක වගා කරන ලදී.

- ඉන්ධන හිඟය සහ කාර්තුමය අයවැය ප්‍රතිපාදන යටතේ වුවද වාරිමාර්ග දෙපාර්තමේන්තුව සඳහා වෙන් කරන ලද අයවැය ශීර්ෂය යටතේ 95% ක මූල්‍ය ප්‍රගතියක් අත්කර ගැනීමට හැකි විය.

- ගමන් වියදම් අවම කිරීම සඳහා ප්‍රධාන කාර්යාලය, කලාප කාර්යාල සහ ප්‍රාදේශීය කාර්යාල අතර සන්නිවේදනය සඳහා Zoom, WhatsApp, Viber, සහ Google කණ්ඩායම් වැනි සන්නිවේදන මෙවලම් ඵලදායී ලෙස භාවිත කිරීමට හැකි විය.

- වාරිමාර්ග දෙපාර්තුමේන්තුව විසින් පහත සඳහන් නව ජලාශවල ඉදිකිරීම් කටයුතු දැඩි දුෂ්කරතාවයන් මැද සිදු කර ඇත.

    - අනුරාධපුර දිස්ත්‍රික්කයේ පහළ මල්වතු ඔය ජලාශය
    - මාතලේ දිස්ත්‍රික්කයේ වත්තේගෙදර ජලාශය
    - රත්නපුර දිස්ත්‍රික්කයේ ඇල්ලේ වැව
    - අනුරාධපුර දිස්ත්‍රික්කයේ කුඩාවිලච්චිය ජලාශය
    - මොණරාගල දිස්ත්‍රික්කයේ උහරඵල ජලාශය

- නව ජල විද්‍යාත්මක මිනුම් මධ්‍යස්ථානය කලාඔය ද්‍රෝණියේ තඹුත්තේගම ප්‍රදේශයේ ස්ථාපිත කර ඇල්ල මිනුම් මධ්‍යස්ථානය දැදුරුඔය ද්‍රෝණියේ මොරගස්වැව වෙත ගෙන යන ලදී. නිල්වලා ගඟේ තල්ගහගොඩ සහ මහවැලි ගඟේ මනම්පිටිය ප්‍රදේශයේ මිණුම් ස්ථාන වැඩිදියුණු කිරීම සඳහා එය ආරම්භ කරන ලදී. මල්වතු ඔයේ මන්නාරමේ නව මිණුම් ස්ථානයක් ඉදිකිරීම ආරම්භ කර ඇත.

- සාමාන්‍ය ජනතාව සඳහා ප්‍රධාන ජලාශවල සහ ගංගාවල ජල මට්ටම් බැලීම සඳහා නව GIS ද්වාරයක් සකස් කිරීම.

- ජලශක්ති විද්‍යාගාරයේ පහත ආදර්ශ අධ්‍යයනයන් සිදු කරන ලදී.
    - අමුණ හරහා ජල ප්‍රවාහ ගලා යන තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා මුන්දෙනි ආරු හරහා මාවඩිඔඩෙයි අමුණ නිර්මාණය කරන ලදී. (පරිමාණය 1:20)

    - ඇල්ල වැව වාන් මාර්ගය, නිශ්චල ද්‍රෝණිය සහ පහළ මල්වතුඔය ජලාශයේ රේඩියල් දොරටු වාන් මාර්ගය නිම වෙමින් පවතී

- ජල විද්‍යා හා ආපදා කළමනාකරණ අංශය විසින් එකතු කර සකස් කරන ලද වර්ෂාපතනය, ජලාශ ක්‍රියාකාරිත්වය, කාලගුණ විද්‍යා සහ ජල විද්‍යාත්මක දත්ත සහ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවෙන් මිලදී ගත දත්ත භාවිතා කරමින් දිවයින පුරා ආවරණය වන පරිදි සම වර්ෂාපතන අස්වැන්න වක්‍ර සහ තීව්‍රතාවය, සංඛ්‍යාත වක්‍ර, සම්භාවිතා වර්ෂාපතනය, මුළු දිවයින සඳහාම වශ්පිකරන - උත්ස්වේදන සංගුණක (ET0),Cp, Ct අගයන් යාවත්කාලීන කිරීම වර්ෂ 1988 න් පසු සම්පූර්ණ කරන ලදී.

- නෙළඔය අමුණේ ක්‍රියාකාරිත්වය වැඩිදියුණු කිරීම සහ නෙළඔයේ සිට මොරවැව දක්වා පෝෂක ඇල පුළුල් කිරීම මගින් 2022 යල කන්නයේ ප්‍රථම වරට මොරවැව යෝජනා ක්‍රමය යටතේ අක්කර 4,800 ක සම්පූර්ණ භූමි ප්‍රමාණය අඛණ්ඩව යල කන්නයේ වගා කිරීම.

වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වූ ප්‍රධාන ව්‍යාපෘතීන්හි ප්‍රගතිය පහත පරිදි සාරාංශගතකොට දැක්විය හැකිවේ.

මහා පරිමාණ සහ මධ්‍යම පරිමාණ වාරි ව්‍යාපෘති

1. යාන් ඔය ව්‍යාපෘතිය
2. පහළ උමව ව්‍යාපෘතිය
3. මහගෝන වැව ව්‍යාපෘතිය
4. මොරාණ ජලාශය
5. ඇල්ල වැව ජලාශය
6. කුඹුක්කන්ඔය ජලාශය
7. රුගම් කිතුල් ජලාශය (මුන්දෙනිආරු ගංගා ද්‍රෝණි සංවර්ධන ව්‍යාපෘතිය)
8. පොළොන්නරු දිස්ත්‍රික් වාරි සංවර්ධන ව්‍යාපෘතිය
9. මොනරාගල දිස්ත්‍රික්කයේ කඩිනම් වාරි සංවර්ධන ව්‍යාපෘතිය (වෙල්ලස්ස නවෝදය)
10. කැළණි ගඟ ආරක්ෂණ බැම්ම ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය
11. ගොඩිගමුව වැව සංවර්ධනය හා වැඩිදියුණු කිරීම
12. කැළණි, මුන්දෙනි ආරු, කළුගඟ, නිල්වලා හා ගිං ගංගා ද්‍රෝණි වල ගංවතුර වැලැක්වීමේ ව්‍යාපෘතිය
13. මාඔය, අත්තනගලුඔය හා බෙන්තර ගඟ ගංවතුර ආරක්ෂණ පද්ධති වැඩිදියුණු කිරීම
14. කුඩාවිලච්චිය ජලාශය ප්‍රතිසංස්කරණය කිරීම
15. දෙමටගල්ල වැව ප්‍රතිසංස්කරණය කිරීම
16. උමා ඔය පහළ සංවර්ධන ව්‍යාපෘතිය
17. හිඹිලියාකඩ වත්තේගෙදර වාරිමාර්ග යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.
18. විලකණ්ඩිය ජලාශ ව්‍යාපෘතිය.
19. මහගල්ගමුව වැව වැඩිදියුණු කිරීම.

වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වෙන වෙනත් ව්‍යාපෘති

1. දැදුරු ඔය ජලාශ ව්‍යාපෘතිය
2. පහළ මල්වතු ඔය බහු කාර්යය සංවර්ධන ව්‍යාපෘතිය
3. බස්නාගොඩ ජලාශ ව්‍යාපෘතිය
4. පැලවත්ත උක් වගා පර්යන්ත ප්‍රදේශයේ වාරිමාර්ග පද්ධතිය සංවර්ධනය කිරීම
5. බැරැක් ප්ලේන් සංවර්ධන ව්‍යාපෘතිය
6. ගම සමග පිළිසඳරක් වැඩසටහන
   6.1 පේරමඩුව ජලාශය
   6.2 ගිරිතලේ වැව සිට කිරිමැටිපිටිය වැව දක්වා පෝෂිත ඇල ඉදිකිරීම
   6.3 කුමාර ඇල ඇමුණ ඉදිකිරීම
   6.4 පදවිය හා වාහල්කඩ යෝජනා ක්‍රම ප්‍රතිසංස්කරණය
7. ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය

1. යාන් ඔය ජලාශ ව්‍යාපෘතිය

ඇස්තමේන්තු ගත මුදල	රු.මි. 48,355.3	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	අනුරාධපුර සහ ත්‍රිකුණාමලය
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය**	ඝන මීටර මිලියන 169 නව ප්‍රදේශ හෙක්ටයාර 1515 ඇතුළුව හෙක්ටයාර 8,700
ව්‍යාපෘති කාලය	2012-2023	**ප්‍රතිලාභීන්**	පවුල් 9,000
ප්‍රතිපාදන 2022	රු.මි.800	**2023 වසර සඳහා ප්‍රතිපාදන**	රු.මි.3,500
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 36,891.054	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	85.68
2022 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 616.282		
2022 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	• ඉඩම් අත්පත් කර ගැනීම සහ වන්දි ලබා දීම – 7.1 % • නව වාරිමාර්ග පහසුකම් සංවර්ධනය – 5.2 % • ඉස්සන් වැව මූලස්ථායි වැඩ ඉදි කිරීම – 19 %		
2023 වසර සඳහා යෝජිත වැඩසටහන	• ඉඩම් අත්පත් කර ගැනීමේ සහ නැවත පදිංචි කිරීමේ ඉතිරි වැඩකටයුතු • නව සහ පවතින වාරිමාර්ග යටිතල පහසුකම් සංවර්ධනයේ ඉතිරි වැඩකටයුතු • පාරිසරික හා පුරාවිද්‍යා කළමනාකරණය සහ පසු රැකවරණය		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• නව ඉඩම් හෙක්ටයාර 1515කට වාරි ජල පහසුකම් සපයා දීම. • වගා ඉඩම් හෙක්ටයාර 8,700ක වගා තිව්‍රතාවය වැඩි කිරීම සඳහා වාරි ජල පහසුකම් සැපයීම. • අනුරාධපුර දිස්ත්‍රික්කයේ පවුල් 50,000කට සහ ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ පවුල් 20,000කට පානීය ජලය සැපයීම. • කිලෝමීටර් 8 කාපට් මාර්ගය සහ කිලෝමීටර 40 බොරළු මාර්ග සංවර්ධනය කිරීම. • නගර සංවර්ධනය යටතේ ගම්මාන 4ක් සංවර්ධනය කිරීම. (ප්‍රජා ශාලා, මොන්ටිසෝරි, සේවා පියස ආදී වූ යටිතල පහසුකම් සංවර්ධනය). • කිලෝමීටර 16ක දිගින් යුතු අලි වැට ඉදිකිරීම.		
සමස්ථ ප්‍රතිලාභයෙන් මේ වන විට ලබා ඇති ප්‍රතිලාභ	• යාන්ඔය LB ප්‍රධාන ඇළ සහ පුල්මුඩේ අමුණ මඟින් 2019/2020 මහ කන්නයේ සිට වාරි ජල සැපයුම ආරම්භ විය. • RB ප්‍රධාන ඇළ මඟින් 2022 යල කන්නයේ සිට වාරි ජල සැපයුම ආරම්භ විය. • යාන්ඔය LB සහ RB ප්‍රධාන ඇළ සහ පහළ සොරොව් යටතේ දැනට කෙරෙන සමස්ත කුඹුරු ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 4423 කි. • ඉස්සන්වැව, ඕමාරකඩ, මොරගම, ඉඳුල්හිටිය වැව සහ කොහොඔගස් වැව යටතේ දැනට කෙරෙන සමස්ත කුඹුරු ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 548 කි. • පානීය ජලය සඳහා තවමත් ජලය නිකුත් කර නැත.		



ඉස්සන් වැව **D2** ඇල මාර්ගය



ඉස්සන් වැව ප්‍රධාන ඇල මාර්ගය



ඉස්සන් වැව විභේදන නිර්මිතය ඉදිකිරීම



ඉස්සන් වැව වැව් බැම්ම සහ ප්‍රධාන ඇල මාර්ගය

2. පහළ ඌව මධ්‍ය හා සුළු පරිමාණ සංවර්ධන ව්‍යාපෘතිය

ඇස්තමේන්තු ගත මුදල	රු.මි. 1,250	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	මොණරාගල
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය**	වටගල ආර - 0.2 MCM මල්ලිපොත - 1 MCM දෙබර ආර - 1.25 MCM පවතින ප්‍රදේශ - හෙක්ටයාර 971 නව ප්‍රදේශ - හෙක්ටයාර 728
ව්‍යාපෘති කාලය	2007 – 2023	**ප්‍රතිලාභීන්**	වටගල ආර - පවුල් 32 මල්ලිපොත - පවුල් 250 දෙබර ආර - පවුල් 72
ප්‍රතිපාදන 2022	රු.මි. 60	**2023 වසර සඳහා ප්‍රතිපාදන**	රු.මි. 30
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 746.692	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	86.15
2022 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 60		
2022 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	• දෙබර ආර පෝෂිත ඇළ ඉදිකිරීම.		
2023 වසර සඳහා යෝජිත වැඩසටහන	• දෙබර ආර පෝෂිත ඇළ ඉදි කිරීමේ ඉතිරි වැඩකටයුතු		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• නව ඉඩම් හෙක්ටයාර 728 සහ පවත්නා ඉඩම් හෙක්ටයාර 971ක් සඳහා දෙකන්නය වගා කිරීමට වාරිමාර්ග පහසුකම් සැලසීම.		
සමස්ථ ප්‍රතිලාභයෙන් මේ වන විට ලබා ඇති ප්‍රතිලාභ	• ව්‍යාපෘතියේ අවසන් කරන ලද අයිතමයන් යටතේ ආවරණය වන වගා බිම් ප්‍රමාණය අක්කර 723 කි.		





දෙබර ආර පෝෂිත ඇල මාර්ගය ඉදිකිරීම

3. මහගෝන වැව ව්‍යාපෘතිය

ඇස්තමේන්තු ගත මුදල	රු.මි. 235	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	මාතලේ
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය**	ඝන මීටර මිලියන 0.78 හෙක්ටයාර 265
ව්‍යාපෘති කාලය	2012 – 2022	**ප්‍රතිලාභීන්**	පවුල් 200
ප්‍රතිපාදන 2022	රු.මි. 13	**2023වසර සඳහා ප්‍රතිපාදන**	-
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 234.866	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	100
2022 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 12.999		
2022 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	• දකුණු ඇළෙහි 1+200 සිට 2+000 දක්වා ඉදි කිරීම • FC01,FC02,FC03 කෙත් ඇලවල් ඉදිකිරීම		
2023 වසර සඳහා යෝජිත වැඩසටහන	• 2022 වසරේදී අවසන් කර ඇත		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• පවතින ඉඩම් හෙක්ටයාර 16 සහ නව ඉඩම් හෙක්ටයාර 249ක් සඳහා වාරි ජලය සැපයීම.		
සමස්ථ ප්‍රතිලාභයෙන් මේ වන විට ලබා ඇති ප්‍රතිලාභ	• කුඹුරු හෙක්ටයාර 50කට 2022 මහා කන්නයට ජලය සැපයීම • මහවැලි යෝජනා ක්‍රමය යටතේ හුරුළුවැව ජලාශයට දැනට සපයන ජල ප්‍රමාණය වැඩි කිරීම. • මෙම ව්‍යාපෘතිය ගොවීන්ගේ ජීවන තත්ත්වය ඉහළ නංවන අතර ජාතික නිෂ්පාදනයට දායක වීම. • වගා තීව්‍රතාවය 2 දක්වා වැඩි කිරීම.		



FC 01 ඇලේ ඉදිකිරීම්



දකුණු ඇළෙහි ඉදිකිරීම්

4. මොරාණ ජලාශ ව්‍යාපෘතිය

ඇස්තමේන්තු ගත මුදල	රු.මි. 2,900	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	බදුල්ල
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය**	ඝන මීටර මිලියන 16 හෙක්ටයාර 570
ව්‍යාපෘති කාලය	2012-2023	**ප්‍රතිලාභීන්**	පවුල් 1,300
ප්‍රතිපාදන 2022	රු.මි. 130	**2023 වසර සඳහා ප්‍රතිපාදන**	රු.මි. 180
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 2,655.326	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	98.22
2022 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 82.483		
2022 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	• ඉඩම් අත්පත් කර ගැනීම සහ වන්දි ලබා දීම – 27% • නැවත වන වගා වැඩසටහන		
2023 වසර සඳහා යෝජිත වැඩසටහන	• ඉඩම් අත්පත් කර ගැනීමේ ඉතිරි වැඩකටයුතු		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• ඉඩම් හෙක්ටයාර 570කට සහ පවුල් 1300කට වාරි ජලය සැපයීම. • පවුල් 500කට පානීය ජලය සැපයීම. • කිලෝමීටර් 25ක මාර්ගයක් ඉදිකිරීම. • මීමැසි පාලනය හා මිරිදිය ධීවර කර්මාන්තය සම්බන්ධ වැඩසටහන් පැවැත්වීම. • නිවාස නොමැති ආබාධිත පවුලක් සඳහා ව්‍යාපෘතිය හරහා නිවසක් ඉදිකිරීම. • ග්‍රාමීය ප්‍රදේශවල ප්‍රජා ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීමක් ලෙස ප්‍රජා ශාලා දෙකක් ඉදිකිරීම, තැපැල් කාර්යාල ඉදිකිරීම, යාල්වෙල සහ කුඩාලුණු විද්‍යාල වලට ප්‍රවේශ මාර්ග වැඩිදියුණු කිරීම. • නැවත වන වගා වැඩසටහන.		
සමස්ථ ප්‍රතිලාභයෙන් මේ වන විට ලබා ඇති ප්‍රතිලාභ	• ගොවි පවුල් 80 කට සෙත සලසමින් මොරාන ජලාශය යටතේ කැකිරියාය (හෙක්ටයාර 30) සහ පොරණේ (හෙක්ටයාර 18) ප්‍රදේශවල නව කුඹුරු සඳහා ජලය නිකුත් කිරීම. • නාගදීප යෝජනා ක්‍රමය යටතේ කුඹුරු අක්කර 405ක් සඳහා ජලය නිකුත් කිරීම. • පානීය ජලය සඳහා තවමත් ජලය ලබා දී නොමැත. • මොරාන, මහළුනුක, කුඩාලුණුක, තිස්සපුර, අළුකැටිය සහ යාල්වෙල යන කොට්ඨාශවලට ගෘහස්ථ ජලය සැපයීම.		

5. ඇල්ල වැව ජලාශය

ඇස්තමේන්තු ගත මුදල	රු.මි. 1,532.00	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	රත්නපුර
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය**	ඝන මීටර මිලියන 1.91 පවතින ඉඩම් හෙක්ටයාර 456 ක් සහ නව ඉඩම් හෙක්ටයාර 141.6 ක්
ව්‍යාපෘති කාලය	අවුරුදු 03 (2021-2024)	**ප්‍රතිලාභීන්**	පවුල් 4,000
ප්‍රතිපාදන 2022	රු.මි. 100	**2023 වසර සඳහා ප්‍රතිපාදන**	රු.මි. 100
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 261.851	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	14.65
2022 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 93.199		
2022 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	• ඉදි කිරීම සඳහා, ව්‍යාපෘති භූමිය සැකසීම. – 11% • ප්‍රධාන වේල්ල ඉදි කිරීම – 1.5% • සෑදල වේල්ල ඉදි කිරීම – 3.1% • සොරොව් සහ පහළ පිටවාන ඉදිකිරීම – 34.8% • නැවත පදිංචි කිරීම් සහ වන්දි ගෙවීම – 4%		
2023 වසර සඳහා යෝජිත වැඩසටහන	• පිටවාන , සොරොව්ව සහ වේල්ල ඉදි කිරීමේ ඉතිරි වැඩ කටයුතු		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• කෘෂිකාර්මික හා ගෘහාශ්‍රිත කටයුතු සඳහා ජලය සැපයීමෙන් ප්‍රදේශයේ වෙසෙන ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම. • වියළි කාලවලදී වාරි කෘෂිකර්මාන්තය සඳහා ජල සුරක්ෂිතතාව සහතික කිරීම. • හුලන්දා ඔය සහ පනාමුර ව්‍යාපාර වල වගා තිව්‍රතාවය වැඩි කිරීම සහ නව ඉඩම් අක්කර 350කට වාරි ජල පහසුකම් ලබා දීම. • කොලොන්න ජල සම්පාදන යෝජනා ක්‍රමය සඳහා ජල ඉල්ලුම දිනකට ඝන මීටර 7,000ක් සැපයීම. • මිරිදිය ධීවර කර්මාන්තය ප්‍රවලිත කිරීම.		
සමස්ථ ප්‍රතිලාභයෙන් මේ වන විට ලබා ඇති ප්‍රතිලාභ	මෙතෙක් ප්‍රතිලාභ නැත.		



සොරොව්ව ඉදිකිරීම



සෑදල වේල්ල ඉදි කිරීම

6. කුඹුක්කන්ඔය ජලාශ ව්‍යාපෘතිය

ඇස්තමේන්තු ගත මුදල	රු.මි. 32,397.3	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	මොණරාගල
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය**	ඝන මීටර මිලියන 48 හෙක්ටයාර 5,429
ව්‍යාපෘති කාලය	අවුරුදු 06	**ප්‍රතිලාභීන්**	පවුල් 10,000
ප්‍රතිපාදන 2022	රු.මි. 127	**2023 වසර සඳහා ප්‍රතිපාදන**	රු. මි. 300
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 417.193	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	1.96
2022 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 98.894		
2022 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	• ඉඩම් අත්පත් කර ගැනීම සහ වන්දි ගෙවීම් – 4.1 % • පහත් මට්ටමේ පිවිසුම් මාර්ගයක් ඉදිකිරීම – 39 % • ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලය ඉදිකිරීම – 20%		
2023 වසර සඳහා යෝජිත වැඩසටහන	• ඉඩම් අත්පත් කර ගැනීම සහ වන්දි ගෙවීම් • වම් හා දකුණු ඉවුරු වාරිමාර්ග පද්ධති සංවර්ධනය		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• නව සහ වාරි පහසුකම් නොමැති ඉඩම් හෙක්ටයාර 5,429 සඳහා වාරි ජලය සැපයීම. • වාර්ෂිකව පානීය ජල අවශ්‍යතාවය සඳහා ජලය ඝන මීටර් මිලියන 12ක් ලබා දීම. • විකල්ප මාර්ග කිලෝමීටර් 15ක් පමණ සංවර්ධනය කිරීම. • වාර්ෂිකව ගිගා වොට් පැය 16ක ජල විදුලිය උත්පාදනය. • මිරිදිය ධීවර කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම. • නැවත පදිංචි කරනු ලබන ප්‍රදේශයේ නගර සංවර්ධනය සිදු කිරීම. • අවශ්‍ය පුද්ගලයන් සඳහා ආදායම් උත්පාදන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. • අලි මිනිස් ගැටුම අවම කිරීම සඳහා අලිවැට ඉදිකිරීම.		
සමස්ථ ප්‍රතිලාභයෙන් මේ වන විට ලබා ඇති ප්‍රතිලාභ	මෙතෙක් ප්‍රතිලාභ නැත.		



නුගමන්ඩිය අමුණෙහි භූ විද්‍යා විමර්ශන කටයුතු සිදුකිරීම



ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලය ඉදිකිරීම

7. මුන්දෙනි ආරු ගංඟාද්‍රෝණි සංවර්ධන ව්‍යාපෘතිය (රූගම් කිතුල්)

ඇස්තමේන්තු ගත මුදල	රු.මි. 24,141	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	අම්පාර සහ මඩකලපුව
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය + විදේශීය	**ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය**	රූගම් කිතුල් - ඝන මීටර මිලියන 88 මහ ඔය - ඝන මීටර මිලියන 80 හෙක්ටයාර 6,500
ව්‍යාපෘති කාලය	අවුරුදු 06 2021 – 2027	**ප්‍රතිලාභීන්**	පවුල් 50,000
ප්‍රතිපාදන 2022	GOSL- රු.මි. 53 විදේශීය- රු.මි. 200	**2023 වසර සඳහා ප්‍රතිපාදන**	GOSL- රු.මි. 10 විදේශීය- රු.මි. 150
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 347.234	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	2.29
2022 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 49.780		
2022 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	• මිනුම් කටයුතු – 9 % • ඉඩම් අත්පත් කර ගැනීම සහ නැවත පදිංචි කිරීම – 3 % • PMU සහ PIU සඳහා කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම – 11 %		
2023 වසර සඳහා යෝජිත වැඩසටහන	• මිනුම් කටයුතු • සැලසුම් කටයුතු සඳහා වියදම් පියවීම		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• පවුල් 10,000කට අයත් වගා කළ හැකි සහ වගා කටයුතු සිදු කරන ඉඩම් හෙක්ටයාර 6,500ක් සඳහා වාරි පහසුකම් සපයා දීම. • මඩකලපුව සහ අම්පාර දිස්ත්‍රික්කයේ පවුල් 31,000කට පානීය ජලය සැපයීම. • පහළ නිම්නයේ ගංවතුර පාලනය කිරීම. • ජලාශ දෙකෙහිම මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය වසරකට මෙට්‍රික් ටොන් 800කින් වැඩි කිරීම. • කිලෝමීටර් 85ක මාර්ග ජාලයක් ඉදිකිරීම. • නගර සංවර්ධනය කිරීම. • අලි වැට ඉදිකිරීම. • නැවත වන වගා වැඩසටහන. • බීජ වී නිෂ්පාදනය සඳහා ජලය සැපයීම. • ගොවි සංවිධානය ශක්තිමත් කිරීම. • ආදායම් උත්පාදනය කිරීමේ වැඩසටහන සහ පුහුණුව (කෘෂිකාර්මික හා පශු සම්පත් ව්‍යාප්තිය).		
සමස්ථ ප්‍රතිලාභයෙන් මේ වන විට ලබා ඇති ප්‍රතිලාභ	මෙතෙක් ප්‍රතිලාභ නැත.		



සමාජ සමීක්ෂණ සිදුකිරීම



PMU සහ PIU සඳහා කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම

8. පොළොන්නරු දිස්ත්‍රික් වාරි සංවර්ධන ව්‍යාපෘතිය

ඇස්තමේන්තු ගත මුදල	රු.මි. 7,000	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	පොළොන්නරුව
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය**	අක්කර අඩි 351,700 (ජලාශ 04)
ව්‍යාපෘති කාලය	2016-2023	**ප්‍රතිලාභීන්**	පවුල් 29,790
ප්‍රතිපාදන 2022	රු.මි.50	**2023 වසර සඳහා ප්‍රතිපාදන**	රු.මි. 200
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 1,333.266	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	27.21
2022 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 47.297		
2022 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	• කවුඩුල්ල ,පරාක්‍රම සමුද්‍රය, මින්නේරිය ,ගිරිතලේ සහ G කලාපයේ ඇල මාර්ග වැඩිදියුණු කිරීම.		
2023 වසර සඳහා යෝජිත වැඩසටහන	• කවුඩුල්ල ,පරාක්‍රම සමුද්‍රය, මින්නේරිය ,ගිරිතලේ සහ G කලාපයේ ඇල මාර්ග වැඩිදියුණු කිරීම.		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• පොළොන්නරුව දිස්ත්‍රික්කයේ යල කන්නයේ ජල හිඟය අවම කිරීම සහ ජල සැපයුමේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම. • ඊසානදිග මෝසම් වර්ෂා කාලයේදී ගංවතුර හේතුවෙන් කුඹුරුවලට සිදුවන හානිය අවම කිරීම.		
සමස්ථ ප්‍රතිලාභයෙන් මේ වන විට ලබා ඇති ප්‍රතිලාභ	25% ක ප්‍රතිලාභයක් ලබාගෙන ඇත.		

9. මොණරාගල දිස්ත්‍රික්කයේ කඩිනම් වාරි සංවර්ධන ව්‍යාපෘතිය (වෙල්ලස්ස නවෝදය)

ඇස්තමේන්තු ගත මුදල	රු.මි. 2,500	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	මොණරාගල
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය**	- හෙක්ටයාර 3,179
ව්‍යාපෘති කාලය	2016-2023	**ප්‍රතිලාභීන්**	පවුල් 15,000
ප්‍රතිපාදන 2022	රු.මි. 150	**2023 වසර සඳහා ප්‍රතිපාදන**	රු.මි. 150
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි.1,180.134	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	58.67
2022 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 148.993		
2022 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	• වාරිමාර්ග කටයුතු පුනරුත්ථාපනය කිරීම – 8 % • කුඩා වැව් ප්‍රතිසංස්කරණය යටතේ පයිලේගම, මොරගොල්ල, ඌරඋල සහ දෙටගමුව වැව් සඳහා වේලි ඉදිකිරීමේ කටයුතු සිදුවෙමින් පවතී. • එළුකේ ඇළ සඳහා පස් වැඩ 90% අවසන් කර, පෙට්ටි බෝක්කුව ඉදිකිරීම ආරම්භ කර ඇත.		
2023 වසර සඳහා යෝජිත වැඩසටහන	• මොරගොල්ල වැව, පයිලේගම වැව, ඌර උල වැව, දෙටගමුව වැව, මහපැලැස්ස වැව සහ එළුකේ ඇළ වැව ප්‍රතිසංස්කරණය කිරීම.		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• වගා කළ හැකි ඉඩම් හෙක්ටයාර 3,179කට වාරි ජලය සැපයීම. • නව සහ වැඩිදියුණු කළ තාක්ෂණය ක්‍රම හා ආදර්ශන පිළිබඳ නියමු අධ්‍යනය • පවතින වාරිමාර්ග යටිතල පහසුකම් පුනරුත්ථාපනය කිරීම • යටිතල පහසුකම් සංවර්ධනය (ග්‍රාමීය හා නාගරික) • ජල සම්පත් සංවර්ධන කිරීමේ විභවය හඳුනාගැනීම සඳහා විමර්ශනය, දත්ත රැස් කිරීම සහ අධ්‍යනය කිරීම		
සමස්ථ ප්‍රතිලාභයෙන් මේ වන විට ලබා ඇති ප්‍රතිලාභ	• වාරි ජලය සැපයීම - 40 %		





ඌරඋල වැව ඉදිකිරීම

10. කැළණි ගඟ ආරක්ෂණ බැම්ම ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය

ඇස්තමේන්තු ගත මුදල	රු.මි. 1000	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	කොළඹ, ගම්පහ
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය**	-
ව්‍යාපෘති කාලය	2018-2024	**ප්‍රතිලාභීන්**	පවුල් 15,000ක් පමණ
ප්‍රතිපාදන 2022	රු.මි. 145	**2023 වසර සඳහා ප්‍රතිපාදන**	රු.මි. 400
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 430.526	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	38.59
2022 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 95.782		
2022 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	• ගංවතුර ආරක්ෂණ බැම්ම පිළිසකර කිරීම හා වැඩි දියුණු කිරීම. • කැළණි ගං ඉවුර ආරක්ෂණ බැම්ම සුරක්ෂිත කිරීම සඳහා ගං ඉවුරේ ගේබියන් සහ ෂීට් පයිල් බැම්ම ඉදි කිරීම. • ගංවතුර ආරක්ෂණ නිර්මිත වැඩි දියුණු කිරීම.		
2023 වසර සඳහා යෝජිත වැඩසටහන	• කැලණි උතුරු බැම්ම, ගං ඉවුර ආරක්ෂාව, සුලු ගංවතුර ආරක්ෂණ ව්‍යූහයන් ප්‍රතිසංස්කරණය කිරීම සහ ඉඩම් අත්පත් කර ගැනීම අඛණ්ඩව වැඩිදියුණු කිරීම.		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• කැළණි ගඟ ආශ්‍රිතව පවුල් 15,000කගේ පමණ ජීවිත හා ඔවුන්ගේ දේපළ, කර්මාන්ත, මාර්ග හා යටිතල පහසුකම් ගංවතුරෙන් ආරක්ෂා කිරීම.		
සමස්ථ ප්‍රතිලාභයෙන් මේ වන විට ලබා ඇති ප්‍රතිලාභ	• කැළණි ගඟ ආශ්‍රිතව පවුල් 15000 කගේ පමණ ජීවිත හා ඔවුන්ගේ දේපළ, කර්මාන්ත , මාර්ග හා යටිතල පහසුකම් ගංවතුරෙන් ආරක්ෂා කිරීම. පිණිස ආරම්භ කරනු ලැබූ මෙම ව්‍යාපෘතියේ ගංවතුර ආරක්ෂණ වේලි 30% ක පමණ වැඩ ආරම්භ කර අවසන් කර ඇති අතර සුළු ගංවතුර ආරක්ෂණ නිර්මිත 11 ක වැඩ අවසන් කර එම ප්‍රදේශයේ ජනතාවගේ ජන ජීවිතය සුරක්ෂිත කර ඇත.		



සුලු ගංවතුර ආරක්ෂණ ව්‍යූහය වැඩිදියුණු කිරීම



කැළණි උතුරු බැම්ම වැඩිදියුණු කිරීම

11. ගොඩිගමුව ව්‍යාපෘතිය සංවර්ධනය කිරීම හා වැඩිදියුණු කිරීම

ඇස්තමේන්තු ගත මුදල	රු.මි. 234.63	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	මාතලේ
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය**	ඝන මීටර මිලියන 0.25 හෙක්ටයාර 119
ව්‍යාපෘති කාලය	2018 – 2023	**ප්‍රතිලාභීන්**	පවුල් 265
ප්‍රතිපාදන 2022	රු.මි. 50	**2023 වසර සඳහා ප්‍රතිපාදන**	රු.මි. 35
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 171.469	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	77.13
2022 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 36.829		
2022 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	• වැව් බැම්ම ඉදිකිරීම • පිටවාන ඉදිකිරීම • රළපනාව (Rip rap) හා දියපෙරනය (Toe Filter) ඉදිකිරිම. • වම් ඉවුරු සොරොව්ව සහ දකුණු ඉවුරු සොරොව්ව ඉදිකිරීම • අමුණ (Anicut) ඉදිකිරීම • පෝෂිත ඇළ, ප්‍රධාන ඇළ ඉදිකිරීම සහ වාරිමාර්ග යටිතල පහසුකම්(IFF) ඉහල නැංවීම.		
2023 වසර සඳහා යෝජිත වැඩසටහන	• සියලුම ඉදිකිරීම් කටයුතු අවසන් කිරීම		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• හෙක්. 119 ක් වගා කිරීම සඳහා යල මහ දෙකන්නයට වාරි ජලය සැපයීම.		
සමස්ථ ප්‍රතිලාභයෙන් මේ වන විට ලබා ඇති ප්‍රතිලාභ	මෙතෙක් ලැබී නැත		



අමුණ ඉදිකිරීම



වාන ඉදිකිරීම

12. කැළණි, මුන්දෙනි ආරු, කළු, නිල්වලා හා ගිං ගංගා ද්‍රෝණි වල ගංවතුර වැලැක්වීමේ ව්‍යාපෘතිය

ඇස්තමේන්තු ගත මුදල	රු.මි. 2,100.00	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	ගාල්ල, මාතර, කළුතර, කොළඹ
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය**	
ව්‍යාපෘති කාලය	අවුරුදු 05 (2018 - 2022)	**ප්‍රතිලාභීන්**	පවුල් 37,000
ප්‍රතිපාදන 2022	රු.මි. 100	**2023 වසර සඳහා ප්‍රතිපාදන**	රු.මි 100
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 394.601	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	20.43
2022 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 84.496		
2022 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	• කැළණි ගඟ, කළු ගඟ, ගිං ගඟ හා නිල්වලා ගඟ ද්‍රෝණිවල ගංවතුර ආරක්ෂණ බැම් පුනරුත්ථාපනය කිරීම. • ගංවතුර බස්නා ඇල පද්ධති හා ගංවතුර පාලන නිර්මිත අළුත්වැඩියා කිරීම. • නිල්වලා පොම්පාගාර පුනරුත්ථාපනය කිරීම. • ගංවතුර ආරක්ෂණ අංශයේ පරිපාලන ගොඩනැගිල්ලේ ප්‍රතිසංස්කරණ කටයුතු.		
2023 වසර සඳහා යෝජිත වැඩසටහන	• ගිං ගඟේ ගංවතුර ආරක්ෂණ බැම් ශක්තිමත් කිරීම. • තුඩාව, මාගල්ලගොඩ සහ තල්ගහගොඩ පොම්පාගාර ප්‍රතිසංස්කරණය කිරීම, නිල්වලා ගඟේ ගංවතුර බැම් ප්‍රතිසංස්කරණය කිරීම. • ගංවතුර අවම කිරීම සඳහා නාගරික ප්‍රදේශයේ ජලාපවහන ජාල වැඩිදියුණු කිරීම සහ කැලණි ගඟේ ගංවතුර බැම්වල සුළු පුනරුත්ථාපන කටයුතු.		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• ගිං ගඟ ද්‍රෝණියේ කෘෂිකාර්මික ඉඩම් හෙක්ටයාර 5,000ක් පමණ ගංවතුරෙන් ආරක්ෂාවීම සහ පවුල් 20,000ක් පමණ ගංවතුර ආපදා වලින් මුදවා ගැනීම. • නිල්වලා ද්‍රෝණියේ කෘෂිකාර්මික ඉඩම් හෙක්ටයාර 5,060ක් ගංවතුරෙන් ආරක්ෂාවීම සහ පවුල් 12,000ක් පමණ ගංවතුර ආපදා වලින් ආරක්ෂාවීම. • කළුගඟ ද්‍රෝණියේ කෘෂිකාර්මික ඉඩම් හෙක්ටයාර 200ක් පමණ ආරක්ෂාවීම සහ පවුල් 5,000ක් පමණ ගංවතුර ආපදා වලින් ආරක්ෂාවීම.		
සමස්ථ ප්‍රතිලාභයෙන් මේ වන විට ලබා ඇති ප්‍රතිලාභ	• ගිං ගඟ ද්‍රෝණියේ ඇලවල් ශුද්ධ කිරීම, ගංවතුර වේලි වල දුර්වල ස්ථාන පිළිසකර කිරීම නිසා ඉඩම් හෙක්ටෙයාර් 5000 ක් පමණ ගංවතුරෙන් ආරක්ෂා වීම සහ පවුල් 20,000ක් පමණ ගංවතුර ආපදා වලින් මුදවා ගැනීම. • නිල්වලා ද්‍රෝණියේ කෘෂිකාර්මික ඉඩම් හෙක්ටෙයාර් 5060 ක් ගංවතුරෙන් ආරක්ෂා වීම සහ පවුල් 12 000ක් පමණ ගංවතුර ආපදා වලින් ආරක්ෂා කිරීම පිණිස ක්‍රියාකාරී තත්වයේ නොවූ පොම්ප 12 ක් අළුත්වැඩියා කර අවසන් කර ඇති අතර ඇල වේලි ශුද්ධ කිරීම නිසා ගංවතුරින් පීඩා විඳින කාලය අවම කිරීමට කටයුතු සලසා ඇත. • කළු ගඟ ද්‍රෝණියේ කෘෂිකාර්මික ඉඩම් හෙක්ටෙයාර් 200ක් පමණ ආරක්ෂා වීම සහ පවුල් 5000ක් පමණ ගංවතුර ආපදා වලින් ආරක්ෂා කිරීම පිණිස ඇලවල් ශුද්ධ කිරීම සහ ගංවතුර ආරක්ෂණ වේලි අළුත්වැඩියාවන් සිදුකර ඇත		



මාගල්ලෙගොඩ පොම්පාගාරය වැඩිදියුණුකිරීම



තලගහගොඩ පොම්පාගාරය වැඩිදියුණුකිරීම

13. මාඔය, අත්තනගලුඔය හා බෙන්තර ගඟ ගංවතුර ආරක්ෂණ පද්ධති වැඩිදියුණු කිරීම

ඇස්තමේන්තු ගත මුදල	රු.මි. 500	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	ගම්පහ, කුරුණෑගල, කළුතර, ගාල්ල, පුත්තලම හා කෑගල්ල
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය**	-
ව්‍යාපෘති කාලය	අවුරුදු 01 (2023)	**ප්‍රතිලාභීන්**	-
ප්‍රතිපාදන 2022	-	**2023 වසර සඳහා ප්‍රතිපාදන**	රු.මි. 500
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	-	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	-
2022 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	-		
2022 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	-		
2023 වසර සඳහා යෝජිත වැඩසටහන	• අත්තනගලු ඔයේ ගංවතුර ආරක්ෂණ බැම්ම සහ ගං ඉවුරු ශක්තිමත් කිරීම, අවශ්‍ය ජලාපවහන පද්ධති සකස්කිරීම • ජලාපවහන ඇල මාර්ගවල අවහිරතා ඉවත් කිරීම, ගං ඉවුරු ආරක්ෂාව සහ මා ඔයේ ගංවතුර කළමනාකරණ සැලැස්ම අධ්‍යයනය කිරීම • ජලාපවහන ඇල පිරිසිදු කිරීම, කරදිය වැළක්වීමේ බැම්ම වැඩිදියුණු කිරීම සහ බෙන්තර ගඟේ ව්‍යුහයන් වැඩිදියුණු කිරීම.		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• ද්‍රෝණි තුනේ නාගරික ප්‍රදේශවල ගංවතුර හානි අවම කිරීම. • ගංවතුර හානි සඳහා වාර්ෂිකව ගෙවනු ලබන වන්දි මුදල අඩු කිරීම. • වගා හානි සහ ප්‍රදේශයේ ජන ජීවිතයට වන බාධා අවම කිරීම		
සමස්ථ ප්‍රතිලාභයෙන් මේ වන විට ලබා ඇති ප්‍රතිලාභ	ආරම්භ කර නැත		

14. කුඩාවිලච්චිය ජලාශය ප්‍රතිසංස්කරණය කිරීම

ඇස්තමේන්තු ගත මුදල	රු.මි. 6,000.00	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	අනුරාධපුරය
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය**	ඝන මීටර මිලියන 23 හෙක්ටයාර 1078
ව්‍යාපෘති කාලය	අවුරුදු 03 (2021-2023)	**ප්‍රතිලාභීන්**	පවුල් 25,000
ප්‍රතිපාදන 2022	රු.මි. 86	**2023 වසර සඳහා ප්‍රතිපාදන**	රු.මි. 300
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 159.4	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	4.952
2022 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 56.753		
2022 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	• ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම – 16.9% • සැපයුම් ඇල ඉදිකිරීම – 3.5%		
2023 වසර සඳහා යෝජිත වැඩසටහන	• පිවිසුම් මාර්ගය ඉදිකිරීම • වැව් බැම්ම, සොරොව්ව, පිටවාන සහ සැපයුම් ඇළ ඉදිකිරීම ආරම්භ කිරීම		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• අනුරාධපුර දිස්ත්‍රික්කයේ පුද්ගලයින් 25,000කට පානීය ජලය සැපයීම (CKD අඩු කිරීම සහ සනීපාරක්ෂාව වැඩි කිරීම) • මහවිලච්චිය මහා වාරි යෝජනා ක්‍රමයේ බෝග තීව්‍රතාවය 1.57 සිට 2.0 දක්වා වැඩි කිරීම. • අලි මිනිස් ගැටුම් අවම කිරීම. • පුරාවිද්‍යා ස්ථාන තවදුරටත් විනාශ වීමෙන් ආරක්ෂා කිරීම. • විල්පත්තු ජාතික වනෝද්‍යානයේ වන සතුන්ට අවශ්‍ය ජල පහසුකම් සැපයීම. • මෝදරගම් අරු ගංගාවේ පාරිසරික තුලනය සඳහා ජල ගලනය සහතික කිරීම. • භූගත ජලය පෝෂණය කිරීම. • අනුරාධපුරයේ යෝජිත ඖෂධ කලාපය සඳහා ජලය සැපයීම.		
සමස්ථ ප්‍රතිලාභයෙන් මේ වන විට ලබා ඇති ප්‍රතිලාභ	මෙතෙක් ප්‍රතිලාභ නැත.		



බෝක්කු ඉදිකිරීම



වලන්තලියාව වැවෙහි පිටවාන් දොරටු ඉදිකිරීම

15. දෙමටගල්ල වැව ප්‍රතිසංස්කරණය කිරීම

ඇස්තමේන්තු ගත මුදල	රු.මි. 2,230.00	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	අනුරාධපුරය
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය**	ඝන මීටර මිලියන 2.32 හෙක්ටයාර 550
ව්‍යාපෘති කාලය	අවුරුදු 03 2021 – 2023	**ප්‍රතිලාභීන්**	පවුල් 1,246
ප්‍රතිපාදන 2022	රු.මි. 10	**2023 වසර සඳහා ප්‍රතිපාදන**	රු.මි.5
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 1.909	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	0.25
2022 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 1.653		
2022 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	පිවිසුම් මාර්ගය ඉදිකිරීම – 6.8%		
2023 වසර සඳහා යෝජිත වැඩසටහන	• මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘතීන් නැවත ක්‍රමෝපායකරණය හා කඩිනම් කිරීමේ (RAMP) කමිටුවේ තීරණය අනුව වැඩ නවතා ඇත		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• ග්‍රාමීය වැව් 32ක් යටතේ හෙක්ටයාර 550ක් වගාකොට පවුල් 1,246කට ප්‍රතිලාභ සැලසීම. • භෝග තීව්‍රතාවය 0.6 සිට 1.5 දක්වා වැඩිවීම මඟින් ගොවි ප්‍රජාවගේ දරිද්‍රතා මට්ටම අඩු කිරීම. • ව්‍යාපෘති මැදිහත්වීම් මගින් ප්‍රදේශයේ සමස්ථ සංවර්ධනය සහ එමගින් සමාජ-ආර්ථික තත්ත්වයන්, ජීවන තත්ත්වයන් නංවාලීම සහ දරිද්‍රතාවය අවම කිරීම. • කහල්ල පල්ලෙකැලේ වනාන්තර ප්‍රදේශයේ වන සතුන්ට ජලය සැපයීම. • මානව - සත්ත්ව ගැටුම අඩු වීම. • ගෘහස්ථ භාවිතය සඳහා පිරිසිදු ජලය ලබාදීම. • භූගත ජලය පෝෂණය කිරීම/ වියළීමට ලක්වන ළිං වල ජල මට්ටම වැඩි කිරීම.		
සමස්ථ ප්‍රතිලාභයෙන් මේ වන විට ලබා ඇති ප්‍රතිලාභ	මෙතෙක් ප්‍රතිලාභ නැත.		

16. උමා ඔය පහළ සංවර්ධන ව්‍යාපෘතිය

ඇස්තමේන්තුගත මුදල	රු.මි. 17,914.19	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	මොණරාගල, හම්බන්තොට
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව / වගා භූමි ප්‍රමාණය**	-ඝන මීටර මිලියන 6.5 (අලිකොට ආර), ඝන මීටර මිලියන 22.6 (කුඩා ඔය) - නව ඉඩම් හෙක්ටයාර 4500 සහ පවතින ඉඩම් හෙක්ටයාර් 1500
ව්‍යාපෘති කාලය	2013 -2023	**ප්‍රතිලාභීන්**	පවුල් 5,700
ප්‍රතිපාදන 2022	රු.මි. 2,060	**2023 වසර සඳහා ප්‍රතිපාදන**	රු.මි.2,320
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 11,877.602	**සමස්ත භෞතික ප්‍රගතිය (%)**	74.05
2022 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 2,006.672		
2022 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	• කුඩාඔය ජලාශය ඉදිකිරීම – 14.2 % • හඳපානාගල ජලාශයේ වම් ඉවුරු ඇල (කි.මී. 11) ඉදිකිරීම – 16.5 % • අලිකොට ආර - කුඩාඔය හරස් ඇළ ඉදිකිරීම – 12 % • කුඩාඔය - සිංහලයාගම හරස් ඇළ ඉදිකිරීම – 14 % • ගම් වාරිමාර්ග පද්ධති (සුළු වැව්) සංවර්ධනය – 14 % • හඳපානාගල අමුණ – 30 % • ඉඩම් අත්පත් කර ගැනීම, නැවත පදිංචි කිරීම, යටිතල පහසුකම් සංවර්ධනය සහ නැවත වන වගාව – 1.5 %		
2023 වසර සඳහා යෝජිත වැඩසටහන	• අලිකොට ආර, කුඩාඔය සහ හඳපානාගල ජලාශ ඉදිකිරීමේ ඉතිරි වැඩ කටයුතු • හඳපානාගල ජලාශයේ වම් ඉවුරු ඇල ඉදිකිරීමේ ඉතිරි වැඩ කටයුතු • අලිකොට ආර - කුඩාඔය හරස් ඇළ ඉදිකිරීමේ ඉතිරි වැඩ කටයුතු • හඳපානාගල අමුණ ඉදිකිරීමේ ඉතිරි වැඩ කටයුතු • ඉඩම් අත්පත් කර ගැනීම, නැවත පදිංචි කිරීම, යටිතල පහසුකම් සංවර්ධනය සහ නැවත වන වගාව		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• වාර්ෂික උමා ඔය ද්‍රෝණියේ සිට කිරිඳි ඔය ද්‍රෝණියට ඝන මීටර මිලියන 145 ජලය • නව ඉඩම් හෙක්ටයාර 4500 කට සහ දැනට පවතින ඉඩම් හෙක්ටයාර 1500 කට ජලය සැපයීම. මොනරාගල සහ හම්බන්තොට දිස්ත්‍රික්ක සඳහා ඝන මීටර මිලියන 30 පානීය හා කාර්මික ජලය සැපයීම. • සත්ත්ව ගොවිපොළ සහ මිරිදිය ධීවර සංවර්ධනය බොහෝ පුහුණු සහ නුපුහුණු පුද්ගලයින් සඳහා රැකියා අවස්ථා • නවීන තාක්ෂණයේ දැනුම හුවමාරු කිරීම • කුඩා වැව් 54ක් වැඩි දියුණු කිරීම සහ වැව් 110කට ජලය සැපයීම		

සමස්ථ ප්‍රතිලාභයෙන් මේ වන විට ලබා ඇති ප්‍රතිලාභ	• හදපානාගල LBMC යටතේ හෙක්ටයාර 100 (නව ඉඩම්) සඳහා වාරි ජලය නිකුත් කෙරුණි. • අලිකොට ආර ඇළ යටතේ හෙක්ටයාර 40.4 (කුඹුරු ඉඩම්) සඳහා වාරි ජලය නිකුත් කෙරුණි. කුඩාඔය ඇළ යටතේ හෙක්ටයාර 52.6 (කුඹුරු ඉඩම්) සඳහා වාරි ජලය නිකුත් කෙරුණි. • තවමත් පානීය ජලය ලබා දී නොමැත.



අලිකොට ආර හරස් ඇළ ඉදිකිරීම



කෝන්වැලෑන දිය මං පාලම



කුඩා ඔය හරස් ඇළ ඉදිකිරීම



කුඩාඔය - සිංහලයාගම හරස් ඇළ ඉදිකිරීම

17. හිඹිලියාකඩ වත්තේගෙදර වාරිමාර්ග යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

ඇස්තමේන්තුගත මුදල	රු.මි. 7,155	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	මාතලේ
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව / වගා භූමි ප්‍රමාණය**	-සන මීටර මිලියන 1.3 (වත්තේගෙදර වැව), -නව ඉඩම් අක්කර 1,010 සහ පවතින ඉඩම් අක්කර 1,300
ව්‍යාපෘති කාලය	2020-2024	**ප්‍රතිලාභීන්**	පවුල් 1,200
ප්‍රතිපාදන 2022	රු.මි. 271	**2023 වසර සඳහා ප්‍රතිපාදන**	රු.මි.250
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 398.81	**සමස්ත භෞතික ප්‍රගතිය (%)**	5.25
2022 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 221.61		
2022 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	• වත්තේගෙදර වැව ඉදිකිරීම – 9 %		
2023 වසර සඳහා යෝජිත වැඩසටහන	• වත්තේගෙදර වැව හා සොරොව්ව ඉදිකිරීම		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• පවතින හිඹිලියාකඩ ජලාශයේ ධාරිතාව වැඩි කිරීම • පවතින ඉඩම් අක්කර 1300 කට හා නව ඉඩම් අක්කර 1010 කට ජලය සැපයීම. • බෝග දර්ශකය 1 සිට 2 දක්වා වැඩි කිරීම.		
සමස්ථ ප්‍රතිලාභයෙන් මේ වන විට ලබා ඇති ප්‍රතිලාභ	මෙතෙක් ප්‍රතිලාභ නැත.		



වත්තේගෙදර වැව ඉදිකිරීම



වත්තේගෙදර වැවෙහි සොරොව්ව ඉදිකිරීම

18. විලකණ්ඩිය ජලාශ ව්‍යාපෘතිය

ඇස්තමේන්තු ගත මුදල	රු.මි. 298	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	බදුල්ල
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය**	ඝන මීටර මිලියන 1.06 හෙක්ටයාර 101
ව්‍යාපෘති කාලය	2012-2022	**ප්‍රතිලාභීන්**	පවුල් 250
ප්‍රතිපාදන 2022	රු.මි. 40	**2023 වසර සඳහා ප්‍රතිපාදන**	-
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 272.911	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	97.35
2022 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 39.999		
2022 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	• ප්‍රධාන ඇල සහ ප්‍රධාන ඇලෙහි නිර්මිත ඉදිකිරීම • බෙදුම් ඇල මාර්ග සහ නිර්මිත ඉදි කිරීම • කෙත් ඇල මාර්ග සහ නිර්මිත ඉදි කිරීම.		
2023 වසර සඳහා යෝජිත වැඩසටහන	• සියලුම ඉදිකිරීම් කටයුතු අවසන් කිරීම		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• කන්න දෙකම වගා කිරීම සඳහා හෙක්ටයාර 101කට වාරි ජල පහසුකම් සැපයීම.		
සමස්ථ ප්‍රතිලාභයෙන් මේ වන විට ලබා ඇති ප්‍රතිලාභ	තවම ලැබී නොමැත.		



ප්‍රධාන ඇලේ ඉදිකිරීම්



නිර්මිත ඉදිකිරීම

19. මහගල්ගමුව පෝෂිත ඇළ ඉදිකිරීමේ ව්‍යාපෘතිය

ඇස්තමේන්තු ගත මුදල	රු.මි. 500	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	කුරුණෑගල
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය**	ඝන මීටර මිලියන 8 හෙක්ටයාර 566
ව්‍යාපෘති කාලය	2014-2023	**ප්‍රතිලාභීන්**	පවුල් 2,000
ප්‍රතිපාදන 2022	රු.මි. 30	**2023 වසර සඳහා ප්‍රතිපාදන**	රු.මි. 100
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 374.99	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	93.05
2022 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 13.45		
2022 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	• නිර්මිත ඉදි කිරීම (conduit සහ under crossing ඉතිරි වැඩ නිම කිරීම)		
2023 වසර සඳහා යෝජිත වැඩසටහන	• සියලුම ඉදිකිරීම් කටයුතු අවසන් කිරීම		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• අළුත් හා පවත්නා ඉඩම් හෙක්ටයාර 566ක් සඳහා වාරිමාර්ග ජලය සැපයීම.		
සමස්ථ ප්‍රතිලාභයෙන් මේ වන විට ලබා ඇති ප්‍රතිලාභ	• පළමු කිලෝමීටර් 2ක ඇතුලත වගා කිරීම සඳහා ජලය සපයනු ලැබේ.(පෝෂිත ඇල දෙපස කුඹුරු ඉඩම් සඳහා ජලය ලබා දෙනු ලැබේ)		





නිර්මිත ඉදිකිරීම

වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වෙන වෙනත් ව්‍යාපෘති

1. දැදුරු ඔය ජලාශ ව්‍යාපෘතිය

ඇස්තමේන්තු ගත මුදල	රු.මි. 13,540	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	කුරුණෑගල, පුත්තලම
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය**	ඝන මීටර මිලියන 75 හෙක්ටයාර 10,932
ව්‍යාපෘති කාලය	2005-2022	**ප්‍රතිලාභීන්**	පවුල් 12,500
ප්‍රතිපාදන 2022	රු.මි. 50	**2023 වසර සඳහා ප්‍රතිපාදන**	-
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 13,472.58	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	99.9
2022 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 40.73		
2022 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	• ඉඩම් අත්පත් කර ගැනීම සහ වන්දි ලබා දීම – 26%		
2023 වසර සඳහා යෝජිත වැඩසටහන	• ඉතිරි වැඩ කටයුතු කරගෙන යාම		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• ගොවි පවුල් 12,500කට අයත් ඉඩම් හෙක්ටයාර 10,932 සඳහා දෙකන්නය වගා කිරීමට වාරි ජල පහසුකම් සැපයීම. • කුරුණෑගල සහ පුත්තලම දිස්ත්‍රික්කවල පවුල් 100,000ක් සඳහා පානීය ජලය සැපයීම. • මෙගා වොට් 1.5ක ජල විදුලි උත්පාදනය.		
සමස්ථ ප්‍රතිලාභයෙන් මේ වන විට ලබා ඇති ප්‍රතිලාභ	• යල සහ මහ කන්න දෙකෙහිම කුඹුරු හෙක්ටයාර් 10,932 කට වාරි ජලය සපයනු ලැබේ. • පවුල් 50,000කට පානීය ජලය සපයනු ලැබේ.. • 1.5MW විදුලි බලය උත්පාදනය කර ජාතික විදුලිබල පද්ධතියට සපයනු ලැබේ.. • ගංවතුරෙන් ආරක්ෂාව සැලසේ. • මිරිදිය ධීවර කටයුතු සඳහා පහසුකම් සැලසේ.		

2. පහළ මල්වතු ඔය බහු කාර්යය සංවර්ධන ව්‍යාපෘතිය

ඇස්තමේන්තු මුදල	රු.මි. 22,900	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	අනුරාධපුර, මන්නාරම සහ වවුනියාව
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය**	ඝන මීටර මිලියන 209 හෙක්ටාර 13,472
ව්‍යාපෘති කාලය	2016-2024	**ප්‍රතිලාභීන්**	පවුල් 10,000
ප්‍රතිපාදන 2022	රු.මි. 500	**2023 වසර සඳහා ප්‍රතිපාදන**	රු.මි. 550.00
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 953.33	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	4.28
2022 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 495.64		

2022 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	• වේල්ල ඉදිකිරීම • නිල නිවාස සහ සංචාරක බංගලාව ඉදිකිරීම • පිටවාන ඉදිකිරීම (කැණීම්) • ආදර්ශ වාරි ගොවිපළ ඉදිකිරීම • දකුණු සහ වම් ඉවුරෙහි පහළ නිම්න සංවර්ධන සැලසුම් වැඩ
2023 වසර සඳහා යෝජිත වැඩසටහන	• මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘතීන් නැවත ක්‍රමෝපායකරණය හා කඩිනම් කිරීමේ (RAMP) කමිටුවේ තීරණය අනුව වැඩ අත්හිටුවා ඇත
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• යෝධ වැව සහ අකතිමුරුප්පු වැව යටතේ නව වාරි ඉඩම් හෙක්ටයාර 1,052 කට (කුඹුරු සහ OFC) සහ දැනට වගා කළ හැකි ඉඩම් හෙක්ටයාර 12,420 කට වාරි පහසුකම් සැපයීම. • වවුනියාව, මන්නාරම සහ අනුරාධපුර දිස්ත්‍රික්කවල වාර්ෂික ගෘහස්ථ ජල ඉල්ලුම සපුරාලීම සඳහා ජලය 27 MCM සැපයීම. • වාර්ෂිකව ව්‍යාපෘතිය හරහා ජනනය කෙරෙන 4.68 GWh ක විදුලිය ජාතික විදුලිබල පද්ධතියට එක් කිරීම. • සංචාරක කර්මාන්තය දියුණු කිරීම. • නව නගර සැලසුම් ව්‍යාපෘතිය යටතේ තන්තිරිමලේ සංවර්ධනය කිරීම. • වවුනියාව සහ මන්නාරම දිස්ත්‍රික්කවල ගංවතුර අවම කිරීම. • සූර්ය බලශක්ති ව්‍යාපෘති හඳුන්වා දීම • ව්‍යාපෘති කාලය තුළ නව රැකියා අවස්ථා සැලසීම . • ධීවර හා ජලජ සම්පත් සංවර්ධනය. • අභ්‍යන්තර මාර්ග පද්ධතිය වැඩිදියුණු කිරීම • ශක්තිමත් කරන ලද ගොවිජන සේවා ක්‍රියාකාරකම් සහ ආයතනික සංවර්ධනය කිරීම.
සමස්ථ ප්‍රතිලාභයෙන් මේ වන විට ලබා ඇති ප්‍රතිලාභ	- මෙතෙක් ප්‍රතිලාභ නැත.



සොරොව්ව ඉදිකිරීම



වේලි අක්ෂයේ ඉදිකිරීම්

3. බස්නාගොඩ ජලාශ ව්‍යාපෘතිය

ඇස්තමේන්තු මුදල	රු.මි. 2,347.406	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	ගම්පහ
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	NWS&DB (චීන EXIM බැංකුවෙන් ණය ආධාර යටතේ)	**ජලාශ ධාරිතාව / වගා භූමි ප්‍රමාණය**	ඝන මීටර මිලියන 5.5
ව්‍යාපෘති කාලය	2019-2023	**ප්‍රතිලාභීන්**	පවුල් 250,000
ප්‍රතිපාදන 2022	EPC ගිවිසුමකි.	**2023 වසර සඳහා ප්‍රතිපාදන**	EPC ගිවිසුමකි.
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 401.16 (මීට අමතරව, රු.මි. 469.48 අත්තිකාරම් ලෙස ගෙවා ඇත)	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	25.25
2022 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 219.63		
2022 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	• කැණීම් කටයුතු • ඉඩම් අත්පත් කර ගැනීම • ස්ථිර මාර්ග ඉදිකිරීම හා පාලම් ඉදිකිරීම • නිර්මාණ කටයුතු		
2023 වසර සඳහා යෝජිත වැඩසටහන	• 2022 වසරේදී ආරම්භ කරන ලද කාර්යයන් කරගෙන යාම		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• ගම්පහ, අත්තනගල්ල මිනුවන්ගොඩ ඒකාබද්ධ ජල සම්පාදන යෝජනා ක්‍රමය (GAMIWSS) යටතේ ගම්පහ දිස්ත්‍රික්කයට පානීය ජලය සැපයීම.		
සමස්ථ ප්‍රතිලාභයෙන් මේ වන විට ලබා ඇති ප්‍රතිලාභ	• ජලාශයේ ඉදිකිරීම් තවමත් සිදුවන බැවින් පානීය ජලය සැපයීම තවමත් ආරම්භ කර නොමැත.		



කැණීම් කටයුතු



පාරවල් ඉදිකිරීම

4. බැරැක් ප්ලේන් සංවර්ධන ව්‍යාපෘතිය.

ඇස්තමේන්තු මුදල	රු.මි. 230	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	නුවරඑළිය
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව / වගා භූමි ප්‍රමාණය**	ඝන මීටර මිලියන 0.12 හෙක්ටයාර 800
ව්‍යාපෘති කාලය	2021 - 2022	**ප්‍රතිලාභීන්**	පවුල් 3,000
ප්‍රතිපාදන 2022	රු.මි. 100	**2023 වසර සඳහා ප්‍රතිපාදන**	රු.මි. 30
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 106.03	**සමස්ථ භෞතික ප්‍රගතිය** (%)	91
2022 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 61.03		
2022 වසර තුළ **ක්‍රියාත්මක කළ** වැඩසටහන	• අධික මුල් සහිත ජලජ වල පැලෑටි උදුරා දැමීම සහ ඉවත් කිරීම. • ජලාශයේ රොන් මඩ කැණීම සහ ඉවත් කිරීම.		
2023 වසර සඳහා යෝජිත වැඩසටහන	• ඉතිරි වැඩ කටයුතු කරගෙන යාම		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• වගා බිම් ප්‍රමාණය හෙක්ටයාර 800ක් වන අතර ගොවි පවුල් 350ක් ප්‍රතිලාභ ලබන අතර පවුල් 3000ක් සඳහා පානීය ජලය සපයයි.		
සමස්ථ ප්‍රතිලාභයෙන් මේ වන විට ලබා ඇති ප්‍රතිලාභ	• යල කන්නය සඳහා හෙක්ටයාර 455 ක් සහ මහ කන්නය සඳහා හෙක්ටයාර 910 ක් වගා කර ඇත • ඌව පරණගම ප්‍රදේශයට දිනකට ඝ.මී මිලියන 3,000 පානීය ජල සැපයුම		





රොන්මඩ කැණීම සහ ඉවත් කිරීම

5. පැලවත්ත උක් වගා පර්යන්ත ප්‍රදේශයේ වාරිමාර්ග පද්ධතිය සංවර්ධනය කිරීම

ඇස්තමේන්තුගත මුදල	රු.මි. 143.50	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	මොණරාගල
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය**	මංකඩ වැව-80 අක්කර අඩි තුමුල්ල වැව - 250 අක්කර අඩි මීපලේ වැව- 150 අක්කර අඩි වෙල්ලස්ස වැව - 175 අක්කර අඩි
ව්‍යාපෘති කාලය	2021 – 2022	**ප්‍රතිලාභීන්**	ලංකා සීනි සමාගම පැලවත්ත
ප්‍රතිපාදන 2022	රු.මි. 50	2023 **වසර සඳහා ප්‍රතිපාදන**	රු.මි. 30
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 78.05	**සමස්ථ භෞතික ප්‍රගතිය** (%)	44.42
2022 **වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය**	රු.මි. 41.04		
2023 වසර සඳහා යෝජිත වැඩසටහන	• ඉතිරි වැඩ කටයුතු කරගෙන යාම		
2022 **වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන**	• මංකඩ වැව 100% • මීපලේ වැව 100% • තුම්මුල්ල වැව 90%		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• පැලවත්ත උක් වගා ප්‍රදේශය තුල ජලය ගබඩා කිරීමේ ධාරිතාවය වැඩි කිරීම සහ එමගින් උක් අස්වැන්න වැඩි කර ගැනීම.		
සමස්ථ ප්‍රතිලාභයෙන් මේ වන විට ලබා ඇති ප්‍රතිලාභ	• පහත පරිදි වැව්වල ධාරිතාව වැඩි කිරීම • මාන්කඩ වැව - අක්කර අඩි 75, මීපලේ වැව - අක්කර අඩි 100		





මීපලේ වැවේ ඉදිකිරීම් කටයුතු

6. ගම සමග පිළිසඳරක් වැඩසටහන

6.1 පාන් ඔය අමුණ

ඇස්තමේන්තුගත මුදල	රු.මි. 66.18	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	ත්‍රිකුණාමලය
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව / වගා භූමි ප්‍රමාණය**	හෙක්ටයාර 421
ව්‍යාපෘති කාලය	2021 - 2023	**ප්‍රතිලාභීන්**	පවුල් 580
ප්‍රතිපාදන 2022	රු.මි. 65.60	**2023 වසර සඳහා ප්‍රතිපාදන**	රු.මි. 22.29
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 44.41	**සමස්ත භෞතික ප්‍රගතිය (%)**	65
2022 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 25.49		
2022 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	• ද්‍රෝණියේ කොටසක සහ දෙපස බැම්මේ ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇත.		
2023 වසර සඳහා යෝජිත වැඩසටහන	• ඉතිරි වැඩ කටයුතු කරගෙන යාම		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• කල්‍යාණපුර ප්‍රදේශයේ හෙක්ටයාර 421ක වගා ඉඩම් සඳහා වාරි පහසුකම් සපයීම. • ගංවතුර ආරක්ෂාව සපයීම.		
සමස්ථ ප්‍රතිලාභයෙන් මේ වන විට ලබා ඇති ප්‍රතිලාභ	මෙතෙක් ලැබී නොමැත.		



පාන් ඔය අමුණේ ඉදිකිරීම්

6.2. පේරමඩුව ජලාශය

ඇස්තමේන්තුගත මුදල	රු.මි. 118.09	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	ත්‍රිකුණාමලය
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව / වගා භූමි ප්‍රමාණය**	අක්කර අඩි 3345 හෙක්ටයාර 304
ව්‍යාපෘති කාලය	2021 – 2023	**ප්‍රතිලාභීන්**	පවුල් 300
ප්‍රතිපාදන 2022	රු.මි. 86.65	**2023 වසර සඳහා ප්‍රතිපාදන**	රු.මි. 64.79
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 53.33	**සමස්ත භෞතික ප්‍රගතිය (%)**	60
2022 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 33.77		
2022 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	• වැව් බැම්මේ කොටසක පස් වැඩ අවසන් කර ඇත. • පිට වාන ඉදිකිරීම් කටයුතු 50%ක් අවසන් කර ඇත.		
2023 වසර සඳහා යෝජිත වැඩසටහන	• ඉතිරි වැඩ කටයුතු කරගෙන යාම		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• නව ඉඩම් හෙක්ටයාර 125කට වාරි පහසුකම් සැපයීම යල සහ මහ කන්න දෙකන්නහිම හෙක්ටයාර 750ක ජල අවශ්‍යතාවය සහතික කිරීම සහ කුඹුරු ප්‍රමාණය වැඩි කිරීම.		
සමස්ථ ප්‍රතිලාභයෙන් මේ වන විට ලබා ඇති ප්‍රතිලාභ	• නව ඉඩම් හෙක්ටයාර 51ක් සඳහා වාරි පහසුකම් සැපයීම • යල සහ මහ කන්න දෙකටම හෙක්ටයාර 304ක් සඳහා ජලය සැපයීම		





පේරමඩුව වැවේ ඉදිකිරීම්

6.3. ගිරිතලේ වැව සිට කිරිමැටිපිටිය වැව දක්වා පෝෂිත ඇල ඉදිකිරීම

ඇස්තමේන්තුගත මුදල	රු.මි 14	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	පොළොන්නරුව
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය**	-
ව්‍යාපෘති කාලය	2021-2023	**ප්‍රතිලාභීන්**	පවුල් 300
ප්‍රතිපාදන 2022 (රු.මි.)	රු.මි 35.18	2023 වසර සඳහා ප්‍රතිපාදන(රු.මි.)	-
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි 97.17	**සමස්ථ භෞතික ප්‍රගතිය** (%)	100
2022 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි 35.18		
2022 වසර තුළ **ක්‍රියාත්මක කළ** වැඩසටහන	• කිරිමැටිපිටිය වැවේ ඉතිරි වැඩ අවසන් කිරීම. • බැරකම් පියවීම. (ගංගොඩ වැව, අඹගස් වැව වාන් ඇල, මැදිරිගිරිය මාර්ග ජාලය වැඩිදියුණු කිරීම)		
2023 වසර සඳහා යෝජිත වැඩසටහන	• 2022 වසරේදී අවසන් කර ඇත		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• ගංගොඩ වැව සහ කුසුම් පොකුණ වැව් වල ධාරිතාවය වැඩි කිරීම. • ප්‍රවේශ මාර්ගය වැඩිදියුණු කිරීම. • ජල කළමනාකරණය පහසු වීම.		
සමස්ථ ප්‍රතිලාභයෙන් මේ වන විට ලබා ඇති ප්‍රතිලාභ	• ගංගොඩ වැව සහ කුසුම් පොකුණ වැව් වල ධාරිතාවය වැඩි කිරීම • ප්‍රවේශ මාර්ගය වැඩිදියුණු කිරීම • ජල කළමනාකරණය පහසු වීම		





පෝෂිත ඇලේ ඉදිකිරීම් කටයුතු

6.4.කුමාර ඇල ඇමුණ ඉදිකිරීම

ඇස්තමේන්තුගත මුදල(රු.මි)	රු.මි 24	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	පොළොන්නරුව
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය**	හෙක්ටයාර 81
ව්‍යාපෘති කාලය	2021-2023	**ප්‍රතිලාභීන්**	පවුල් 100
ප්‍රතිපාදන 2022	රු.මි 6.22	2023 වසර සඳහා **ප්‍රතිපාදන**	-
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි 20.89	**සමස්ථ භෞතික ප්‍රගතිය** (%)	100
2022 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි 6.22		
2023 වසර සඳහා යෝජිත වැඩසටහන	2022 වසරේදී අවසන් කර ඇත		
2022 වසර තුළ **ක්‍රියාත්මක** කළ වැඩසටහන	අමුණේ ඉතිරි වැඩ අවසන් කිරීම.		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• ජල කළමනාකරණය පහසු වීම • ගංවතුර හානි අවම වීම.		
සමස්ථ ප්‍රතිලාභයෙන් මේ වන විට ලබා ඇති ප්‍රතිලාභ	• ජල කළමනාකරණය වැඩි වියුණු කරන ලදී • ගංවතුර හානි අවම වීම.		





කුමාර ඇල අමුණ

6.5. පදවිය හා වාහල්කඩ යෝජනා ක්‍රම ප්‍රතිසංස්කරණය

ඇස්තමේන්තු ගත මුදල	රු මි 630	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්කය**	අනුරාධපුර
මූල්‍ය පහසුකම් සැපයෙන් ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව / වගා භූමි ප්‍රමාණය**	ඝන මීටර මිලියන 157
ව්‍යාපෘති කාලය	2021-2023	**ප්‍රතිලාභීන්**	පවුල් 3950
ප්‍රතිපාදන 2022	රු මි. 60.53	2023 **වසර සඳහා ප්‍රතිපාදන**	රු මි. 30
සමුච්චිත මූල්‍ය ප්‍රතිපාදන	රු මි. 79.53	**සමස්ථ භෞතික ප්‍රගතිය**	11.5
2022 **වර්ෂයේ මූල්‍ය ප්‍රතිපාදන**	රු මි. 23.63		
2022 **වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන**	• පදවිය හා වාහල්කඩ ව්‍යාපාර වල කෘෂි මාර්ග වැඩි දියුණු කිරීම. • පදවිය හා වාහල්කඩ ව්‍යාපාර වල කුඹුරු බට නිර්මිත සඳහා බට මිලදී ගැනීම • (සටහන :- 2022 වසරේ දී කිසිදු ඉදිකිරීමක් සිදු නොකළ අතර, 2021 වසරේ තිබූ බැරකම් පමණක් ගෙවීම් කරන ලදි)		
2023 වසර සඳහා යෝජිත වැඩසටහන	• ඉතිරි වැඩ කටයුතු කරගෙන යාම		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• පදවිය සහ වාහල්කඩ යෝජනා ක්‍රමවල කෘෂිකාර්මික මාර්ග සංවර්ධනය කිරීම මගින් ගොවීන්ට අවශ්‍ය ප්‍රවාහන පහසුකම් වැඩි කිරීම. (පවත්නා වාරි ඉඩම් - හෙක්ටයාර 4375, පවුල් - 3950) • ජල කළමනාකරණයේ කාර්යක්ෂමතාව වැඩි කිරීම		
සමස්ථ ප්‍රතිලාභයෙන් මේ වන විට ලබා ඇති ප්‍රතිලාභ	• කෘෂිකර්මික මාර්ග සංවර්ධනය කිරීම. (පදවිය යෝජනා ක්‍රමය - කි.මී. 22, කෘෂිකාර්මික මාර්ග 13 ක් සහ වාහල්කඩ යෝජනා -ක්‍රමය- කි.මී. 9, කෘෂිකාර්මික මාර්ග 4ක්)		



පදවිය ව්‍යාපාරයේ ඉදිකිරීම් කටයුතු



පදවිය සහ වාහල්කඩ ව්‍යාපාර සඳහා hume පයිප්ප

7. ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය

ඇස්තමේන්තුගත මුදල	රු.මි.3362	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	අම්පාර, අනුරාධපුර, බදුල්ල, මඩකළපුව, ගාල්ල, හම්බන්තොට, මහනුවර, මන්නාරම, කුරුණෑගල, ත්‍රිකුණාමලය
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ලෝක බැංකුව	**ජලාශ ධාරිතාව / වගා භූමි ප්‍රමාණය**	20 වාරිමාර්ග යෝජනා ක්‍රම ප්‍රතිසංස්කරණය කිරීම
ව්‍යාපෘති කාලය	2021-2025	**ප්‍රතිලාභීන්**	ගොවි සංවිධාන වල සියලුම සාමාජිකයින් සහ එම යොජනා වලින් ප්‍රතිලාබ ලබන අනෙකුත් සියලුම පාර්ශව කරුවන් සහ පරිශීලකයින්
ප්‍රතිපාදන 2022	රු.මි. 88(අත්සන් කරන ලද ගිවිසුම් වල වටිනාකම)	**2023 වසර සඳහා ප්‍රතිපාදන**	රු.මි. 1700(අත්සන් කළ යුතු ගිවිසුම් සඳහා වටිනාකම)
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 12	**සමස්ත භෞතික ප්‍රගතිය (%)**	53
2022 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 12		
2022 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	• මහළිද වැව ප්‍රතිසංස්කරණය කිරීම.(කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක වෙමින් පවතී.) • නාගදීප යෝජනා ක්‍රමය යටතේ අරාවත්ත වැව වැඩිදියුණු කිරීම. (කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක වෙමින් පවතී.)		
2023 වසර සඳහා යෝජිත වැඩසටහන	• ඉතිරි වැඩ කටයුතු කරගෙන යාම		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• පවතින වේලි ශක්තිමත් කිරීම. • වාරිමාර්ග යෝජනා ක්‍රම වල ඇති ඇළ පද්ධති ප්‍රතිසංස්කරණය කිරීම. • වගා තීව්‍රතාවය වැඩි කිරීම. • ගොවීන්ගේ ආදායම වැඩි කිරීම.		
සමස්ථ ප්‍රතිලාභයෙන් මේ වන විට ලබා ඇති ප්‍රතිලාභ	• මහළිද වැව ප්‍රතිසංස්කරණය කිරීම හා දැනට පවතින සොරොව්ව පිළිසකර කිරීම. • අරාවත්ත වැව් බැම්ම ශක්තිමත් කිරීම.රළපනාව සැකසීම,Toe filter සැකසීම හා සේවා මාර්ගය සැකසීම.		



සොරොව්ව ඉදිකිරීම



වැව් බැම්ම වැඩිදියුණු කිරීම

2.2. අභියෝග

- කාර්තුමය අයවැය සීමාවන් වලට අනුව වැඩ සැලසුම් කිරීම.

- සීඝ්‍රයෙන් වෙනස් වන වෙළඳපොල මිල සහ ඉදිකිරීම් ද්‍රව්‍ය (සිමෙන්ති, වානේ, රබර් වතුර නැවතුම, ගේබියන් පෙට්ටි ආදිය) ලබා ගැනීමේ හැකියාව සමඟ නව ඉදිකිරීම්, පුනරුත්ථාපන, ප්‍රතිසංස්කරණ සහ නඩත්තු කටයුතු සිදු කිරීම.

- නව ඉදිකිරීම්, පුනරුත්ථාපන කටයුතු සඳහා වැලි, බොරළු සහ පස් සොයා ගැනීමට අදාළ ආයතනවල බලපත්‍ර සහ අනුමැතිය (භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව) ලබා ගැනීම.

- වාර්ෂික ඉලක්ක සපුරා ගැනීම සඳහා ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ සඳහා ඉන්ධන සැපයීම.

- ඉන්ධන අර්බුදය යටතේ අයවැයෙන් වෙන් කරන ලද මුදල් 100% භාවිතා කිරීම.

- අයතා මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් ජලාශ, වැව්, පොකුණු, ගංගා සහ ස්වභාවික ජල මාර්ගවල ගුණාත්මකභාවයට සිදුවන බලපෑම අවම කිරීම.

- දේශගුණික විපර්යාසවල බලපෑම් සමඟ වාරිමාර්ග යටිතල පහසුකම් ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම.

- ගංවතුර හා නියඟ අවම කිරීම සඳහා නව ජලාශ ඉදිකිරීම සඳහා ඉඩම් සීමා වීම.

- වගා තිව්‍රතාවය වැඩි කිරීම සහ වෙනත් ක්ෂේත්‍ර භෝග අවශ්‍යතාවයෙන් ස්වයංපෝෂිතභාවය ළඟා කර ගැනීම සඳහා වෙනත් ක්ෂේත්‍ර භෝග වගා කිරීම පිළිබඳ ගොවියාගේ ආකල්පය වෙනස් කිරීම.

- වගා ඉඩම් වල ඵලදායිතාව වැඩි දියුණු කිරීම (නව ජල කළමනාකරණ ක්‍රමවේදයන් සහ බෝග විවිධාංගීකරණය කිරීමෙන් පවතින ජලයෙන් උපරිම භූමි ප්‍රමාණයක් වගා කිරීම)

- වාරිමාර්ග ඇළවල් වල මුල් කොටසේ මෙන්ම අග කොටසේ වගා කටයුතු කරන ගොවීන් සඳහා සමාන ජල අයිතියක් ලබා දීම.

- ජලාශවල හා වාරිමාර්ග ඇළ මාර්ගවල පැතිරී ඇති ආක්‍රමණශීලී ජලජ ශාක පාලනය කරමින් මනා ජල කළමනාකරණයක් සිදු කිරීම.

- සීමිත මානව සම්පත් හේතුවෙන් ගංවතුර පුරෝකථන සහ පූර්ව අනතුරු ඇඟවීම සම්බන්ධයෙන් අවශ්‍ය වන තාක්ෂණික හැකියාවන් වර්ධනය කිරීමේ දුෂ්කරතාවය.

- තථ්‍ය කාලීන ජලමිතික දත්ත කළමනාකරණ පද්ධතියේ නඩත්තු කටයුතු හා අලුත්වැඩියාවන් සිදු කර ගැනීමේ දුෂ්කරතා.
- රට තුල ජල සම්පත් සංවර්ධනය සඳහා විභවයක් පවතින නමුත් දැනට ජල මිනුම් ස්ථාන නොමැති ගංගාවල ජල මිනුම් ස්ථාන පිහිටුවීම හා දැනටමත් පවත්වාගෙන යනු ලබන ජල මිනුම් ස්ථාන යාවත්කාලීන කිරීම.
- ජීවිත සහ දේපළවලට සිදුවන හානිය අවම කරමින් හැකි ඉක්මනින් ගංවතුර බැස යාමට පහසුකම් සැලසීම සඳහා නාගරික ප්‍රදේශවල ඇති සියලුම ජලාපවහන ඇලවල් සුද්ද කිරීම සහ නියමිත ප්‍රමිතියට පවත්වාගන යාම.
- අනවසරයෙන් අල්ලාගෙන සිටින රක්ෂිත ඉඩම් නිදහස් කර ගැනීම, රක්ෂිත ලෙස පවත්වාගෙන යාමට අවශ්‍ය ඉඩම් සහ අනෙකුත් පාරිසරික සංවේදී ප්‍රදේශ අත්පත් කර ගැනීම සහ එවැනි රක්ෂිත ආරක්ෂා කිරීම.

- ගංගා පතුළ පහත වැටීම හේතුවෙන් ප්‍රධාන ගංගාවලට ලවණකාව ඇතුළු වීම වැළැක්වීම.
- මහා පරිමාණ , නීති විරෝධී, තාක්ෂණික නොවන වැලි සහ වෙනත් කැණීම් වලින් ගංගා සහ ගංගා අවට ප්‍රදේශ ආරක්ෂා කර ගැනීම.
- ජලය හා සම්බන්ධ මූලික අයිතිය ආරක්ෂා කරමින් වාරිමාර්ග ජල අවශ්‍යතා සපුරාලමින් පානීය හා කාර්මික ජල අවශ්‍යතා සැපයීම.
- අයතා මිනිස් ක්‍රියාකාරකම් වලින් ජල මාර්ග ආරක්ෂාකර ගැනීම.
- පවත්නා පද්ධතියට නව තාක්ෂණයන් යොදා ගැනීම හා යාවත්කාලින කිරීම.

2.3. ඉදිරි ඉලක්ක

- ජාතියේ ආහාර සුරක්ෂිතතාවය 100% ක් සම්පූර්ණ කිරීම.
- ගංවතුරෙන් ජීවිත සහ දේපල වලට සිදුවන බලපෑම අවම කිරීම.
- ඉඩම් අක්කර 150000 ක් සඳහා වාරිමාර්ග පහසුකම් සැපයීම.
- බෝග විවිධාංගීකරණය මගින් බෝග තීව්‍රතාවය 2.0 ට ආසන්න මට්ටමට ගැනීම.
- ගංගා පිරිසිදුව නඩත්තු කිරීම.
- ගංගා ද්‍රෝණි කළමනාකරණය සඳහා සැලැස්ම සකස්කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- පරිසරය හා වන ජීවීන් ආරක්ෂා කරමින් පානීය හා කාර්මික ජල අවශ්‍යතා සහ අනෙකුත් පරිශීලකයින්ගේඅවශ්‍යතා සපුරාලීම.
- ප්‍රමාණවත් ජලාපවාහන පහසුකම් සපයා තෙත් කලාපයේ සියලුම වගා කළ හැකි ඉඩම් වගා කිරීම.

.....

ඉංජි. දීපිකා ප්‍රියානි ත්‍රිමහවිතාන
වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්
වාරිමාර්ග දෙපාර්තමේන්තුව

පරිච්ඡේදය 03 - 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ථ මූල්‍ය කාර්ය සාධනය

3.1. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ-එල්

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2022 රු.		සටහන	තත්‍ය 2022 රු.	- 2021 රු.	
-	**ආදායම් ලැබීම්**				
-	ආදායම් බදු	**1**			
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	**2**			**ඒසීඒ-1**
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	**3**			
-	බදු නොවන ආදායම් හා වෙනත්	**4**			
-	**මුළු ආදායම් ලැබීම් (අ)**				
-	**ආදායම් නොවන ලැබීම්**				
-	භාණ්ඩාගාර අග්‍රිම		10,538,704,000	16,334,636,000	**ඒසීඒ-3**
-	තැන්පතු		672,614,792	633,489,600	**ඒසීඒ-4**
-	අත්තිකාරම් ගිණුම්		192,835,098	191,325,306	**ඒසීඒ-5**
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**11,404,153,890**	**17,159,450,906**	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**11,404,153,890**	**17,159,450,906**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		-	-	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		**11,404,153,890**	**17,159,450,906**	
	අඩු කළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**		-	-	
3,229,725,800	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	**5**	3,200,968,744	2,905,757,920	
346,792,802	අනෙකුත් භාණ්ඩ හා සේවා	**6**	334,478,871	294,714,372	**ඒසීඒ-2(ii)**
15,373,298	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	**7**	14,915,778	13,096,353	
-	පොළී ගෙවීම්	**8**	-	-	
3,608,100	වෙනත් පුනරාවර්තන වියදම්	**9**	3,608,100	-	
3,595,500,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**3,553,971,493**	**3,213,568,645**	

	මූලධන වියදම්				
1,158,000,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	**10**	1,125,159,620	2,141,398,948	
2,115,500,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	**11**	1,545,005,570	5,597,916,828	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	**12**	-	-	**ඒසිඒ-2(ii)**
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	**13**	-	-	
6,000,000	හැකියා වර්ධනය	**14**	5,481,559	14,790,627	
2,787,000,000	වෙනත් මූලධන වියදම්	**15**	2,461,720,692	770,102,095	
6,066,500,000	**මුළු මූලධන වියදම් (උ)**		**5,137,367,441**	**8,524,208,498**	
	තැන්පතු ගෙවීම්		723,878,520	938,620,694	**ඒසිඒ-4**
	අත්තිකාරම් ගෙවීම්		140,562,508	173,111,463	**ඒසිඒ-5**
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		864,441,028	1,111,732,157	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		9,555,779,962	12,849,509,300	
9,662,000,000	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		**1,848,373,928**	**4,309,941,606**	
	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		1,848,373,928	4,306,333,506	**ඒසිඒ-7**
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය			3,608,100	**ඒසිඒ-3**
			1,848,373,928	**4,309,941,606**	

3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-8

2022 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	නත්‍ය 2022 රු.	2021 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	101,792,230,778	99,270,046,673
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	581,124,329	633,396,919
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	-	3,608,100
මුළු වත්කම්		**102,373,355,107**	**99,907,051,692**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		95,624,444	96,633,306
දේපළ පිරියත හා උපකරණ සංචිතය		101,792,230,778	99,270,046,673
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසිඒ-5(බී)		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසිඒ-4	485,499,885	536,763,613
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	-	3,608,100
මුළු වගකීම්		**102,373,355,107**	**99,907,051,692**

පිටු අංක 6 සිට 44 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 45 සිට 63 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මඟින් හෙළදිරවී කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් ව්‍යවස්ථාපිත ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම :	නම :	නම : ඩී. ටී. ඒ. ප්‍රියන්ති
තනතුර :	තනතුර : 24/02/2023.	මූල්‍ය නිලධාරි
දිනය : 2023/02/24	දිනය :	24/02/2023.
යූ.ඩී.සී. ජයලාල්	ඉංජි. දීප්තිකා ප්‍රියානි ත්‍රිමහවිතාන	වාරිමාර්ග දෙපාර්තමේන්තුව
ලේකම්	වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්	කොළඹ 07.
වාරිමාර්ග අමාත්‍යාංශය	වාරිමාර්ග දෙපාර්තමේන්තුව	
අංක 500, වී.ඒ. ජයා මාවත,	බෞද්ධාලෝක මාවත,	
කොළඹ 10.	කොළඹ 07. 2	

3.3. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	තත්‍ය	
	2022	**2021**
	රු.	රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	267,928,954	222,218,762
අග්‍රිම ලැබීම්	10,538,704,000	16,334,636,000
අත්තිකාරම් අයකර ගැනීම්	191,148,841	191,903,985
තැන්පතු ලැබීම්	672,614,792	633,489,600
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**11,670,396,587**	**17,382,248,347**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	7,125,127,135	6,125,296,150
සහනාධාර සහ මාරුකිරීම්	14,915,778	13,096,353
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	2,131,079,621	4,578,222,019
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	-	-
අත්තිකාරම් ගෙවීම්	140,527,628	175,380,261
තැන්පතු ගෙවීම්	723,878,520	938,620,694
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**10,135,528,682**	**11,830,615,477**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**1,534,867,905**	**5,551,632,870**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
භිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	**-**	**-**
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	1,538,476,005	5,551,732,870
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**1,538,476,005**	**5,551,732,870**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(1,538,476,005)**	**(5,551,732,870)**

මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**(3,608,100)**	**(100,000)**
<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**-**	**-**
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**-**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	**-**	**-**
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	**(3,608,100)**	**(100,000)**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	**3,608,100**	**3,708,100**
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**-**	**3,608,100**

3.4. මූල්‍ය ප්‍රකාශ සටහන්

<u>වාර්තාකිරීමේ පදනම</u>

1. වාර්තාකරණ කාලපරිච්ඡේදය

2022 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2. මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3. ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසළකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4. දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5. දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6. මුදල් හා මුදල් සමාන දෑ

2022 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

* යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහිතව එම තොරතුරු මූල්‍ය ප්‍රකාශවල අදාල පරිදි ඇතුලත් කර ගත හැක. එසේම "වාර්තාකරණ පදනම" යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම ඇතුලත් කල හැක
* තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

3.5. ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු. ,000

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
	අදාළ නොවේ				

3.6. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු. ,000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
පුනරාවර්තන	3,243,000.00	3,595,500.00	3,553,971.49	99
ප්‍රාග්ධන	9,588,000.00	6,066,500.00	5,137,367.44	85

3.7. මු.රෙ. **208** ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. ,000

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණු	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
1	දිස්ත්‍රික් ලේකම්, අනුරාධපුර	• යාන් ඔය ජලාශ ව්‍යාපෘතිය යටතේ වූ කාර්යයන් ඉටු කිරීමට • පරිපාලන වියදම් දැරීම - ප්‍රා.ලේ (හොරොව්පොතාන , කැබිතිගොල්ලෑව , ගෝමරන්කඩවල)	5,092,123.99	5,092,123.99	5,090,138.99	

2	දිස්ත්‍රික් ලේකම්, ත්‍රිකුණාමලය	• යාන් ඔය ජලාශ ව්‍යාපෘතිය යටතේ වූ කාර්යයන් ඉටු කිරීමට • පරිපාලන වියදම් දැරීම - ප්‍රා.ලේ (හොරොව්පොතාන , කැබිතිගොල්ලෑව , ගෝමරන්කඩවල)	1,741,117.81	1,741,117.81	1,439,425.31	
3	දිස්ත්‍රික් ලේකම්, රත්නපුර	• ඇල්ලේ වැව ජලාශය දිකිරීම නිසා අවතැන් වූ පුද්ගලයින් වෙත විදුලිය ලබා දීම	367,410	367,410	367,410	
4	දිස්ත්‍රික් ලේකම්, මොනරාගල	• හදපානාගල හා උමා ඔය ඉදිකිරීම් කටයුතු හේතුවෙන් හානියට පත් පුද්ගලයින් වෙනුවෙන් වන්දි ගෙවීම	220,000	220,000	220,000	
5	දිස්ත්‍රික් ලේකම්, නුවර එළිය	• ගුරුගල් ඔය ජලාශ ව්‍යාපෘතිය සඳහා පුවත්පත් දැන්වීම් පල කිරීම	51,921	51,921	51,921	
6	දුම්රිය දෙපාර්තමේන්තුව	• දුම්රිය බලපත්‍ර වියදම් පියවීම	7,000,000	7,000,000	5,651,120	

3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු.'000

වත්කම් කේතය	කේත විස්තරය	2022.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	2022.12.31 දිනය මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි සහ ව්‍යුහයන්	2,422,767,204.52	2,422,767,204.52	ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධ අයිතිය තහවුරු කර ගැනීමේ ගැටළු හේතුවෙන් සහ ඇතැම් ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කරගැනීමේ ගැටළු හේතුවෙන් 100% වත්කම් ගිණුම්ගත කිරීමේ ගැටළු පවතී	
9152	යන්ත්‍රෝපකරණ	5,433,029,622.90	5,433,029,600.22	1	99%
9153	ඉඩම්	93,767,131,507.60	93,767,131,507.60	තවද මෙතෙක් තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති ගොඩනැගිලි 393 මෙතෙක් තක්සේරු කර අගයන් ලබානොදීම හේතුවෙන් ගිණුම්ගත කර නොමැත	
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරීගෙන යන වැඩ	169,302,443.88	169,302,443.88	-	100%
9180	බදු වත්කම්	-	-	-	-

3.9. විගණකාධිපතිවරයාගේ වාර්තාව

ඇමුණුම 1

පරිච්ඡේදය 04 - කාර්යසාධන දර්ශක

4.1. ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	90% - 100%	**75% - 89%**	**50% - 74%**
වාර්ෂික වගා කාර්යසාධනය	90%		
භෞතික ප්‍රගතිය	100%		
මුල්‍ය ප්‍රගතිය		85% (බැරකම් හැර)	

පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1. හඳුනාගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න

ඉලක්කය / අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබාගැනීමේ ප්‍රගතිය (%)		
			0 - 49	**50 - 74**	**75 - 100**
ජලාශවල ධාරිතාවය වැඩිකිරීම	ඝණ මීටර් මිලියන 1,000කින් 2030 වර්ෂයේදී	වැඩි වූ ධාරිතාවය	26%		
වගා තිව්‍රතාවය වැඩි කිරීම	වර්ෂ 2030 දී 1.8 දක්වා වැඩිකිරීම	වගා තිව්‍රතාවය			99%
වාරි ව්‍යාපාර යටතේ ඇති වපසරිය වැඩි කිරීම	වර්ෂ 2030 දී අක්කර 150,000 කින් වැඩි කිරීම	වගා කළ ඉඩම් ප්‍රමාණය	28%		
වාර්ෂික ගංවතුර හානිය අවම කිරීම	50%කින් අඩු කිරීම	වාර්ෂික ගංවතුර හානි			2022 වර්ෂයේදී ගංවතුර ඇති නොවිණි

5.2. තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග:

ජයග්‍රහණ

1. ජලාශවල ධාරිතාව 2018 සිට ඝන මීටර කියුබ් මිලියන 216.7 කින් වැඩි විය.
2. 2018 සිට දැනට පවතින වගා බිම් හා නව වගා බිම් හෙක්ටයාර 17,217ක් සඳහා වාරිමාර්ග පහසුකම් සැපයීමට හැකිවිය.
3. වාර්ෂික බෝග තිව්‍රතාව 1.78කි.
4. 2022 වර්ෂය තුළ කිසිදු ගංවතුර තත්ත්වයක් ඇති නොවිණි.

අභියෝග

- පාරිසරික, සමාජීය සහ මූල්‍ය ගැටලු හේතුවෙන් නව ජලාශ ඉදිකිරීම සඳහා සීමාවන් පවතී.
- පාරිසරික ගැටළු හේතුවෙන් නව ඉඩම් සඳහා වාරි පහසුකම් සැපයීම සීමා කර ඇත.
- කන්නයේ දී 90%ට වැඩි බෝග තීව්‍රතාවය පවත්වා ගැනීම සහ ගංවතුර ඇතිවීම කාලගුණික රටාවන් මත බෙහෙවින් රඳා පවතී.

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ

6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු/ (අතිරික්ත)
ජ්‍යෙෂ්ඨ	437	351	86
තෘතීයික	155	26	129
ද්විතියික	2724	2285	553
ප්‍රාථමික	3691	2725	966

6.2. ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න

දෙපාර්තමේන්තුවෙහි මානව සම්පත් හිඟයක් පවතින අතර එය ආයතනයෙහි කාර්ය සාධනය සඳහා සෘජුවම බලපානු ලබයි.

- දෙපාර්තමේන්තුවේ ඉලක්කගත ප්‍රගතිය ලඟා කර ගැනීමට නොහැකි වීම.
- රාජකාරී කටයුතු නියමිත දිනයන්ට ආවරණය කර ගැනීමේදී දුෂ්කරතාවයන්ට මුහුණපෑමට සිදුවීම.
- වැඩ බැලීමේ කටයුතු සංවිධානය කිරීම සහ රාජකාරි ආවරණය කිරීම සඳහා නිලධාරීන් පත්කිරීම සඳහා අමතර වියදම් දැරීමට සිදුවේ.
- පවත්නා මානව සම්පත් හිඟය හේතුවෙන් මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන් ඇතුළු කාර්යාල කාර්ය මණ්ඩලයට අමතර අතිකාල හා නිවාඩු දින වැටුප් මත සේවයේ යෙදවීමට සිදුවීම.

6.3. මානව සම්පත් සංවර්ධනය

විදේශීය පුහුණු වැඩසටහන්

අනු අංක	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (Rs'000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ ලබා ගත් දැනුම
				දේශීය	විදේශීය		
1	Master's Degree Program in Flood Disaster Risk Reduction, National Graduate Institute for Policy Studies (GRIPS) and the public Works Research Institute (PWRI), Japan	එක් ඉංජිනේරු වරයෙකු	වසර 01	-	JICA විසින් ප්‍රතිපාදන සපයයි.	විදේශීය පුහුණු - ජපානය	Master's Degree Program
2	Australian Awards Scholarships (AAS) – Intake for Academic Year 2022	එක් ප්‍රධාන ඉංජිනේරු වරයෙකු	වසර 02	-	ඕස්ට්‍රේලියානු රජය විසින් ප්‍රතිපාදන සපයයි.	විදේශීය පුහුණු - ඕස්ට්‍රේලියාව	Master's Degree Program
3	Training Program on Assessing Draught Risks using Earth Observation Dt & Launch South Asia Draught Management System (SDMS)	එක් ඉංජිනේරු වරයෙකු	දින 06	-	GIDM විසින් ප්‍රතිපාදන සපයයි.	විදේශීය පුහුණු - ඉන්දියාව	Training Program on Assessing Draught Risks
4	ITEC: Training Slots under the India Technical & Economic Co-operation (ITEC) Scholarship Schema of the Ministry of External Affairs, Government of India for the Year 2022-2023	එක් භූ සම්පත් ඉංජිනේරු වරයෙකු	දින 31	-	ITEC විසින් ප්‍රතිපාදන සපයයි.	විදේශීය පුහුණු - ඉන්දියාව	Training Program on Remote Sensing & Digital Image Processing for Geoscientists

5	Training Program on Computer Application on Agriculture Extension	එක් ඉංජිනේරු සහකාරවරයෙකු	දින 16	-	ITEC විසින් ප්‍රතිපාදන සපයයි.	විදේශීය පුහුණු - ඉන්දියාව	Training Program on Computer Application on Agriculture Extension
6	14th RIMES Council Meeting on 11-12 November 2022	වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් සහ අතිරේක වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්	දින 04	-	RIMES විසින් ප්‍රතිපාදන සපයයි.	විදේශීය පුහුණු - තායිලන්තය	14th RIMES Council Meeting

දේශීය පුහුණු පිළිබඳ තොරතුරු

අනු අංක	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (Rs'000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ ලබා ගත් දැනුම
				දේශීය	විදේශීය		
1	රාජ්‍ය ප්‍රසම්පාදන සහ කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව	එක් ඉංජිනේරු සහකාරවරයෙකු	මාස 14	120	-	SLIDA ආයතනය මගින් පැවැත්වූ දේශීය පුහුණුවකි	උසස් ජාතික ඩිප්ලෝමාව
2	ඩ්‍රෝන් (UVA) තාක්ෂණය භාවිතයෙන් ගුවන් ඡායාරූපකරණය	ඉංජිනේරුවරුන් තුන්දෙනෙකු	දින 03	150	-	පේරාදෙණිය විශ්වවිද්‍යාලය මගින් පැවැත්වූ දේශීය පුහුණුවකි	ගුවන් ඡායාරූපකරණය පිළිබඳ පුහුණුව
3	යුරෝ කේතය සඳහා වැඩමුළුව - 07	එක් ඉංජිනේරුවරයකු	එක් දිනක්	16	-	ශ්‍රී ලංකා භූ තාක්ෂණික සංගමය මගින් පැවැත්වූ දේශීය පුහුණුවකි	යුරෝ කේතය සඳහා වැඩමුළුව - 07
4	සාමාන්‍ය කාර්ය මණ්ඩලය සඳහා සේවාස්ථ පුහුණුව	කාර්යාල සේවකයින් 60 දෙනෙකු	දින 06	48	-	වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් පැවැත්වූ දේශීය පුහුණුවකි	සේවාස්ථ පුහුණුව

පශ්චාත් උපාධි පාඨමාලා

අනු අංකය	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (Rs'000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ ලබා ගත් දැනුම
				දේශීය	විදේශීය		
1	ජල සම්පත් ඉංජිනේරු සහ කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය	වාරිමාර්ග ඉංජිනේරුවන් 08 දෙනෙකු	වසර 2	2,800	-	දේශීය පුහුණු	ශාස්ත්‍රපති උපාධිය
2	භූ තාක්ෂණික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි වැඩසටහන	එක් වාරිමාර්ග ඉංජිනේරුවෙකු	වසර 2	250	-	දේශීය පුහුණු	පශ්චාත් උපාධිය

පැවැත් වූ විභාග

අනු අංකය	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (Rs'000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ ලබා ගත් දැනුම
				දේශීය	විදේශීය		
1	පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය	53 - වාරිමාර්ග ඉංජිනේරුවන්	1/12/2022	40	-	දේශීය (විභාගය)	දෙපාර්තමේන්තු නිලධාරීන්ට කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම සහ දෙපාර්තමේන්තුවට බඳවා ගැනීමේ විභාග පැවැත්වීම.
2	පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය	184 - තාක්ෂණ සහයකයන්	30/08/2022	122	-	දේශීය (විභාගය)	
3	පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය	4 - විද්‍යාත්මක සේවයේ නිලධාරීන්	1/12/2022	16.5	-	දේශීය (විභාගය)	
4	සිමීන බඳවා ගැනීමේ විභාගය	30 - සැළසුම් ශිල්පීන්	25/11/2022	35	-	දේශීය (විභාගය)	
5	දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය	56 - ඉංජිනේරු සහකාර	27/06/2022	56	-	දේශීය (විභාගය)	
6	පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය	32- ඉංජිනේරු සහකාර	6/9/2022	38	-	දේශීය (විභාගය)	

අනු අංකය	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (Rs'000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ ලබාගත් දැනුම
				දේශීය	විදේශීය		
7	ජ්‍යෙෂ්ඨ කාර්මික විභාගය (ප්‍රායෝගික)	90- ඉංජිනේරු සහකාර	6/6/2022 සිට 10/6/2022 දක්වා සහ 20/06/2022 සිට 24/06/2022 දක්වා	540	-	දේශීය (විභාගය)	
8	කනිෂ්ඨ කාර්මික විභාගය (ප්‍රායෝගික)	49 - ඉංජිනේරු සහකාර	21/02/2022 සිට 25/02/2022 දක්වා සහ 7/03/2022 සිට 11/03/2022 දක්වා සහ 6/06/2022 සිට 10/06/2022 දක්වා	343	-	දේශීය (විභාගය)	
9	ජ්‍යෙෂ්ඨ කාර්මික විභාගය (න්‍යායාත්මක)	342 - ඉංජිනේරු සහකාර	15,16,22,23/10/2022	2,208	-	දේශීය (විභාගය)	

*ආයතනයේ කාර්යසාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වන්නේ කෙසේද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න

නවීන තාක්ෂණය සමග දැනුම වැඩිදියුණු වීම පුහුණුවීම තුළින් ලැබේ. එමඟින් නිවැරදි තීරණ ගැනීමේ හැකියාව වැඩිදියුණුවේ. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අරමුණු කරා වඩා කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ළඟා වීමට එමඟින් හැකියාව ලැබේ.

පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
01	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම (වාණිජ අත්තිකාරම් ගිණුම)	-		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	-		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම	-		
1.6	වෙනත්	-		
02	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/ 2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙළ කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
04	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
05	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		

6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල නොවේ	නියමිත කාලය තුළ විමසුම් සඳහා පිළිතුරු ඉදිරිපත් නොවීම	දෙපාර්තමේන්තු විගණන කළමනාකරණ කමිටු රැස්වීම් වලදී නියමිත දිනට පිළිතුරු ඉදිරිපත් කරන ලෙස දැනුවත් කිරීම
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40 (4) උපවගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණක වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ		
8	**වත්කම් කළමනාකරණ කමිටු**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		

8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල නොවේ	කාර්යාල අතරින් 85% ක ප්‍රමාණයක් නියමිත දිනට යොමු කරනු ලැබේ.අනෙක් කාර්යාල මගින් යොමු කරන වාර්තා ප්‍රමාද වී කාර්යාලයට ලැබේ.	2023 ජනවාරි මස සිට මෙම වාර්තා ක්‍රමවත්ව ලැබිය යුතු ආකාරය පිළිබඳ නව ආකෘතියක් සමග වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මගින් කාර්යාලය වෙත උපදෙස් ලබා දී ඇත
9.2	වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම.	අනුකූල නොවේ	වාරිමාර්ග දෙපාර්තමේන්තුව තුල වාහන වල ඉන්දන දහනය වීම පරීක්ෂා කිරීම මේ දක්වා යාන්ත්‍රික ඉංජිනේරු වරයෙක් විසින් සිදුකල යුතුය.කලාපයන් තුල වාහන විශාල ප්‍රමාණයක් පවතින බැවින් එක් යාන්ත්‍රික ඉංජිනේරුවරයකු වෙත යොමු කර නැවත පරීක්ෂා කරවා අවශ්‍ය කටයුතු සිදුකිරීමක් නැතහොත් එම වාහනය අයිති කාර්යාලයේ ප්‍රධානියා විසින් ඉන්ධන පරීක්ෂාව සිදුකර සටහන් තැබීම මේ වසරේ සිට සිදුකල යුතු බවට දන්වා ඇත.	
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට	අනුකූල වේ		

	එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම			
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94 (1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එළඹීම	අනුකූල වේ		
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම**			
12.1	සීමාවන් වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම	අනුකූල වේ		

15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබාදීම**			
17.1	තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත්කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳව තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		

19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම.	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම.	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම.	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. : අයිඩබ්එම්/ඒ/අයිඩි/එෆ්ඒ/2022

ඔබේ අංකය / உமது இல. / Your No. :

දිනය / திகதி / Date : 2023 අගෝස්තු 31 දින

RECEIVED
12 SEP 2023
FINANCE BRANCH
IRRIGATION DEPARTMENT
HEAD OFFICE

ගණන්දීමේ නිලධාරී

වාරිමාර්ග දෙපාර්තමේන්තුව

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

යටෝක්ත වාර්තාව හා මූල්‍ය ප්‍රකාශනයේ භාෂාත්‍රයෙන් වූ මුල් පිටපත් මේ සමඟ එවා ඇත.

එම්.ඩී. සුදර්ෂණී අමරතුංග

ජ්‍යේෂ්ඨ සහකාර විගණකාධිපති

විගණකාධිපති වෙනුවට

පිටපත : ප්‍රධාන ගණන්දීමේ නිළධාරී, වාරිමාර්ග අමාත්‍යාංශය.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. අයිඩබ්එම්/ඒ/අයිඩී/එෆ්ඒ/2022

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2023 අගෝස්තු 31 දින

ගණන්දීමේ නිලධාරී
වාරිමාර්ග දෙපාර්තමේන්තුව

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්වාගණනය කළ මතය

ශීර්ෂය **282 - වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ** 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත **2022** දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව **වාරිමාර්ග** දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යතා කාලයේදී නිකුත් කරණු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට **වාරිමාර්ග** දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 **මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) විගණනය වෙත ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පහත සඳහන් විගණන නිරීක්ෂණ අනුව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමග අනුරූපී වී නොතිබුණි.

විගණන නිරීක්ෂණය	මෙම වාර්තාවේ ඡේදයට යොමුව
මූල්‍ය නොවන වත්කම්වල ආරම්භක ශේෂ සටහන් කිරීමේදී වත්කම් ගිණුම් 9 ක එකතු වටිනාකම රු.600,435,662 ක් අඩුවෙන් හා වත්කම් ගිණුම් 2 ක එකතු වටිනාකම රු.386,600 ක් වැඩියෙන් දක්වා තිබුණි.	1.6.1 මූල්‍ය නොවන වත්කම් (ආ)

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව	ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය	මෙම වාර්තාවේ ඡේද යොමුව
1.6.2.1 මූල්‍ය නොවන වත්කම් (අ)	වැව් ජලාශ ඇළවේලි ආදිය සඳහා දරන ලද ප්‍රාග්ධන ස්වභාවයේ වියදම් ගිණුම්ගත කිරීම සඳහා අවශ්‍ය උපදෙස් ලබාගෙන ඒ අනුව කටයුතු කළ යුතුය.	1.6.2 මූල්‍ය නොවන වත්කම් (අ)
1.6.2.1 මූල්‍ය නොවන වත්කම් (ඇ)	දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය.	1.6.2 මූල්‍ය නොවන වත්කම් (ඉ)

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ආදායම්

ගල්ගමුව පුහුණු අභ්‍යාස ආයතන විසින් 2020-2022 වර්ෂ තුළ පවත්වන ලද පුහුණු වැඩසටහන් 31 ක් වෙනුවෙන් ලැබී තිබුණු රු. 1,391,419 ක මුදලක් රාජ්‍ය ආදායමට බැර කිරීම වෙනුවට තෙවන පාර්ශවයන් වෙත නැවත ගෙවීම සඳහා තාවකාලිකව රඳවාගන්නා අංක 6000-0-0-13-0-36-0-0 දරන තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. මේ හේතුවෙන් ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

1.6.2 මූල්‍ය නොවන වත්කම්

(අ) මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් වත්කම් හා පිරිවැය කළමනාකරණය සඳහා රජයේ සියලු මූල්‍ය නොවන වත්කම් ලේඛනගත කිරීම සම්බන්ධව නිකුත් කළ 2017 ජුනි 28 දිනැති අංක එම්එෆ්/සිජී/02/(සිඅයිආර්.) දරන චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය නොවන වත්කම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුළ වැය විෂය අංක 2103 (යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ), 2104 (ගොඩනැගිලි සහ ඉදිකිරීම්), 2105 (ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම්) හා 2506 (යටිතල පහසුකම් සංවර්ධනය) යටතේ රු.3,924,893,334 ක් වැයකර තිබූ නමුත් 2022 වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් ලෙස රු.1,622,157,943 ක් පමණක් ගිණුම්ගත කර තිබුණි. ඒ අනුව 2022 වර්ෂය තුළ මූලධන වියදම් ලෙස වැයකර තිබූ රු.2,302,735,391කට අදාළ මූල්‍ය නොවන වත්කම් හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. මේ හේතුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ශුද්ධ වත්කම්/ ස්කන්ධය ද එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව 2022 ජනවාරි 01 දිනට මූල්‍ය නොවන වත්කම් ආරම්භක ශේෂය රු.98,669,997,608 ක් වුවද 2021 මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනට එම ශේෂය රු. 99,270,046,673 ක් විය. ඒ අනුව මූල්‍ය නොවන වත්කම්වල පෙර වර්ෂය අවසාන ශේෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය රු.600,049,065 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ වත්කම් සංකේත අංක 6141403 යටතේ ජලාශ සඳහා සිදුකළ යුතු රු. 645,032,909 ක වටිනාකම් එකතු කිරීම තහවුරු කළහැකි ලේඛන විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඈ) මූලධන වියදම් වැය විෂය අංක 2505, 2506 හා 2507 යටතේ ස්ථාවර වත්කම් වෙනුවෙන් වැයකරන ලද රු.2,461,081,361ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් ලෙස දැක්වීම වෙනුවට මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ පුද්ගල පඩි නඩි හා මෙහෙයුම් වියදම් ලෙස දක්වා තිබුණි.

(ඉ) පරිසර අමාත්‍යාංශය, ජලසම්පාදන අමාත්‍යාංශය, වාරිමාර්ග අමාත්‍යාංශය හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් ඒවායේ වැය ශීර්ෂවල ප්‍රතිපාදන යටතේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙනුවෙන් වැයකරන ලද රු. 2,030,061,729 ක මූලධන වියදම් නිශ්චිත ලෙස හඳුනාගෙන මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඊ) මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් වත්කම් හා පිරිවැය කළමනාකරණය සඳහා රජයේ සියලු මූල්‍ය නොවන වත්කම් ලේඛනගත කිරීම සම්බන්ධයෙන් නිකුත් කළ 2017 ජුනි 28 දිනැති අංක එම්එෆ්/සිජ/02/(සිඅයිආර්.) දරන චක්‍රලේඛය අනුව මූල්‍ය නොවන වත්කම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ සංකේත අංක 6141403 යටතේ වැව් ජලාශවල වටිනාකම ලෙස වාරිමාර්ග දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරවූ ව්‍යාපෘති 46 ක් වෙනුවෙන් දරන ලද රු. 73,242,085,249 ක් මුළු පිරිවැයම ගිණුම්ගත කර තිබුණු අතර එම වටිනාකම තුළ ඇතුළත් ගොඩනැගිලි, ප්‍රවාහන උපකරණ, වෙනත් යන්ත්‍ර හා උපකරණ සහ වෙනත් මූල්‍ය නොවන වත්කම් වෙන්ව හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.

(උ) මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ සංකේත අංක 61121 යටතේ ප්‍රවාහන උපකරණ රු. 4,379,010,064 ක හා සංකේත අංක 61122 යටතේ වෙනත් යන්ත්‍ර හා උපකරණ රු. 1,054,019,558 ක වටිනාකම් ගිණුම්ගත කර තිබුණද එම වටිනාකම තහවුරු කළහැකි ලේඛන විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ සංකේත අංක 6111 යටතේ ගොඩනැගිලි වටිනාකම රු.2,592,069,648ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. දෙපාර්තමේන්තුවේ වත්කම් කළමනාකරණ අංශය මඟින් ගොඩනැගිලි 2562 ක ලේඛනයක් සකස්කර තිබූ නමුත් එහි ගොඩනැගිලි වටිනාකම දක්වා නොතිබුණු අතර ඒ හේතුවෙන් එම වටිනාකමෙහි නිරවද්‍යතාවය තහවුරු නොවුණි.

(එ) දෙපාර්තමේන්තුවේ කලාප අධ්‍යක්ෂ කාර්යාලවල හා ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලවල ඉඩම් අක්කර 4,735 පර්චස් 123 ක් හා බණ්ඩාරවෙල, හාල්ල, තුවර, පොළොන්නරුව, මොනරාගල, හම්බන්තොට වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලවල පිහිටි ගොඩනැගිලි 392 ක් තක්සේරු කර ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඒ) වේලි ආරක්ෂණ ව්‍යාපෘතිය මඟින් ජලවිද්‍යා හා ආපදා කළමනාකරණ අංශය වෙත පවරා දී තිබුණු ස්වයංක්‍රිය ජල මාපක හා වැසි මාපක 106ක් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශයන්හි මූල්‍ය නොවන වත්කම් යටතේ දක්වා නොතිබුණි.

1.6.3 තැන්පතු ගිණුම් ශේෂ

(අ) අනුමත අයවැයට පරිබාහිරව ආදායම් රැස්කිරීම හා වියදම් දැරීම අනුමත නොකරන බැවින් විශේෂ අවස්ථාවකදී පාර්ලිමේන්තුවේ සම්මත කෙරෙන පනතකින් හැර වෙනත් කිසිදු ආකාරයක අරමුදල් ඇති කළ නොහැකි වුවද, වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් කුඩා ජලවිදුලි බලාගාර ඉදිකිරීම්, වැලි ඉවත් කිරීම් ඇතුළු වෙනත් ආර්ථික කටයුතු සඳහා බලපත්‍ර ලබා දීම හා විවිධ රාජ්‍ය ආයතන වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම වෙනුවෙන් රු.10,000ක් බැඟින් වූ ගාස්තුවක් අයකර, එය අංක 6000-0-0-13-0-36-0-0 දරන, තෙවන පාර්ශවයන් වෙත නැවත ගෙවීම සඳහා තාවකාලිකව රඳවාගන්නා තැන්පත් ගිණුමේ තැන්පත් කර, විධිමත් අධිකාරී බලයකින් තොරව වියදම් දරා තිබුණි. මෙම තැන්පත් ගිණුමේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 6,008,171 ක ශේෂයක් පැවති අතර මු.රෙ 569 ප්‍රකාරව සමාලෝචිත වර්ෂය තුළ අදාළ කාර්යයන් තුළින් එක්රැස් කළ ආදායම් හා දරන ලද වියදම් පිළිබඳ නිශ්චිතව හඳුනාගත හැකි පරිදි ගිණුම් තබා නොතිබුණි.

(ආ) තෙවන පාර්ශවයන් වෙත නැවත ගෙවීම් කිරීම වෙනුවෙන් අංක 6000-0-0-13-0-36-0-0 දරන තාවකාලිකව රඳවාගන්නා තැන්පතු ගිණුමේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.192,455,677 ක් වූ අතර, ඉන් ඇතැම් තැන්පතු අදාළ කාර්ය සඳහා යොදවා නොගෙන 2016 වර්ෂයේ සිට රඳවාගෙන තිබුණි. එසේ රඳවාගන්නා ලද තැන්පතු අතරින් 2022 දෙසැම්බර් 31 දිනට ශේෂය රු. 500,000 වඩා වැඩි වටිනාකම් සහිත තැන්පත් 48ක එකතුව රු.167,757,978 ක් විය. සමාලෝචිත වර්ෂය අවසාන දිනට වර්ෂ 02 ක කාලයක් ඉක්මවා තිබුණු තැන්පතු රු. 93,526,822 ක් විය.

1.6.4 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

ලේඛන වර්ගය	අදාළ රෙගුලාසිය	නිරීක්ෂණ
ක්ෂේත්‍ර බඩු සටහන් පොත	වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 11/1986 චක්‍රලේඛයේ 5 වන ඡේදය	වාරිමාර්ග 6 ආකෘතිය අනුව ක්ෂේත්‍ර ගබඩාවට ලැබුණු සියළුම ද්‍රව්‍ය ක්ෂේත්‍ර ගබඩාව භාර නිලධාරියා විසින් ක්ෂේත්‍ර තොග පොතට ඇතුළත් කළ යුතු වුවද ඉංජිනේරු සහකාරවරුන් වෙත ක්ෂේත්‍ර වැඩ සඳහා ලැබෙන ද්‍රව්‍ය පිළිබඳ වාර්තා කිරීම සඳහා ක්ෂේත්‍ර බඩු සටහන් පොත් පවත්වාගෙන ගොස් නොතිබුණි.
කම්කරු ලේඛණ	1976 අංක 02 දරන වාරිමාර්ග දෙපාර්තමේන්තු චක්‍රලේඛය.	දෙපාර්තමේන්තුවට අයත් එක් එක් ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල විසින් කම්කරුවන් සේවයේ යොදවා ගැනීමේදී කම්කරු ලේඛණ පවත්වාගෙන ගොස් නොතිබුණි.
වාහන ලේඛනය	මු.රෙ 1647(ඉ)	වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනයක් පවත්වා නොතිබුණි. වාරිමාර්ග දෙපාර්තමේන්තුව නමින්, වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් නමින්, හෝ දෙපාර්තමේන්තු ලිපිනය යටතේ ලියාපදිංචි වී තිබුණු වාහන 2004 ක් සඳහා ලියාපදිංචි කිරීමේ සහතිකපත් හා අදාළ ආදායම් බලපත්‍ර වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ප්‍රවාහන අංශය භාර නිලධාරියා විසින් පවත්වාගෙන ගොස් නොතිබුණි. තවද එම වාහන දැනට භාවිතාකරනු ලබන ස්ථානය හා භාරකාරිත්වය පැවරී ඇති නිලධාරියා සම්බන්ධ විස්තර යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1. අග්‍රිම කළමනාකරණය

සමාලෝචිත වර්ෂය තුළ දෙපාර්තමේන්තුව සැළසුම් කරන ලද කාර්යයන් ඉටුකිරීම සඳහා සැලසුම් කර තිබුණු මුළු අග්‍රිම අවශ්‍යතාවය රු.19,341,901,000 ක් විය. සමාලෝචිත වර්ෂයේ වියදම් සඳහා එම මුදල දෙපාර්තමේන්තුව විසින් භාණ්ඩාගාරයෙන් ඉල්ලා තිබුණු නමුත් ලැබී තිබුණු මුළු ප්‍රතිපාදනය රු.10,538,704,000 ක් එනම්, ඉල්ලුම් කරන ලද අග්‍රිමයෙන් සියයට 54.4 ක් පමණක් වීම නිසා රු. 8,803,197,000 ක ප්‍රතිපාදන උපයෝජනය කිරීමට නොහැකි වී තිබුණි.

2.2 වියදම් කළමනාකරණය

(අ) ඇස්තමේන්තු සකස් කිරීමේ දී අවශ්‍යතා හඳුනාගැනීමකින් තොරව මුදල් වෙන්කර ගැනීම, සැළසුම් කළ පරිදි වැඩ කටයුතු නොකිරීම යන හේතු නිසා සමාලෝචිත වර්ෂයේ රු. 940,000,000 ක් ප්‍රතිපාදන වෙන්කර තිබූ ව්‍යාපෘති වැය විෂයයන් 5කින් රු.283,000,000 ක් වෙනත් වැය විෂයන්ට මාරුකර තිබුණි. මේ අයුරින් සංවර්ධන වැඩසටහන් සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන සම්පූර්ණයෙන් උපයෝජනය කර නොගෙන 30% කට වැඩි ප්‍රමාණයක් වෙනත් වැය විෂයයන්ට මාරු කර තිබීම නිසා සැළසුම්ගත සංවර්ධන කාර්යන් ඉටු වී නොතිබුණි.

(ආ) අයවැය ලේඛනය මඟින් ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම්, යටිතල පහසුකම් සංවර්ධන වැය විෂයයන් යටතේ එක් එක් සංවර්ධන වැඩසටහන් සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා වෙනත් වැය විෂයයන් 3 ක් යටතේ වෙන්කර තිබූ ප්‍රතිපාදන වලින් රු.90,000,000 ක් මාරු කරගෙන තිබුණි.

2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

(අ) 2017 අප්‍රේල් 27 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 255/2017 හි 02(ඇ) ඡේදය ප්‍රකාරව මුදල් වර්ෂයට අදාළ ගෙවීම් එම මුදල් වර්ෂයේ දී නිදහස් කළ යුතු අතර, කිසිදු බැරකමක් ඊළඟ වර්ෂය තුළ නිරවුල් කිරීමේ අරමුණ ඇතිව ඉදිරියට ගෙන නොයා යුතු බවට ලබා දී තිබූ උපදෙස්වලට පටහැනිව 2022 දෙසැම්බර් 31 දිනට වැය ශීර්ෂ 5 කට අදාළව රු.129,908,705 ක බැරකම්වලට එළඹ තිබුණි.

(ආ) 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව බැඳීම් හා බැරකම් ලේඛනය පවත්වා නොතිබූ අතර බැරකම් පිළිබඳ තොරතුරු පමණක් ඉදිරිපත් කර බැඳීම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) යාන් ඔය ජලාශය ඉදි කිරීමේ ව්‍යාපෘතියට අදාළව පස් කියුබ් 1,355,907ක් හා වැලි කියුබ් 16,571ක් සඳහා රාජ්‍යභාග වශයෙන් රු.38,044,762 ක් හිඟව පවතින බව භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත 2018 අගෝස්තු මස දැනුම් දී තිබුණි. අදාළ හිඟ මුදල මූල්‍ය ප්‍රකාශනයන්හි බැරකමක් හෝ බැඳීමක් ලෙස දක්වා නොතිබුණි.

2.4. ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී විසින් දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීතාවය පිළිබඳව කලින් කළ සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වූ වත්, වාර්තාවේ 3.8 ඡේදය ප්‍රකාරව විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී නොතිබුණි.

2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීතිරීති යොමුව	රෙගුලාසිවලට අනුකූල නොවීම
(අ) වාරිමාර්ග (සංශෝධන) පනතේ 11 වැනි වගන්තිය	1983 අංක 23 දරන වාරිමාර්ග දඩ අරමුදලක් පවත්වාගෙන ගොස් නොතිබුණි.
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය.	

(i) XXIV වැනි පරිච්ඡේදයේ 4.4 සහ 4.5 වගන්ති		ණය ලබා ගත් නිලධාරීන් අතරින් මිය ගිය නිලධාරීන් 19 දෙනෙකුගෙන් අයවිය යුතු රු.2,266,323ක්, විශ්‍රාම ගොස් තිබූ සේවකයන් 92 දෙනෙකුගෙන් අයවිය යුතු රු.9,412,408 ක් සහ වැඩ තහනමට ලක් වූ නිලධාරීන්ගෙන්, සේවය හැර ගිය නිලධාරීන්ගෙන් හා සේවය අත්හිට වූ නිලධාරීන් 36 දෙනෙකුගේ අය විය යුතු රු.3,693,751 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. මෙම ශේෂයන් තුළ වර්ෂ තුනකට වඩා පැරණි රු. 2,846,837 ණය ශේෂයක් හා අවුරුදු පහකට වැඩි රු.1,705,310 ක ණය ශේෂයක් විය.
(ii) XIX වැනි පරිච්ඡේදයේ 5.2.1 හා 5.3.1 වගන්ති		දෙපාර්තමේන්තුවට අයත් කලාප 14 ක පිහිටි නිල නිවාසවල පදිංචි නිලධාරීන්ගෙන් හා සේවකයින්ගෙන් ආයතන සංග්‍රහය ප්‍රකාරව නිල නිවාස කුලී අයකර ගෙන නොතිබුණි.
(ඇ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය.	
	(i) මු.රෙ 104-109	1979 සිට 2012 අතර කාලයේ සිදුවී තිබුණු රු. 18,191,201 ක හානි හා පාඩු 30 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
	(ii) මු.රෙ 756	ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල වල මෙහෙයුම් හා නඩත්තු වැඩ සහ ඉදිකිරීම් කර්මාන්ත සඳහා නිකුත්කර ඉංජිනේරු සහකාරවරුන් භාරයේ ඇති ද්‍රව්‍ය වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයට භාජනය කර නොතිබුණි.
(ඇ)	2017 ජුනි 26 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය	දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යන මූල්‍ය නොවන වත්කම් පිළිබඳ තොරතුරු පද්ධතිය නිවැරදි ලෙස හා යාවත්කාලීනව නඩත්තු කර නොතිබුණි.
(ඉ)	2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන අයවැය චක්‍රලේඛය	වෙනත් දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශ වෙත ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ මාස 02 ක් ඇතුළත පියවා ගෙන නොමැති නම් තුන්වන මාසය තුළදී අදාළ ස්ථාන මාරුව සිදු කළ දෙපාර්තමේන්තුවේ මාසික ගිණුම් සාරාංශය මඟින් අය කර

		ගැනීමට කටයුතු කළ යුතු වුවත් ඒ අනුව කටයුතු නොකිරීම හේතුවෙන් රු537,530 ක හිඟ ණය ශේෂයක් අය කර ගත යුතුව පැවතුණි.
(ඊ)	1982 අංක 23 දරන වාරිමාර්ග දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ (අ) ඡේදය	දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාරවරුන් විසින් මාසික ද්‍රව්‍ය වාර්තා ඊළඟ මාසයේ වැඩකරන දින 5 ක් ඇතුළත ඉදිරිපත් කර නොතිබුණි.

2.6 අවධිමත් ගනුදෙනු

(අ) බස්නාගොඩ ජලාශය ඉදිකිරීම

i. ගම්පහ, අත්තනගල්ල හා මිනුවන්ගොඩ ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සභාපතිවරයා සහ China Machinery Engineering Corporation සමාගමේ සභාපතිවරයා අතර 2013 මැයි 15 වන දින එළඹ තිබූ කොන්ත්‍රාත් ගිවිසුම අනුව ඇ.ඩො. මිලියන 229.5 ක වටිනාකමකින් යුත් උක්ත ව්‍යාපෘතිය 2014 – 2017 කාලපරිච්ඡේදයේ අවසන් කිරීමට නියමිතව තිබුණි. කොන්ත්‍රාත් ගිවිසුම අනුව රු.බිලියන 7.3644 ක් අතිරේක වැඩ සඳහා ප්‍රතිපාදනය කර තිබුණි. ඒ යටතේ ව්‍යාපෘතියේ ප්‍රධාන ජල මූලාශ්‍රය වන බස්නාගොඩ ජලාශය රු. 2,347,406,831 ක උප කොන්ත්‍රාත්තුවක් යටතේ ඉදිකිරීම සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුව සමඟ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, 2016 මාර්තු 21 හා 2019 ජුනි 12 දිනවල අවබෝධතා ගිවිසුම්වලට එළඹ තිබුණි. එසේ වුවද ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

ii. වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් බස්නාගොඩ ජලාශය ඉදිකිරීමේ කාර්යය සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ ප්‍රසම්පාදන කමිටු (CAPC) නිර්දේශ ප්‍රකාරව ජාත්‍යන්තර තරඟකාරී ලංසු කැඳවීම මඟින් කොන්ත්‍රාත්කරුවකු තෝරා ගෙන කොන්ත්‍රාත්තුව ස්ථාවර මිලක් මත ප්‍රදානය කර තිබුණි. ඒ අනුව චීනයේ සිනෝහයිඩ්‍රෝ සමාගම (Sinohydro Corporation Limited) මඟින් රු.2,394,354,968 කට එනම් කොන්ත්‍රාත්තුව ලබාගත් මිලට වඩා රු. 46,948,137ක් වැඩි මිලට කාර්යය ඉටුකරවා ගැනීම සඳහා 2019 ජුනි 13 දින ගිවිසුම් ගත වී තිබුණි.

iii. මෙම ප්‍රසම්පාදන කාර්ය සඳහා පත්කර තිබූ තාක්ෂණික ඇගයීම් කමිටුව (TEC) අවම මිල ගණන් ඉදිරිපත් කර තිබූ කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කළ රු.මිලියන 2,093 ක ලංසුව රු. මිලියන 2,347ක් ලෙස නිවැරදි විය යුතු බවට ගණනය කර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2.6.1(v)ට පටහැනිව කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කළ මිලට වඩා රු. 254,062,080 ක් වැඩි වටිනාකමකට කොන්ත්‍රාත්තුව පැවරීමට නිර්දේශ කර තිබුණි. එහිදි කොන්ත්‍රාත්කරු

විසින් ඉදිරිපත් කල මිල ගණන් තුළ ස්ථාපනය කිරීම, ගොඩනැගීම සහ වෙනත් සේවාවන් (Installation/ Construction and other Services) යටතේ උක්ත වැඩිපුර එකතු කළ මිල දක්වා තිබුණද ඒ පිළිබඳ නොසලකා තාක්ෂණික ඇගයීම් කමිටුව කොන්ත්‍රාත්කරු ඉදිරිපත් කල වටිනාකමට රු. 254,062,080 ක් නැවතත් එකතු කිරීම තුළින් සාවද්‍ය ගණනය කිරීමක් සිදුකර තිබුණි. අනතුරුව රු. 254,062,080 ක් වැඩි වටිනාකමකට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට 2019 පෙබරවාරි 13 දින ඉදිරිපත් කළ අංක Ir/63/2019 දරන අමාත්‍ය මණ්ඩලය සංදේශය මඟින් අනුමැතිය ලබාගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් වගකිවයුතු තාක්ෂණ ඇගයීම් කමිටුවට එරෙහිව විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි.

iv. වාරිමාර්ග දෙපාර්තමේන්තුව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සමඟ 2019 ජුනි 12 දින දෙවන අවබෝධතා ගිවිසුමට එළඹෙන විටත් ප්‍රධාන කොන්ත්‍රාත් ගිවිසුමේ කාලය අවසන් වී තිබුණි. අවබෝධතා ගිවිසුම අනුව කොන්ත්‍රාත්තුව මාස 18 ක කාලයක් තුළ අවසන් කළ යුතු අතර විගණිත දින වූ 2023 මැයි 31 දක්වා අවසන් කර නොතිබුණි. එහිදි උප කොන්ත්‍රාත්කරුගේ ප්‍රමාදයන් නිසා දැරීමට සිදුවන අමතර පිරිවැය හේතුවෙන් ප්‍රධාන කොන්ත්‍රාත්කරුගේ කාර්යයන්ට සිදුවන අහිතකර බලපෑම සම්බන්ධයෙන් වන කිසිදු වගකීමක් ප්‍රධාන කොන්ත්‍රාත්කරුට පැවරී නොතිබුණි. එම ප්‍රමාදයන් සඳහා කාල දීර්ඝ කිරීම් ලබා ගැනීමට හා ඒ සඳහා වන අතිරේක පිරිවැය ලබාගැනීමට ප්‍රධාන කොන්ත්‍රාත්කරුට හිමිකමක් ලැබී තිබුණද දෙපාර්තමේන්තුව විසින් උපකොන්ත්‍රාත් භාරගැනීම සඳහා අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීමේදී ඒ පිළිබඳව කිසිදු අවධානයක් යොමුකර නොතිබීමෙන් එම වගකීම් උප කොන්ත්‍රාත්කරුට පැවරී තිබුණි.

v. දෙපාර්තමේන්තුව සමඟ වූ කොන්ත්‍රාත් ගිවිසුමේහි 14.4 උප වගන්තිය ප්‍රකාරව කොන්ත්‍රාත්තුව සඳහා පළමු අතුරු ගෙවීම් සඳහා භෞතික කාර්යසාධනය සියයට 25 සම්පූර්ණ කළ යුතු වුවත් ඒ පිළිබඳ නොසලකා භෞතික කාර්යසාධනය සියයට 1.52 සම්පූර්ණ වූ අවස්ථාවේ සිට අතුරු ගෙවීම් ආරම්භ කර තිබුණි. ඒ අනුව 2022 ඔක්තෝබර් 31 දින වන විට ව්‍යාපෘතියේ භෞතික කාර්යසාධනය සියයට 17.09 ක් වූ අතර 2020 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා වූ කාල සීමාව තුළ අතුරු ගෙවීම් (Interim Payments) 11 ක් යටතේ රු.401,165,861 ක් එනම් කොන්ත්‍රාත් වටිනාකමෙන් සියයට 36 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි.

vi. කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව ව්‍යාපෘති කළමනාකරණ කටයුතු සඳහා ස්ථිර ගොඩනැගිලි ඉදිකිරීමට රු. 32,641,534 ක් වෙන්කර තිබූ නමුත් විධිමත් අධිකාරී බලයකින් තොරව එම සැලසුම සංශෝධනය කර මෙම අදාළ මුදල කාර්යාලීය උපයෝගීතාවයන් හා කාර්යාලය සඳහා නිවාස කුලියට ගැනීම වෙනුවෙන් භාවිතා කර තිබුණි.

vii. කොන්ත්‍රාත් ගිවිසුම මඟින් ව්‍යාපෘති කළමණාකරණ කටයුතු සඳහා වෙන්කළ සමස්ථ ප්‍රතිපාදනය රු.114,823,880 ක් සහ අවබෝධතා ගිවිසුම (MOU) ප්‍රකාරව ව්‍යාපෘතියේ කළමනාකරණ කටයුතු සඳහා වෙන් කළ ප්‍රතිපාදනයෙන් රු. 119,817,787 ක් ලෙස සමස්ථය රු.234,641,667 ක මුදලක් එනම් කළ වැඩකොටස්වල වටිනාකම වූ රු. 401,165,861 හා සැසඳීමේදි එම වටිනාකමින් සියයට 58 ක් පරිපාලන වියදම් සඳහා දරා තිබුණි.

(ආ) කම්කරු තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනමට සේවකයින් ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල මට්ටමින් බඳවාගෙන තිබූ අතර එම සේවකයින්ට ගෙවීම් කිරීමේදී, මාස 03 ක කාලයක් සඳහා වලංගු වන පරිදි අත්සන් කර තිබුණු ගිවිසුම් වල අනුකූලතාවය, නිත්‍යානුකූලතාවය හා වලංගුභාවය පිළිබඳව තහවුරු කර ගත නොහැකි වීම, ඇතැම් ගිවිසුම්වල සේවයේ නිරතවිය යුතු දින ගණන වෙනුවට ඉටුකළ යුතු සේවය පිළිබඳව පමණක් සඳහන් කර තිබීම, සේවයට පැමිණි දිනය, වේලාව, අත්සන ඇතුළත් පැමිණීමේ ලේඛන පවත්වාගෙන ගොස් නොතිබීම හා අදාළ දිනවල සේවයට වාර්තා කල බවට තහවුරු ලේඛන වවුචර්වලට අමුණා නොතිබීම, ඉංජිනේරු සහකාරවරුන්ගේ මිනුම් පොතෙහි දැක්වෙන මිනුම් මත පදනම්ව ගෙවීම් අනුමත කිරීම හේතුවෙන් දෛනික වැටුප් ගෙවීමේදී සේවය කළ දින ගණන පිළිබඳ තහවුරුවකින් තොරව ගෙවීම් කර තිබීම, ගෙවීම් ලේඛන වලට අත්සන් කර තිබුණු නමුත් එහිදි අනන්‍යතාවය තහවුරු කරගෙන නොතිබීම යන ගැටළු පැනනැඟී තිබුණි.

(ඇ) විවිධ ව්‍යාපෘතින් යටතේ වැව්/ ජලාශ ඉදිකිරීම හා ප්‍රතිසංකරණය සඳහා ක්ෂේත්‍රයට සෘජුවම ලැබෙන ද්‍රව්‍ය නිවැරදිව ලැබී ඇති බවට තහවුරු කිරීමෙන් තොරව භාණ්ඩ ලැබීම් තුණ්ඩු නිකුත් කරනු ලැබේ.

2.7 බැංකු ගිණුම් මෙහෙයවීම

(අ) 2016 වර්ෂයේ අවසන් වූ දැදුරු ඔය ව්‍යාපෘතිය සඳහා ලංකා බැංකුව වාරියපොළ ශාඛාවේ 2008 මාර්තු 03 දින ආරම්භ කර තිබූ අංක 7042466 දරණ ජංගම ගිණුම ව්‍යාපෘතියේ කටයුතු අවසන් වීමෙන් පසු විධිමත්ව වසා දැමීමට කටයුතු නොකර වාරියපොළ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයේ ගනුදෙනු සඳහා මේ දක්වා පවත්වාගෙනයමින් පැවතුණි. එහිදි මු.රෙ 381(1) අනුව මහා භාණ්ඩාගාරයේ අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

(ආ) කුඹුක්කන් ඔය ව්‍යාපෘතියේ වියදම් සඳහා ලංකා බැංකුව මොනරාගල ශාඛාවේ ආරම්භ කර තිබූ අංක 7042728 දරන ජංගම ගිණුමේ පවතින රු. 4,332,668 ක ශේෂය, 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කරන ලද බැංකු ගිණුම් පිළිබඳ ඇමුණුම-viii ආකෘතියේ ඇතුළත්කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1. කාර්යසාධනය

3.1.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

(අ) සියඹලන්ගමුව ඔයේ සිට මහ ගල්ගමුව වැව දක්වා පෝෂිත ඇල ඉදිකිරීමේ ව්‍යාපෘතිය

(i) වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යවරයා විසින් 2011 සැප්තැම්බර් 11 දින ඉදිරිපත්කර තිබූ "වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කිරීමට යෝජිත මහා/මධ්‍ය පරිමාණ වාරිමාර්ග ව්‍යාපෘති පිළිබඳ දස අවුරුදු සැලැස්ම" යන මැයෙන් වූ අංක 11/1858/508/034 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2011 සැප්තැම්බර් 28 දින ලද අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත උක්ත ව්‍යාපෘතිය 2012-2014 කාල සීමාව තුළ නිම කිරීමට අපේක්ෂා කර ආරම්භ කර තිබූ අතර වසර 9 ක් ගතවී තිබුණද මේ දක්වා නිමකර නොතිබුණි.

(ii) ව්‍යාපෘතිය සඳහා පාරිසරික අධ්‍යයන වාර්ථාවක් සකස්කර අනුමැතිය ලබාගෙන නොතිබූ අතර මු.රෙ 35 (4) සහ 36 අනුව ප්‍රථමික අනුමැතිය හා අවසාන අනුමැතිය ලබාගැනීමකින් තොරව ක්‍රියාත්මක කර තිබුණි. තවද වාරි ජලය සැපයීමට අවශ්‍ය ඉඩම් විගණිත දින තෙක් හදුනාගෙනද නොතිබුණි.

(iii) මෙම ව්‍යාපෘතිය සඳහා මු.රෙ 20 අනුව මුළු පිරිවැය ඇස්තමේන්තුවක් අනුමත කර නොතිබූ අතර කුරුණෑගල වාරිමාර්ග අධ්‍යක්ෂ විසින් වරින් වර ඇස්තමේන්තු අනුමත කරමින් සැලසුමකින් තොරව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. මේ හේතුවෙන් කිලෝමීටර් 14 ක් දිගට තැනින් තැන කැනීම් සිදුකර තිබූ නමුත් ඇලමාර්ග නිසිපරිදි සකස්කර නොතිබීම හේතුවෙන් එම ස්ථානයන්හී ජලය එක්රැස් වීම තුළ රෝග ඇතිවීම, ගමනාගමනයට බාධා පැමිණිම, මිනිසුන් හා වනසතුන්ගේ ආරක්ෂාවට තර්ජනයක් ඇතිවීම ආදි පාරිසරික හා සාමාජීය ප්‍රශ්න රාශියක් නිර්මාණය වී තිබුණි.

(iv) මෙම ව්‍යාපෘතිය සඳහා වෙන් කළ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 375 ක් හෙවත් සියයට 75 ක් වැයකර තිබූ නමුත් හතරවන කිලෝමීටරය තුළ පවතින සිනුත් වැව දක්වා ජලය රැගෙන යා හැකි පරිදි නිමකර නොතිබුණි.

(v) දෙවන කිලොමීටරය හා තුන්වන කිලෝමීටරය අතර ගල් ඉවත් කිරීම සඳහා රු. මිලියන 6.7 ක ඇස්තමේන්තුවක් 2020 දෙසැම්බර් මස අනුඥාත කර තිබූ අතර ඒ යටතේ සෘජු ශ්‍රම ක්‍රමය යටතේ ඇළමාර්ගයේ පිහිටි කළුගල් කියුබ් 3,276.25 ක් ඉවත් කළ බවට වැඩ

සහතික කර තිබූ නමුත් ගල් ඉවත්කර නොමැති ස්ථානයන්හිද ගල් ඉවත්කල බවට සාවද්‍ය ලෙස මිනුම් ඉදිරිපත් කර ශ්‍රමය, යන්ත්‍ර හා ද්‍රව්‍ය සඳහා ගෙවීම් කර තිබුණි. එසේ තිබියදී ඉටුකරන ලද වැඩ කොටස් පිළිබඳ නිශ්චිත සහතික කිරීමකින් තොරව 2+400 සිට 2+875 දක්වා වූ කොටසේ ගල් ඉවත් කිරීම සඳහා නැවත රු.20,236,000 ක ඇස්තමේන්තුවක් අනුඥාත කර තිබුණි.

(vi) සියඹලන්ගමුව ඔයේ සිට මහගල්ගමුව වැව දක්වා ජලය ලබාගැනීමේ ව්‍යාපෘතියට අදාළව 2022 දෙසැම්බර් 31 වන විට ඉඩම් පවරා ගැනීම හා වන්දි ගෙවීමද ඇතුළුව තවදුරටත් නිම කළ යුතු කටයුතු 7 ක් පැවතියද සමාලෝචිත වර්ෂය තුළදී රු.8,000,000 ක් වූ ප්‍රතිපාදන පමණක් ඒ සඳහා වෙන් කර තිබුණි.

(ආ) මුතුකණ්ඩිය ජලාශයේ වැලි රොන්මඩ හා දියලු පස් ඉවත් කිරීමේ ව්‍යාපෘතිය

මුතුකණ්ඩිය ජලාශයේ වැලි හා රොන්මඩ තැන්පත්ව ඇති බවත් එම වැලි හා රොන්මඩ ඉවත්කර වැවේ ජල ධාරිතාවය ඉහළ නංවන ලෙස කෘෂිකර්ම, වාරිමාර්ග හා ග්‍රාමීය ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යවරයාගෙන් මුතුකණ්ඩිය ඒකාබද්ධ ගොවි සංවිධානය හා රණමයුර ගොවි සංවිධානය ඉල්ලීම් කර තිබුණි. අදාළ ඉල්ලීම් වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත යොමුකර තිබූ අතර වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් විසින් මියෙල්ලා ඔය හා කිවුල් ආර ප්‍රදේශයේ වැලි, රොන්මඩ හා දියලු පස් මීටර් කියුබ් 133,400 ක් ඉවත් කිරීම සඳහා කොන්දේසි 32 කින් යුතුව මුතුකණ්ඩිය ඒකාබද්ධ ගොවි සංවිධානය වෙත අංක ENV/575(Uva ii) දරන අනුමත ලිපිය මඟින් 2019 පෙබරවාරි 21 දින ලබාදීමට හා අමින් ආර ඔයෙහි වැලි රොන්මඩ හා දියලු පස් ඉවත් කිරීම සඳහා කොන්දේසි 40 කින් යුතුව රණමයුර ගොවි සංවිධානය වෙත අංක DI/MO/W03/05/01/2021 දරන ලිපිය මඟින් 2021 ඔක්තෝබර් 12 දින ලබාදීමට අනුමැතිය ලබාදී තිබුණි.

(i) මුතුකණ්ඩිය ඒකාබද්ධ ගොවි සංවිධානය වෙත කොන්ත්‍රාත්තුව පිරිනැමීමේ ලිපියේ කොන්දේසි ප්‍රකාරව රු.1,000,000 ක නැවත ගෙවනු ලබන තැන්පතුවක් ලබාදී නොතිබූ අතර උප කොන්ත්‍රාත්කරු වූ ස්වර්ණදේවි එන්ටර්ප්‍රයිසස් ආයතනය විසින් එම වටිනාකම වෙනුවෙන් 2021 මාර්තු 4 දින සිට වසරක කාලයක් වෙනුවෙන් ඉදිරිපත් කර තිබුණු බැදුම්කර ලිපිය දෙපාර්තමේන්තුව භාරගෙන තිබුණි. අදාළ ලිපියේ කොන්දේසි අනුව අධීක්ෂණ ගාස්තු ලෙස මාසිකව අයවිය යුතු රු. 50,000 ක් බැගින් මාස 15 ක කාලය වෙනුවෙන් දෙපාර්තමේන්තුව වෙත අයවිය යුතුව පැවති රු.750,000 ක් අය කරගෙන නොතිබුණි.

(ii) රණමයුර ගොවි සංවිධානය වෙත කොන්ත්‍රාත්තුව පිරිනැමීමේ ලිපිය අනුව අයවිය යුතු රු.1,000,000 ක නැවත ගෙවනු ලබන තැන්පතුව ලබාදී නොතිබුණද වැවේ රොන්මඩ ඉවත් කිරීමට අවසර ලබාදී තිබුණි. පැවරුම් ලිපිය අනුව භාරන ලද රොන්මඩ සහ අපද්‍රව්‍ය සතියක කාලසීමාවක් තුළ වැවෙන් පිටතට ගෙනයා යුතු වුවද භාරන ලද දියලුපස් කියුබ් 1,500 ක් පමණ තවදුරටත් වැව තුළ ගොඩ ගසා තිබුණි.

(iii) අදාළ ගොවි සංවිධාන 2 ක විසින් ජලාශයේ රොන්මඩ ඉවත්කර ජලාශයේ ජල ධාරිතාවය ඉහළ නැංවීමට කටයුතු කරන ලෙස ඉල්ලා තිබුණද වැලි හා රොන්මඩ ඉවත් කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් අවසර ලබාදුන් ස්ථානවල කැණීම් සිදුකර ජලාශයේ ජල ධාරිතාවය ඉහළ නැංවීමට කටයුතු කර නොතිබුණු අතර ජලාශයේ ආර කොටසේ වැලි හා පස් කැණීම් සිදු කර තිබුණි.

(iv) අදාළ ගොවි සංවිධාන 2ක සඳහා අධ්‍යක්ෂ ජනරාල් විසින් ලබාදුන් එකඟතාවය ඇතුළත් ලිපිවල කොන්දේසි ප්‍රකාරව, අදාළ කාර්ය අධීක්ෂණයට වාරිමාර්ග දෙපාර්තමේන්තු නිලධාරියෙකු යෙදවීම වෙනුවෙන් අධීක්ෂණ හා පරිපාලන ගාස්තු ලෙස දිනකට රු. 2,000 ක මුදලක් ව්‍යාපෘති යෝජක විසින් ගෙවිය යුතු වේ. එසේ අයවිය යුතු අධීක්ෂණ හා පරිපාලන ගාස්තු රු.718,000 ක් දෙපාර්තමේන්තුවට අයකරගෙන නොතිබුණි.

3.1.2 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම

(අ) යාන්ඔය ජලාශ ව්‍යාපෘතිය

යාන්ඔය ජලාශ ව්‍යාපෘතිය යටතේ ප්‍රධාන වැව් බැම්ම ඉදිකිරීම, සැදලි බැමි 04 ක් ඉදිකිරීම, වම් ඉවුරු ඇළ කි.මී. 18 ක් දිගින් යුතුව ඉදිකිරීම හා දකුණු ඉවුරු ඇළ කි.මී.12 ක් දිගින් යුතුව ඉදිකිරීමට යෝජිතව පැවතුණි. ඒ යටතේ වූ වම් ඉවුරු ඇළ හැර අනෙකුත් කාර්යයන් ඉටු කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත, සෘජු කොන්ත්‍රාත්තුවක් ලෙස China CAMC Engineering Co. Ltd (CAMCE) සමාගම සමඟ ඇ.ඩො. මිලියන 176 ක වටිනාකමකින් යුත් ගිවිසුමක් 2011 නොවැම්බර් 03 දින අත්සන් තබා තිබුණි. එම කොන්ත්‍රාත් ගිවිසුමේ විෂය පථය ප්‍රධාන බැම්ම හා සැදලි බැමි 04 ඉදිකිරීමට පමණක් සීමා වන පරිදි හා කොන්ත්‍රාත් වටිනාකම ඇ.ඩො. මිලියන 150 ක් වන පරිදි 2013 අගෝස්තු 16 දින සංශෝධනය කර තිබුණි. වම් ඉවුර ඇළ ඉදිකිරීම සඳහා ඇ.ඩො.මිලියන 39.5 ක ගිවිසුමක් 2017 දෙසැම්බර් 12 දින අදාළ කොන්ත්‍රාත්කරු සමඟම අත්සන් කර තිබුණි. දකුණු ඉවුර ඇළ වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ දේශීය කොන්ත්‍රාත්කරුවන් මඟින් ඉදිකිරීමට සැළසුම් කර තිබුණි.

මූලික ගිවිසුම අනුව වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය හරහා චීන ණය සපයන ආයතනයකින් කොන්ත්‍රාත් මුදලින් සියයට 85 ක ප්‍රමාණයක් ණය මුදල් වශයෙන් ද කොන්ත්‍රාත් මුදලින් සියයට 15 ක ප්‍රමාණයක්

ශ්‍රී ලංකා රජය විසින් ද දැරීමට එකඟ වී තිබුණ අතර ණය මුදල ලබා ගැනීම සම්බන්ධව චීන බැංකුව සමඟ පැවැත්වූ සම්මුති සාකච්ඡා අසාර්ථක වීම හේතුවෙන් වසර 3 ක් තුළ මෙම ව්‍යාපෘතිය දේශීය අරමුදල් මඟින් ක්‍රියාත්මක කර නිම කිරීමට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය මත 2013 වර්ෂයේ දී මූලික ගිවිසුම සංශෝධනය කර තිබුණි. පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(i) චීන රජයෙන් ලබාදෙන ණය අපේක්ෂාවෙන් තරඟකාරී මිල ගණන් කැඳවීමකින් තොරව සෘජු ක්‍රමය යටතේ චීන කොන්ත්‍රාත්කරුවකු තෝරා ගැනීම තුළ තරඟකාරී මිල කැඳවීම් තුළින් ලබා ගත හැකිව තිබූ වාසි ලැබී නොතිබුණි.

(ii) විදේශ ණය අපේක්ෂාවෙන් EPC කොන්ත්‍රාත් ගිවිසුමක් ලෙස ඇමරිකානු ඩොලර් මඟින් ගෙවීම් කිරීමේ කොන්දේසි ඇතුළත් කර තිබූ අතර විදේශ අරමුදල් ලැබී නොතිබුණද ගිවිසුම් කොන්දේසි වෙනස් නොකිරීම හේතුවෙන් රටෙහි විදේශ සංචිතවලට අහිතකර ලෙස බලපා තිබුණි.

(iii) මූලික සැලසුම් අනුව ව්‍යාපෘතිය 2017 වර්ෂයේදී නිම කළ යුතුව පැවතියද අමාත්‍ය මණ්ඩල අනුමැතියෙන් කාල සීමාව 2022 දෙසැම්බර් දක්වා දීර්ඝ කර තිබූ අතර පිරිවැය ඇස්තමේන්තුවද රු.මිලියන 36,855 සිට රු.මිලියන 48,553 දක්වා වැඩි කර තිබුණි.

(iv) 2021 ජූලි 5 දිනැති අංක අමප/21/1123/317/035 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ව්‍යාපෘතියේ කටයුතු 2022 දෙසැම්බර් 31 දිනට නිම කළ යුතුව පැවති නමුත් ව්‍යාපෘතිය නිම කිරීමට අදාළ තවදුරටත් ඉටු කළ යුතු කාර්යයන් පිළිබඳ වාර්තාව, ව්‍යාපෘතිය අවසන් කිරීමේ ගිණුම, ව්‍යාපෘතියේ වත්කම් පවරා දීම නිසි පරිදි සිදු වී ඇති බව තහවුරු කිරීමට අදාළ ලේඛණ හා EPC කොන්ත්‍රාත් ගිවිසුම් 2 ට අදාළව අනාගතයේදී පැන නැඟිය හැකි ආරවුල් බේරුම්කරණය හා වෙනත් නෛතික කාර්යයකදී සේවායෝජක අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා අවශ්‍ය වන ලේඛන සකස් කර නොතිබියදී වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ව්‍යාපෘතිය භාරගෙන තිබුණි.

(v) ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ හඳුනාගත් ප්‍රදේශ සඳහා පානීය ජලය හා කෘෂිකාර්මික ඉඩම් හෙක්ටයාර් 2,287 ක් වගා කිරීමට අවශ්‍ය ජලය ලබාදීම, අනුරාධපුර දිස්ත්‍රික්කයේ හඳුනාගත් ප්‍රදේශ සඳහා පානීය ජලය හා කෘෂිකාර්මික ඉඩම් හෙක්ටයාර 5,360 ක් සඳහා ජලය ලබාදීම, වාහල්කඩ, පදවිය, ගෝමරන්කඩවල යන කෘෂිකාර්මික ප්‍රදේශවල ඉතා සීඝ්‍රයෙන් පැතිර යන වකුගඩු රෝගය පාලනය කිරීම සඳහා පිරිසිදු පානීය ජල සම්පාදන ව්‍යාපෘති ආරම්භ කිරීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන ප්‍රතිලාභ ලෙස

හඳුනාගෙන තිබුණි. එසේ වුවද ත්‍රිකුණාමලය හා අනුරාධපුර දිස්ත්‍රික්කයන් හි යෝජිත පානීය ජල ව්‍යාපෘති ආරම්භ කර නොතිබුණ අතර වම් ඉවුර හා දකුණු ඉවුර ඇළ මාර්ග යටතේ අලුතින් වගා කිරීමට යෝජිත ඉඩම් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙතින් නිදහස් කිරීමේ කටයුතු ද අවසන් වී නොතිබුණි. කුඩා වැව් පද්ධතිහි බෙදුම් ඇළ ඉදි කිරීමද අවසන් කර නොතිබුණි. වකුගඩු රෝගය පාලනය සඳහා දායකත්වයක් ලැබී ඇත්ද යන්න තහවුරුකර නොතිබුණි. කෙසේ වෙතත් ව්‍යාපෘතිය යටතේ දැනට නිම කර ඇති කාර්යයන් උපරිම ආර්ථික ප්‍රතිලාභ ජනනය වන ආකාරයට උපයෝජනය කර ගැනීම සඳහා වූ සැළැස්මක් සකස් කර ක්‍රියාත්මක කිරීමටද කටයුතු කර නොතිබුණි. මේ හේතුවෙන් දරන ලද රු.මිලියන 38,349 ක පිරිවැයට, ප්‍රමාණවත් ආර්ථික ප්‍රතිලාභ ජාතික ආර්ථිකයට එක් වී නොතිබුණි.

(vi) ජලාශය හා වම් ඉවුරු ඇළ ඉදිකිරීම සඳහා ගෝමරන්කඩවල, හොරොව්පතාන, කැබිතිගොල්ලෑව, පදවිය, පදවී ශ්‍රී පුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්හි රජයට අයත් ඉඩම් කට්ටි 887 ක් හා පෞද්ගලික පාර්ශවයන් වෙත වන්දි ගෙවා අත්පත් කර යුතු ඉඩම් කට්ටි 3,919 ක් පැවතුණි. ඉඩම් අත්පත් කර ගැනීම, නැවත පදිංචි කිරීම හා වන්දි ගෙවීම යන කටයුතු සඳහා වැදගත් වන තොරතුරු ලේඛනයක් හෝ යාවත්කාලීන කරන ලද තොරතුරු පද්ධතියක් පවත්වා ගෙනගොස් නොතිබුණු අතර ලේඛන විධිමත් පරිදි පවත්වාගෙන ගොස්ද නොතිබුණි. ඒ හේතුවෙන් ඉඩම් අත්පත්කර ගැනීමේ කටයුතු සම්පූර්ණ කර ඇති බව හා වන්දි ගෙවීම් අමාත්‍ය මණ්ඩලය විසින් අනුමතකර ඇති නිර්ණායකයන්ට අනුකූලව නිසි පුද්ගලයින් වෙත නිවැරදි තක්සේරු මත සිදුකර ඇති බවට විගණනයේදී තහවුරු කරගත නොහැකි විය.

(vii) ව්‍යාපෘතිය යටතේ පවරාගෙන ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද යන්නත්, පවරාගත් ඉඩම් භාවිතා කර ඇති ආකාරය පිළිබඳවත් විගණනයේදී තහවුරු කරගත නොහැකි විය. එහිදී ඉඩම් කට්ටි 2,438 ක් සඳහා පමණක් වන්දි ගෙවීම් අවසන් කර තිබුණු අතර තවත් ඉඩම් කට්ටි 1,481 කට අදාළ වන්දි ගෙවීම් අවසන් කර නොතිබුණි

(viii) යාන්ඔය වම් ඉවුරු ඇළ ඉදිකිරීම සම්බන්ධව චීන කොන්ත්‍රාත්කරු සමඟ එළඹ තිබූ EPC කොන්ත්‍රාත් ගිවිසුම් ප්‍රකාරව ඉටු කළ යුතුව තිබූ ඇමරිකානු ඩොලර් 3,478,910 ක් වූ කාර්යයන් ඉටු කර නොතිබූ නමුත් ඒ සඳහා සම්පූර්ණයෙන්ම වැඩ සහතික කර ගෙවා තිබුණි.

(ix) වම් ඉවුර ඇළ තත්පරයට ඝණ අඩි 300 ක ධාරිතාවයෙන් යුක්තව සකස් කිරීමට සැලසුම් කර තිබුණද එහි කිලෝමීටර් 7+720 දක්වා වූ කොටස පමණක් ඊට අනුරූපීව සකස් කර තිබූ අතර එතැන් සිට කිලෝමීටර් 18.21 දක්වා වූ කොටස තත්පරයට ඝණ අඩි 150 ක

ධාරිතාවයෙන් යුක්තව ඉදිකර තිබීම හා කිලෝමීටර් 7+720 කොටසේ ඉදිකිරීමට යෝජිත ජලාශය ඉදිකර නොතිබීම හේතුවෙන් මුල් කොටසේද තත්පරයට ඝණ අඩි 300 ක ධාරිතාවකින් ජලය නිකුත් කිරීමට නොහැකි තත්වයක පැවතුණි.

(x) මෙම ව්‍යාපෘතිය යටතේ ජලාශය ඉදිකිරීම හා වම් ඉවුරු ඇළ ඉදිකිරීම සඳහා වන කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුම් ගත වීමේදී EPC කොන්ත්‍රාත් ලේඛන භාවිතා කර තිබුණද එහිදී ඉදිකිරීම් ද්‍රව්‍ය සඳහා රාජ්‍යභාග ගෙවීම සම්බන්ධයෙන් වූ 7.8 විධිවිධාන, විශේෂ විධිවිධාන මඟින් සංශෝධනය කර තිබුණි. එහිදී පස් හා කළු ගල් කැණීම සඳහා අනුමැතිය හා රාජ්‍යභාග ගෙවීම සේවායෝජක (Employer) විසින් සපයා ගත යුතු බවත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන කාල සීමාව තුළ පස් හා කළු ගල් ගාස්තු ගෙවීමකින් තොරව කොන්ත්‍රාත්කරු හට ලබා ගත හැකි බවත් දක්වමින් සංශෝධනය කර තිබුණි. එහිදී උක්ත ව්‍යාපෘති 2 හි කටයුතු සඳහා කොන්ත්‍රාත්කරු විසින් භාවිතා කර තිබුණු වැලි කියුබ් 81,905 ක් කළු ගල් කියුබ් 201,784 ක් පස් කියුබ් 157,234 ක් වෙනුවෙන් කැළෑ ආඥා පනතේ 20 වන වගන්තිය යටතේ රජයට අහිමි වී තිබූ ඉඩම් පරිහරණ ගාස්තුව රු.මිලියන 2,196 ක් හා 1992 අංක 33 දරන පතල් හා ඛණිජ ද්‍රව්‍ය පනත අනුව තවදුරටත් අයවිය යුතු වූ රාජ්‍යභාගය රු.මිලියන 27කට අධික විය.

(ආ) **ශ්‍රී ලංකාවේ මහා වාරිමාර්ග ව්‍යාපාරවල ගොවිපල ඉඩම් ප්‍රතිසංවර්ධනය කිරීම අධ්‍යයනය සඳහා වූ නියමු ව්‍යාපෘතිය.**

වාරි කෘෂිකාර්මික ඉඩම්වල ඵලදායිතාවය සහ සම්පත් භාවිතා කිරීමේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම, කෘෂිකාර්මික කටයුතු නවීකරණය හා යාන්ත්‍රිකරණය, වර්තමානයේ මුහුණදෙන දේශගුණික විපර්යාස ජය ගැනීම හා ජපානය සහ ශ්‍රී ලංකාව අතර තාක්ෂණය හුවමාරුකර ගැනීම සඳහා ඉඩම් ඒකාබද්ධ කිරීම පිළිබඳ අධ්‍යනය කිරීමේ නියමු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට ජපන් වාරිමාර්ග හා ජල අපවහන ආයතනයේ (JIID) සභාපති සහ වාරිමාර්ග අමාත්‍යාංශ ලේකම් 2021 මාර්තු 31 දින අවබෝධතා ගිවිසුමක් අත්සන් කර තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා 2019 වර්ෂයේ සිට ශ්‍රී ලංකා රජය රු. 38,024,115 ක් ද, ජපන් වාරිමාර්ග හා ජල අපවහන ආයතනය ජපන් ආධාර රු. 8,766,667 ක් (USD 43,627) ද වශයෙන් එකතුව රු. 46,790,782 ක් වැයකර තිබුණි.

(i) මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අදාල ගිවිසුම 2021 මාර්තු 31 දින අත්සන් කර තිබුණද 2018 වසරේ ව්‍යාපෘතියේ කටයුතු ආරම්භකර 2019-2021 කාලය තුළ නිලධාරීන් 22 ක් විදෙස් පුහුණුවීම්වලට සහභාගී කරවා තිබුණි. එහිදි නිලධාරීන් ව්‍යාපෘතියේ කටයුතුවලට දායකත්වය ලබාදිය යුතු බවට ගිවිසුම් මඟින් එකඟතාවයක්

ලබාගෙන නොතිබූ අතර පුහුණුව ලබාදුන් නිලධාරීන් 22 කගෙන් නිලධාරීන් 09 ක්, විශ්‍රාම යාම, වෙනත් ආයතන සඳහා ස්ථාන මාරුවීම් සහ වෙනත් රාජකාරී කටයුතු සඳහා අනුයුක්ත කර තිබීම හේතුවෙන් ඔවුන්ගෙන් නියමු ව්‍යාපෘතිය සඳහා ප්‍රමාණවත් දායකත්වයක් ලැබී නොතිබුණි. ඒ අතුරින් 2019 වර්ෂයේ ජූලි මාසයේදී සහ අගෝස්තු මාසයේදී විශ්‍රාම යාමට නියමිතව තිබූ නිලධාරීන් දෙදෙනෙකු 2019 පෙබරවාරි මාසයේදී ජපානයේ පුහුණු පාඨමාලාව සඳහා සහභාගී කිරීම හේතුවෙන් පුහුණුවෙන් මාස කිහිපයකට පසු උක්ත නිලධාරීන් විශ්‍රාම ගොස් තිබුණි.

(ii) ව්‍යාපෘතිය සඳහා රු.මි. 60 කට වැඩි නොවන පිරිවැයක් දැරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණද බිම් සැකසීම හා ඇළ වේලිවලින් කොටසක් පමණක් සකස් කිරීමට රු.මි.119.3 ක් ඇස්තමේන්තු අනුමත කර තිබුණි. ඒ අනුව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ඉක්මවා රු.මි. 59 ක පිරිවැයක් දැරීමට ඇස්තමේන්තු අනුඥාත කර තිබුණි.

(iii) දෙපාර්තමේන්තුවේ නාච්චාදුව ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය විසින් මෙම නියමු ව්‍යාපෘතියේ බිම් සකස් කිරීම හා ඉදිකිරීම් කටයුතු භාරගෙන ක්‍රියාත්මක කර තිබුණි. 2018 වර්ෂයේ සිට අවස්ථා කිහිපයකදි ව්‍යාපෘතියේ කටයුතු සඳහා සකස්කල ඇස්තමේන්තු සංශෝධනය කර තිබුණු අතර එහි පළමු ඇස්තමේන්තුව යටතේ රු.මිලියන 22 ක් වැය කර තිබියදී එකී කාර්යයන් සඳහා 2022 වර්ෂයේ තවත් රු.මිලියන 22.6 ක ඇස්තමේන්තු අනුඥාත කොට පළමු ඇස්තමේන්තුව යටතේ ඉටුකල කාර්යයන් සඳහාම නැවත රු.මි.17.3 ක් ගෙවා තිබුණි.

(iv) ව්‍යාපෘතිය යටතේ කුඹුරු සකස් කිරීමේ කටයුතු සියයට 85 ක් නිම කර ඇති බව ප්‍රගති වාර්තා ඉදිරිපත් කර තිබුණද 2022 /2023 මහ කන්නය වගා කළ හැකි මට්ටමට කුඹුරු සකස් කර නොතිබුණු අතර ඇළ මාර්ග කොන්ක්‍රීට් කර සකස් කිරීම, ට්‍රැක්ටර් පැන්නුම් සැකසීම, ජල කළමනාකරණ සඳහා ජල හැරවුම් සැකසීම ආදී කටයුතුවලින් සියයට 3 ක් පමණක් නිමකර තිබුණි. කුඹුරු සඳහා ජලය සපයන FC 8 හා FC 9 ඇළ මාර්ගය මීටර් 260 ක් පමණ කොන්ක්‍රීට් පැති බැම්මක් හා ජල හැරවුම් 37 ක් පමණ කඩා ඉවත් කිරීම හා සැලසුම් කල පරිදි ඇළ මාර්ග සකස් නොකිරීම හේතුවෙන් එතෙක් පැවති ජල පාලන කටයුතුද ඉටුකර ගැනීමට නොහැකිවි තිබුණි.

(v) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම අනුව 2021 අගෝස්තු සිට 2021 දෙසැම්බර් වන විට ව්‍යාපෘතියේ සියළු කටයුතු නිම කළයුතු වුවත්, 2022 අගෝස්තු වන විටත් බිම් සැකසීම් ඉඩම් ඔප්පු බෙදාදීම් අවසන් කර නොතිබුණි. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී නාච්චාදුව වගා කළ කුඹුරු අක්කර 65 (හෙක්ටයාර 26.3) ක 2020 යල හා 2020/ 2021

මහ කන්නයේ වගාව කැප කිරීමට ගොවීන්ගේ එකඟතාවය ලබා ගෙන 2021 යල කන්නයේ සිට ගොවීන්ට වගා කිරීමට හැකි වන පරිදි කුඹුරු සකස් කර දීමට එකඟවී තිබූ නමුත් විගණිත දින වූ 2022 අගෝස්තු මස දක්වා නියමු ව්‍යාපෘති අවසන් කර නොතිබීම හේතුවෙන් ගොවීන්හට 2020 සිට 2023 දක්වා කන්න 06 ක් වගා කටයුතු සිදුකිරීමට නොහැකි වී තිබුණි. එමඟින්, එක් කන්නයකදී වී මෙට්‍රික් ටොන් 104 බැඟින් කන්න 06 කදී මෙට්‍රික් ටොන් 624 ක පමණ වී අස්වැන්න ජාතික ආර්ථිකයට අහිමිවී තිබූ අතර එහි වටිනාකම දළ වශයෙන් රුපියල් මිලියන 62 ක් පමණ විය.

(vi) ව්‍යාපෘතිය ආරම්භයේ ඇළ මාර්ග සම්පූර්ණයෙන් කොන්ක්‍රීට් කර සකස් කිරීම, අක්කර එකකට එක් ලියද්දක් බැඟින් වන සේ සකස් කිරීම, මැද ඇළ හා දෙපස කුණු ඇළවල් කොන්ක්‍රීට් කර සකස් කිරීම, සෑම කුඹුරකටම ට්‍රැක්ටර් පැන්නුමක්, ජල හැරවුම් සොරොව්වක්, ජල මාපකයක් සකස් කිරීම, වී වේලීමට ස්ථානයක්, ගබඩා කාමරයක්, වී කෙටීමට මෝලක්, පැළසිටුවීම හා වල් නෙළීම සඳහා යන්ත්‍ර ලබාදීම, කන්න 3 කට පසු එලදාව අක්කරයකට වී බුසල් 20 ත් 30 අතර ප්‍රමාණයෙන් වැඩිකර දීම ව්‍යාපෘති අරමුණු ලෙස දක්වා තිබුණද එම කිසිදු කාර්යයක් ව්‍යාපෘතිය තුළින් ඉටු වී නොතිබුණි.

3.1.3 ව්‍යාපෘති නිම නොකර අතහැර දැමීම

(අ) මහාපරිමාණ සංවර්ධන ව්‍යාපෘතීන් නැවත ක්‍රමෝපායකරණය හා කඩිනම් කිරීමේ (CRMP) කමිටුවේ නිර්දේශ මත රු. මිලියන 6,000 ක ඇස්තමේන්තුව මත 2022 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 159.4 ක් වැය කර තිබූ කුඩාවිලච්චිය ජලාශය ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය හා රු. මිලියන 2,230 ක ඇස්තමේන්තුව මත 2022 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 10 ක් වැයකර තිබූ දෙමටගල්ල වැව ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය 2023 වර්ෂයේ සිට ක්‍රියාත්මක නොකිරීමට තීරණය කර තිබුණි. 2021 ආරම්භ කර තිබූ මෙම ව්‍යාපෘති නිම කිරීමේ ප්‍රතිශතය 2022 දෙසැම්බර් 31 දිනට පිළිවෙලින් සියයට 4.95 ක් හා සියයට 0.25 ක් විය.

(ආ) වඩමාරච්චි කළපුවෙහි ජල සම්පත් සංවර්ධනය කිරීම මඟින් යාපනය අර්ධද්වීපයේ ජනතාවට පානීය ජලය සැපයීම සඳහා 2019 වර්ෂයේදී රු.මිලියන 2,000 ක ඇස්තමේන්තු පිරිවැයක් යටතේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නියමිතව තිබුණද එය ඉටුකර නොතිබූ අතර වසර 3 කට පසුව 2021 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 28 ක් වැයකර ව්‍යාපෘතිය අතහැර දමා තිබුණි.

(ඇ) දලුග්ගල වැවේ භූ විද්‍යා පරීක්ෂණ සඳහා 2022 වර්ෂය තුළ රු.3,190,000 ක ඇස්තමේන්තුවක් අනුඥාත කොට වැයකර තිබුණද, එම වැව ඉදිකිරීමට අදාළ මූලික කටයුතු කිසිවක් ආරම්භ කිරීමකින් තොරව අතරමඟ නවතා තිබීම හේතුවෙන් දරා තිබූ වියදම අනාර්ථික වී තිබුණි.

(ඈ) දෙපාර්තමේන්තුවේ සැලසුම් අංශය මඟින් ශක්‍යතා අධ්‍යන සිදුකර තිබූ පෙතියාගොඩ පිහිටි පොම්පාගාරය ඉදිකිරීම, කැකිරියෝබඩ අතිරේක පිටවාන ඉදිකිරීම, කැලණි ගංවතුර ආරක්ෂණ යෝජනා ක්‍රමයේ නිකවේල හි ගංවතුර පිටවීමේ ව්‍යුහය ඉදිකිරීම, මයියාව වැවේ පිටවාන වැඩිදියුණු කිරීම, මල්වතුඔය හරහා RCC පාලම ඉදිකිරීම, පෙරාරු අමුණ ඉදිකිරීම, කුඩාවිලච්චිය පිටවාන ඉදිකිරීම, ඇල්ල වැව පිටවාන ඉදිකිරීම, ඇල්ලේ වැවේ බැම්ම ඉදිකිරීම, එලවාන්කුලම අමුණ ඉදිකිරීම, විලලෝඩයි අමුණ ඉදිකිරීම, මල්වතු ඔය පිටවාන ඉදිකිරීම හා පාන්කුළම ජලාශයේ පිටවාන ඉදිකිරීම යන ව්‍යාපෘති 12 ක් 2023 මැයි 31 දක්වා ආරම්භ කර නොතිබුණ අතර එම ව්‍යාපෘති වෙනුවෙන් දරනු ලැබූ වියදම හදුනාගත හැකිවන පරිදි ලිපිගොනු පවත්වාගෙන ගොස් නොතිබුණි.

(ඉ) ගම සමඟ පිළිසඳරක් වැඩසටහන යටතේ අනුරාධපුරය දිස්ත්‍රික්කයේ කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පදවිය හා වාහල්කඩ ගොවි ව්‍යාපාරවල ඇළ පද්ධතිය වැඩිදියුණු කිරීම සඳහා රු. මිලියන 116 ක් ඇස්තමේන්තු කර ඉන් රු.මිලියන 31.2 ක් වැයකර තිබුණද ව්‍යාපෘතිය සඳහා 2023 වර්ෂයේ ප්‍රතිපාදන නොලැබීම මත අතරමඟ නවතා තිබීම හේතුවෙන් දරන ලද පිරිවැය නිෂ්කාර්ය වී තිබුණි. එහිදි වගාබිම් සඳහා ජල සැපයුම් ඉදිකිරීමට සැලසුම් කර ඒ සඳහා අවශ්‍ය හීයුම් පයිප්ප 2411 ක් මිලදී ගෙන ඉන් 1017 ක් ගොවි සංවිධාන වෙත නිකුත් කර තිබුණද එමඟින් අපේක්ෂිත ජල සැපයුම් ඉදිකර නොතිබුණු අතර පයිප්ප 1395 ක් පදවිය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයේ නිෂ්කාර්යව තබා තිබුණි.

3.1.4 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

(අ) දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක, ඇස්තමේන්තුගත වටිනාකම රු. මිලියන 131,239 ක් වූ බස්නාගොඩ ජලාශ ව්‍යාපෘතිය, කුඹුක්කන්ඔය ජලාශ ව්‍යාපෘතිය, යාන්ඔය ජලාශ ව්‍යාපෘතිය, මොරාණ ජලාශය, රුගම - කිතුල්ගම ජලාශය (මුන්දෙණි ආරු ද්‍රෝණි සංවර්ධන ව්‍යාපෘතිය), වේල්ලස්ස නවෝදය (මොණරාගල දිස්ත්‍රික්කයෙහි කඩිනම් වාරිමාර්ග සංවර්ධන ව්‍යාපෘතිය), උමා ඔය යටි ගං සංවර්ධන ව්‍යාපෘතිය (අලිකොටආර ගබඩා ජලාශය සහ කුඩා ඔය ගබඩා ජලාශය), මහගල්ගමුව පෝෂිත ඇළ ඉදිකිරීමේ ව්‍යාපෘතිය සහ ගොඩිගමුව

ව්‍යාපෘතිය සංවර්ධනය කිරීම හා වැඩිදියුණු කිරීම යන සංවර්ධන ව්‍යාපෘතීන් 9 හි සැලසුම් කළ කාලය වසර 2 සිට 8 දක්වා ප්‍රමාද වී තිබුණද නිමකර නොතිබුණි. 2012 වර්ෂයේ සිට ආරම්භ කර තිබූ එම ව්‍යාපෘතීන්හි කාලය දීර්ඝ කිරීම සඳහා අවස්ථාවන් කිහිපයකදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබුණද ප්‍රමාදයන් හේතුවෙන් ව්‍යාපෘති තුළින් ලබාගැනීමට අපේක්ෂා කළ වාසි, සැලසුම්ගත පරිදි ලබාගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) **උමා ඔය යටි ගං සංවර්ධන ව්‍යාපෘතිය (අලිකොටඅර ගබඩා ජලාශය සහ කුඩා ඔය ගබඩා ජලාශය)**

i. උමාඔය ද්‍රෝණියේ සිට දක්ෂිණ කලාපයේ කිරිදිඔය ද්‍රෝණියට ජලය සත මීටර් මිලියන 145 ක් වාර්ෂිකව හැරවීම ප්‍රධාන අරමුණ කොටගෙන වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශය හා ඉරාන ෆරාබ් සමාගම, ඇමරිකානු ඩොලර් මිලියන 529.06 ක් හෙවත් රුපියල් මිලියන 74,325.75ක ඉංජිනේරු, ප්‍රසම්පාදන හා ඉදිකිරීම් (EPC) කොන්ත්‍රාත් ගිවිසුමකට 2008 අප්‍රේල් 28 දින එළඹ තිබුණි. ඒ යටතේ ඇරඹී ව්‍යාපෘතියේ කාලය 2023 ජුනි 30 දක්වා සීමාව දීර්ඝ කර තිබූ අතර මූලස්ථායී වැඩ වලින් 2022 දෙසැම්බර් 31 දිනට 97.39 % ක් නිම කර පැවතිණි. ජල විදුලි බලාගාරයේ නිම කිරීම් අවසන් අදියරේ පැවැති අතර 2023 වර්ෂය තුළ නිම කිරීමට යෝජිතව පැවතුණි. ජල විදුලි උත්පාදනයෙන් පසු නිකුත් කරන ජලය කිරිඳි ඔය ද්‍රෝණියේ කෘෂිකාර්මික කටයුතු සඳහා යොදා ගැනීමට සැලසුම් සකස් කර ක්‍රියාත්මක කිරීමේ වගකීම වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත පැවරී තිබුණද ව්‍යාපෘතිය නිම කිරීමට අපේක්ෂිත කාලය මෙන් දෙගුණයක් එනම් වසර 14 ක් ගත වී තිබියදීත් යෝජිත ඉදි කිරීම් සියයට 50 ක් හෝ නිම කර නොතිබුණි.

ii. ව්‍යාපෘතිය මඟින් දැනට වගා කරනු ලබන ඉඩම් අක්කර 3500 ක් ඇතුළත්ව ඉඩම් අක්කර 15,000 ක් දෙකන්නය වගා කිරීමට ජලය සැපයීම සැලසුම් කර වසර 14 ක් ගත වී ඇතත් ජලය සැපයීමට යෝජිත නව ඉඩම් මේ දක්වා හඳුනාගෙන හෝ ලේඛනයක් සකස් කර නොතිබුණි.

iii. උමා ඔය ද්‍රෝණියේ ජලය වාර්ෂිකව සත මීටර් මිලියන 145ක් කිරිදිඔය ද්‍රෝණිය වෙත හැරවීමෙන් පසු දකුණු පළාතේ කෘෂිකාර්මික කටයුතු සඳහා නිදහස් කිරීමට, තැන්පත් කර ගැනීම අරමුණු කොට ගෙන සත මීටර් මිලියන 22.5 කින් යුත් නව කුඩා ඔය ජලාශය ඉදි කිරීමට සැලසුම් කර තිබූ නමුත්, උමා ඔය සිට කුඩා ඔය වෙත ජලය රැගෙන ඒම සඳහා ඉදි කිරීමට සැලසුම් කර තිබූ කිලෝමීටර 30ක් දිගින් යුත් ඇළ මාර්ගයට ඉහළින් සිටින සේ, ජලාශයේ සැලැස්ම නිසි අනුමැතියකින් තොරව සංශෝධනය කර තිබුණි.

iv. මෙම ජලාශයේ ඉදි කිරීමට අවශ්‍ය වැලි මීටර් කියුබ් 109,524 ජලාශයට යටවන ප්‍රදේශයෙන් සපයා ගැනීම අරමුණු කොට ගෙන මූලික ඇස්තමේන්තු සකස් කර තිබූ නමුත් ඉහත සඳහන් පරිදි ජලාශයේ සැලැස්ම වෙනස් කිරීමෙන් පසු හඳුනාගෙන තිබූ වැලි නිධිය ජලාශයෙන් පිටත සීමාව බවට පත්ව තිබිණි. එහිදී කුඩා ඔය ජලාශය ඉදි කිරීමට අවශ්‍ය වැලි කියුබ් 1ක් සඳහා රුපියල් 6,452ක් ඇස්තමේන්තු කර තිබුණ ද රුපියල් 10,100 වැනි මුදලකට බාහිර සැපයුම්කරුවෙකු මඟින් වැලි මිල දී ගැනීමට කටයුතු කර තිබූ අතර අදාළ සැපයුම්කරු විසින් ජලාශ බැම්මට මීටර් 200 ක් පමණ පහළින් පිහිටි ගාස්තු ගෙවීමකින් තොරව වැලි සපයා ගැනීමට සැලසුම්කර තිබූ ස්ථානයෙන් වැලි කියුබ් 21,286 ක් සපයා තිබූ අතර ඒ සඳහා රුපියල් මිලියන 190 ක් ගෙවා තිබුණි.

v. මෙම ව්‍යාපෘතිය යටතේ එක් එක් කාර්ය සඳහා දරන ලද වියදම් පිළිබඳව වෙන් වෙන්ව හිඟුම් තබාගෙන නොතිබූ අතර වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ද පිළියෙළ කර නොතිබුණි. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ 2023 ජනවාරි මස ප්‍රගති වාර්තාවට අනුව 2021 වර්ෂය දක්වා වාරිමාර්ග අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ රුපියල් මිලියන 9,870.92 ක් හා 2022 වර්ෂයේ වාරිමාර්ග දෙපාර්තමේන්තු වැය ශීර්ෂය යටතේ රුපියල් මිලියන 2,006.67ක් වශයෙන් රුපියල් මිලියන 11,878 ක් වැය කර තිබූ නමුත් එක් එක් කාර්ය යටතේ එක් එක් කාර්ය සඳහා දරන ලද පිරිවැයෙහි එකතුව රුපියල් මිලියන 6,567.22 ක් විය. ඒ අනුව ව්‍යාපෘතිය සඳහා වැය කරන ලද පිරිවැයෙන් රුපියල් මිලියන 5,310 ක් වැය කළ කාර්යය නිශ්චිතව හඳුනා ගැනීමට නොහැකි විය.

vi. ස්වකීය සේවකයින් හා උපකරණ භාවිත කර ඉටු කරන ප්‍රසම්පාදන ක්‍රමය (Force Account) යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබූ අතර අනුඥාත කරනු ලැබූ එක් එක් ඇස්තමේන්තු යටතේ නිමකරන ලද වැඩකොටස් පිළිබඳ සහතික කිරීම් හා වැඩ අවසන් වාර්තා ඉදිරිපත්කර නොතිබුණි. ඉංජිනේරු සහකාරවරුන්ගේ දෛනික මිනුම් පොත් පදනම් කොට ගෙන ද්‍රව්‍ය, ශ්‍රමය හා යන්ත්‍ර සඳහා ගෙවීම් කර තිබුණි.

vii. මෙම ව්‍යාපෘතිය සඳහා වෙන් කළ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 11,877 ක් හෙවත් සියයට 120 ක් වැයකර තිබූ නමුත් දකුණු ඉවුරු ඇළ යටතේ නිම කිරීමට අපේක්ෂිත කාර්යයන්ගෙන් සියයට 50 කට වඩා වැඩි ප්‍රමාණයක් නිම කර නොතිබුණි.

3.1.5 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

(අ) මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති නැවත-ක්‍රමෝපායකරණය හා කඩිනම් කිරීමේ (RAMP) කමිටුවේ නිර්දේශ ප්‍රකාරව මොනරාගල දිස්ත්‍රික්කයේ කඩිනම් වාරි සංවර්ධන ව්‍යාපෘතිය (වෙල්ලස්ස නවෝදය) යටතේ වූ දෙටගමුව, මොරගොල්ල, ඌරාඋල හා පයිලේගම යන වැව් 4 හි මේ වන විට පවතින ක්‍රියාකාරකම් ප්‍රයෝජනයට ගත හැකි පරිදි තිරසාර ලෙස නිම කර ව්‍යාපෘතිය සමාලෝචිත වර්ෂය තුළ අවසන් කිරීමට තීරණය කර තිබුණි.

(i) එහිදී මොරගොල්ල, ඌරාඋල හා පයිලේගම වැව් ප්‍රතිසංස්කරණය කළයුතු ආකාරය පිළිබඳ ප්‍රමුඛතාවයන් තීරණය කිරීමෙන් තොරව ද්‍රව්‍ය මිල දී ගෙන තිබීම හා ඉදිකිරීම් සිදුකිරීම නිසා එම වැව් මඟින් වගා කටයුතු සඳහා ජලය සැපයීමට විගණිත දින වූ 2023 මැයි 31 දක්වා නොහැකිවී තිබුණි. තවද 2023 අයවැය තුළින් මුදල් වෙන්කිරීම සීමා වීම නිසා මෙම වැව් ප්‍රතිසංස්කරණය කිරීම වෙනුවෙන් මේ දක්වා දරන ලද රු. 140,963,871 ක වියදමද නිෂ්කාර්ය වී තිබුණි.

(ii) උක්ත ව්‍යාපෘතිවල ඇතුළත් රු. මිලියන 28.64 ක ලාභාන්තිකය රහිත ඇස්තමේන්තු වටිනාකම හා සැසඳීමේදී මොරගොල්ල වැව හා පයිලේගම වැවෙහි 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 90 සහ 96 ක් වූ අතර වැව් ඉදිකිරීමේ භෞතික ප්‍රගතිය පිළිවෙලින් සියයට 23 හා සියයට 81 ක් විය.

(iii)මොරගොල්ල වැව ප්‍රතිසංස්කරණය සඳහා අනුඥාත කර තිබූ රු.මිලියන 49.9 ක ඇස්තමේන්තුව තුළ ඇතුළත් රු.මිලියන 37.9 ක් වූ සිවිල් පිරිවැයෙන් රු.මි. 30.3 ක් හෙවත් සියයට 80 ක් වැය කර තිබුණු නමුත් ඉදිකිරීම්වල භෞතික ප්‍රගතිය සියයට 37 ක් විය. එසේ ප්‍රමාණවත් භෞතික ප්‍රගතියක් වාර්තා වී නොතිබියදීත් 2019, 2020, 2021 හා 2022 වර්ෂ අවසානයේ ඉතිරි ප්‍රතිපාදන වැයකිරීමේ අරමුණින් පෙර වර්ෂවල මිලදී ගත් අමුද්‍රව්‍ය භාවිතා කිරීමෙන් තොරව තොග වශයෙන් නැවතත් ද්‍රව්‍ය මිලදී ගෙන තිබුණි. වැව ප්‍රතිසංස්කරණයට අදාළව අනුඥාත කළ ඇස්තමේන්තුව තුළ වැවේ පිටවාන ඉදිකිරීමට රු.මිලියන 28.6 හෙවත් මුළු ඇස්තමේන්තුවෙන් සියයට 75 වෙන්කර තිබූ අතර ඒ සඳහා 2022 වර්ෂය තුළ රු. 9,872,170 ක් වැය කර වානේ කම්බි 5,150 Kg මිලදීගෙන ඉන් 1,884 Kg පමණක් භාවිතා කර තිබුණි. මේ අනුව මිලදී ගත් කම්බි ප්‍රමාණයෙන් සියයට 63ක් ඉතිරි වී තිබුණි.

(iv) මොරගොල්ල වැව ප්‍රතිසංස්කරණය කිරීමෙන් පසු වගාකරන භූමි ප්‍රමාණය අක්කර 50 සිට අක්කර 200 දක්වා වැඩි කිරීමට සැලසුම් කර තිබුණු නමුත් ඒ සඳහා අවශ්‍ය කුඹුරු හදුනාගෙන නොතිබුණු අතර වගාවට ජලය ගෙනයාමට අවශ්‍ය ඇළ මාර්ග සකස්කිරීම අනුමත ඇස්තමේන්තුවට ඇතුළත්කර නොතිබුණි.

(v) ඌරාඋල වැවේ බැම්ම ඉදිකිරීමෙන් පසු වැව් බැම්මේ ආරක්ෂාවට රළපනාවක් දැමීමට අවශ්‍ය 6 X 9 කළුගල් කියුබ් 240.26 ක් රු. 3,499,500 මුදලක් වැය කර 2021 වසරේ මිලදී ගෙන වැව ඉදිකිරීම් භූමියේ ගොඩගසා තිබුණු අතර එම වර්ෂයේම මිලදී ගෙන තිබු රු.2,324,850 ක් වටිනා 12 mm කම්බි 1761 ක් වසරකට වැඩි කාලයක් ඉදිකිරීම් භූමියේ ගොඩ ගසා තිබුණද වැව් බැම්ම 2023 ජනවාරි වනතෙක් ඉදිකර නොතිබුණි.

3.1.6 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කළ යුතුව තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කාර්යසාධන වාර්තාවේ දෙපාර්තමේන්තු වැය ශීර්ෂ අංකය හා අන්තර්ගත පරිච්ඡේදය පිළිබඳ සාරාංශය ඇතුළත් කර නොතිබුණි. කාර්යසාධන වාර්තාවේ 1.4 යටතේ දැක්වූ සංවිධාන සටහන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර නොතිබුණි. ආයතනය පිළිබඳ හැඳින්වීමේදී බලතල පැවරී ඇති ප්‍රධාන නෛතික විධිවිධාන පිළිබඳ සඳහන් කර නොතිබුණු අතර අරමුණු හා ප්‍රධාන කාර්යයන් හඳුනා ගැනීමේදී වාරිමාර්ග ආඥා පනතේ විධිවිධාන යටතේ දෙපාර්තමේන්තුව වෙත බලතල පැවරී ඇති කාර්යයන් දක්වා නොතිබුණි.

(ආ) දෙපාර්තමේන්තුව යටතේ වන කලාප වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාල 14, ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල 52 හා යාන්ත්‍රික කාර්යාල 12 ඇතුළු ප්‍රාදේශීය කාර්යාලයන්හි ව්‍යාපෘතිය හා පිහිටීම පිළිබඳ තොරතුරු ඇතුළත් කර නොතිබුණි.

(ඇ) ඉදිරි ඉලක්කයන් දැක්වීමේදී ඇතැම් කරුණු යටතේ ඉටු කිරීමට අපේක්ෂා කරන කාර්යභාරය හා ඒවා ළඟාකර ගැනීමට අපේක්ෂා කරන කාල රාමුව දක්වා නොතිබුණි.

(ඈ) 2 වැනි පරිච්ඡේදයේ විදේශ ණය ආධාර යටතේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කල මහාපරිමාණ හා මධ්‍යම පරිමාණ වාරි ව්‍යාපෘති 19 ක් හා වෙනත් ව්‍යාපෘති 7 ක තොරතුරු දැක්වීමේදී එහිදී ඇතැම් ව්‍යාපෘතිවල ප්‍රගතිය දක්වා තිබුණු නමුත් අපේක්ෂිත පරිදි නිම කිරීමට නොහැකි වීමට හේතු හා අභියෝග පිළිබඳවත් ඒවා නිම කිරීමේ ඉදිරි ඉලක්ක පිළිබඳවත් සඳහන් කර නොතිබුණි.

(ඉ) දෙපාර්තමේන්තුවට බලය පැවරී ඇති සියළු කාර්යයන් යටතේ පාලනය කරනු ලබන ස්වභාවික හා භෞතික සම්පත් හා ප්‍රධාන කාර්යභාරයට ඇතුළත් තොරතුරු ජයග්‍රහණ, ප්‍රගතිය හා අභියෝග යටතේ අනාවරණය කර නොතිබුණි.

3.2. විදේශ ආධාර ව්‍යාපෘති

3.2.1 ව්‍යාපෘති නිම කිරීමෙන් පසු ප්‍රතිලාභ

දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතියේ (CRIP) ප්‍රතිපාදන යටතේ ශක්‍යතා අධ්‍යනයන් 6 ක් සිදු කිරීම සඳහා 2021 වර්ෂය දක්වා රු. මිලියන 430 ක් වැය කර තිබූ නමුත් ඒ යටතේ ඉදිරිපත් කර තිබූ වාර්තා අනුව දෙපාර්තමේන්තුවේ ඉදිරි සංවර්ධන ව්‍යාපෘතීන් සැලසුම් කර සංවර්ධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

3.3 ප්‍රසම්පාදනය

2021 වර්ෂය තුළ කලාප වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාල 14 ක් යටතේ වූ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල 52 ක් මඟින් ක්‍රියාත්මක කරන ලද කර්මාන්ත හා නඩත්තු වැඩ සම්බන්ධයෙන් විගණනයට කැඳවන ලද තොරතුරු සඳහා කලාප කාර්යාල 10 කට අයත් ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල 31 ක් පමණක් තොරතුරු ඉදිරිපත් කර තිබුණි. එම තොරතුරු වලට අනුව ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල 31 මඟින් රු. මිලියන 6,304 ක වටිනාකමකින් යුත් කර්මාන්ත 1050 ක් ක්‍රියාත්මක කර තිබුණි. එම කර්මාන්ත අතරින් රු.මිලියන 5,594 ක් වටිනාකමින් යුත් කර්මාන්ත 776 ක් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 3.7 ප්‍රකාරව ස්වකීය සේවකයින් හා උපකරණ භාවිතා කර ඉටු කරන ප්‍රසම්පාදන ක්‍රමය (Force Account) ක්‍රියාත්මක කර තිබුණි. පහත නිරීක්ෂණ කෙරේ.

(අ) මෙම ප්‍රසම්පාදන ක්‍රමය (Force Account) යටතේ වැව්/ජලාශ ඉදිකිරීම හා ප්‍රතිසංස්කරණය සඳහා අවශ්‍ය ශ්‍රමය වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අනුයුක්ත කම්කරුවන් මඟින් සපයාගත නොහැකි අවස්ථාවලදී පමණක් බාහිරින් සපයා ගතයුතු වුවත් සියළු පුහුණු හා නුපුහුණු ශ්‍රම අවශ්‍යතා ශ්‍රම සැපයුම් කරුවන්ගෙන් හෝ ගොවි සංවිධාන මඟින් හෝ තනි පුද්ගල කම්කරු ගිවිසුම් යටතේ සපයාගෙන තිබුණි.

(ආ) මේ යටතේ වැව්/ජලාශ ඉදිකිරීම හා ප්‍රතිසංස්කරණය සඳහා දෙපාර්තමේන්තුව සතුව පවතින යන්ත්‍රෝපකරණ මඟින් අදාළ සේවා ලබාගත නොහැකි විටදී පමණක් අවශ්‍ය යන්ත්‍රෝපකරණ බාහිරින් සපයාගත යුතු වුවත් දෙපාර්තමේන්තුව සතුව පවතින 350 ක් පමණ වූ යන්ත්‍රෝපකරණ ඇණිය තුළ ක්‍රියාකාරී තත්ත්වයේ පවතින යන්ත්‍රෝපකරණ නිෂ්කාර්යව පැවතියදී බාහිර සැපයුම්කරුවන් වෙතින් කුලි පදනම මත යන්ත්‍රෝපකරණ සපයාගෙන තිබුණි.

(ඇ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 4.2 අනුව ප්‍රසම්පාදන සැලැස්ම තුළ ප්‍රසම්පාදන ක්‍රමය නිශ්චය කර තිබිය යුතු අතර මාර්ගෝපදේශ 4.2.3(ඇ) අනුව ප්‍රසම්පාදන කාල සටහන ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කළ යුතු වේ. එසේවුවද ඒ අනුව කටයුතු කර නොතිබූ අතර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල 31 ක් මඟින් 2022 වර්ෂය තුළ ඉටු කරන ලද රු.මිලියන 6,304 ක් වූ ඉදිකිරීම් හා නඩත්තු කර්මාන්ත 1,050 ක ප්‍රසම්පාදන ක්‍රමවේදය ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුවරයා විසින් නිශ්චය කර තිබුණි.

(ඈ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 4.3.2 ට අනුකූල ලෙස ඇස්තමේන්තු පිළියෙල නොකිරීම නිසා 2022 වර්ෂය තුළ සිදු කරන ලද රු. මිලියන 7,820 ක වටිනාකමින් යුත් ඉදිකිරීම් හා නඩත්තු වැඩ 1,493 ක අධීක්ෂණ හා පරිපාලන පිරිවැය අධි ඇස්තමේන්තු වටිනාකම රු.මිලියන 92.2 ක් විය.

3.4 වත්කම් කළමනාකරණය

(අ) මෝටර් වාහන

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ දත්ත පද්ධතිය අනුව වාරිමාර්ග දෙපාර්තමේන්තුව නමින්, වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් නමින්, හෝ දෙපාර්තමේන්තු ලිපිනය යටතේ වාහන 2004 ක් ලියාපදිංචි වී තිබුණද දෙපාර්තමේන්තුවේ වාහන ලේඛනය අනුව දෙපාර්තමේන්තුවට අයත් හා පරිහරණය කරණු ලබන වාහන සංඛ්‍යාව 1,124 ක් විය. ඒ අනුව වාහන 880 ක් දෙපාර්තමේන්තුව භාරයේ නොපැවතුණි.

3.5 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගණුදෙනු

(අ) මු.රෙ. 385(1)(අ) ප්‍රකාරව රු. 500 ට හෝ ඊට වැඩි මුදලක් ගෙවීමේදී එය මුදලින් නොගෙවිය යුතු වුවත් ඊට පටහැනිව හා නිසි අනුමැතියක් තොරව 2022 වර්ෂයේදී රු. 352,420,052 ක් වටිනා චෙක්පත් 1177 ක් ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු නමට නිකුත්කර තිබුණි. අනතුරුව එම චෙක්පත් වල රේඛනය අවලංගු කර කොට්ඨාශ සහකාර විසින් මුදල් කරගෙන අනුමැතියකින් තොරව ගෙවීම්ලාභීන් වෙත මුදලින් ගෙවීම් කර තිබුණි.

(ආ) විගණිත දිනය වූ 2022 මාර්තු 08 දිනට හිරියාල ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයට අනුයුක්ත කොට්ඨාශ සහකාරවරයාගේ ද්‍රව්‍ය සාරාංශය අනුව පැවති, ඉදිකිරීම් ද්‍රව්‍ය තොග ශේෂයන් හා ඇදගල ඉදිකිරීම් භූමියේ හා ක්ෂේත්‍ර ගබඩාවේ පැවති තොග ශේෂයන් සැසඳීමේදී රු. 6,092,193 ක ඌණතාවයක් විය.

(ඇ) තොග පොත අනුව 2021 දෙසැම්බර් 31 වන විට රු.5,146,400 ක් වටිනා සිමෙන්ති මිටි 7,662 ක් ඇඳගල අමුණ III අදියර සඳහා හිරියාල කොට්ඨාශ ඉංජිනේරු සහකාරවරයා වෙත නිකුත් කර තිබුණු අතර 2021 දෙසැම්බර් 31 දින වන විට ඉන් සිමෙන්ති මිටි 2784 ක් ඉංජිනේරු සහකාරවරයා භාරයේ තිබුණු බව වාර්තා කර තිබුණු නමුත් විගණනය විසින් අවස්ථා දෙකකදී සිදුකරන ලද භෞතික විගණන පරීක්ෂාවන්හිදී රු.2,269,718 ක් පිරිවැය වූ සිමෙන්ති මිටි 2,796ක ඌණතාවයනක් පැවතුණි.

(ඈ) වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් අංක 51 – 9694 දරන කැබ් රථය 2001 අගෝස්තු 13 දින කල්මුනේ පොලිස් බල ප්‍රදේශය තුළ ඉංජිනේරු සහකාරවරයෙකු සමඟ සේවයේ යොදවා තිබියදී පැහැර ගැනීමට ලක්ව තිබුණි. මේ සම්බන්ධයෙන් කල්මුනේ මහේස්ත්‍රාත් අධිකරණයේ විභාග වූ අංක 22647/pc නඩුවේ වාර්තාව අනුව මෙම සිද්ධිය සැකකරුවන් නොදන්නා අපරාධයක් ලෙස නිගමනය කර තිබූ අතර මේ සම්බන්ධයෙන් පත් කර තිබූ පරීක්ෂණ මණ්ඩලය මෙම අලාභය රජයට සිදුවූ අලාභයක් ලෙස සලකා පොතෙන් කපා හැරීමට 2022 මාර්තු 31 දින නිර්දේශ කර තිබුණි. ඒ අනුව වාහනය පැහැරගෙන ඇති බව තහවුරු කරගත් විගසම එහි ආදායම් බලපත්‍ර නිකුත් කිරීම නවත්වන ලෙසත් ලියාපදිංචිය අවලංගු කරන ලෙසත් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා වෙත දැනුම් දීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් අදාළ රථය සඳහා 2022 ජුනි 29 දින සිට 2023 ජුනි 28 දින දක්වා වලංගු වන පරිදි ආදායම් බලපත්‍රයක් 2022 ඔක්තෝබර් 27 දින කුරුණෑගල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වෙත මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර තිබුණි.

3.6 පාඩු හා හානි

2003 වර්ෂයේදී දෙපාර්තමේන්තුවේ ඉංජිනේරුවරයකු විසින් සිදුකරන ලද රිය අනතුරක් සම්බන්ධයෙන් වූ නඩු තීන්දු දෙකකට අදාළව අයවිය යුතුව තිබූ රු.3,908,000 ක මුදලක් 2021 දෙසැම්බර් 31 දිනට, නොපියවූ අග්‍රිම ශේෂයක් ලෙස මූල්‍ය ප්‍රකාශනයේ ඉදිරියට ගෙනවිත් තිබුණි. අදාළ ශේෂය එම නිලධාරියාගේ විශ්‍රාම පාරිතෝෂිකයෙන් අයකර ගෙන නොතිබුණු අතර ඔහුගේ විශ්‍රාම වැටුපෙන් මාසිකව රු.10,000 ක් වැනි මුදලක් අයකිරීම හේතුවෙන් එම කාලය තුළ අයකරගෙන තිබූ මුදල රු.300,000 ක් පමණක් විය. 2021 අගෝස්තු මස අදාළ නිලධාරියා මියයාම හේතුකොටගෙන ඉහත නොපියවූ අග්‍රිම ශේෂය පියවාගැනීමට නොහැකිව තිබුණි.

3.7 අනාවරණීක ගනුදෙනු

(අ) රු.41,643,000 ක මුළු පිරිවැය ඇස්තමේන්තුවක් මත 2021 අගෝස්තු 08 දින ආරම්භ කර තිබූ හුදලියාව වැව ප්‍රතිසංස්කරණය සඳහා 2022 දෙසැම්බර් 28 වන විට රු.15,455,953 ක් වැය කර තිබුණු අතර තවදුරටත් ගෙවිය යුතු රු.6,576,474 ක බැරකම් පැවතුණි. වැවෙහි රොන්මඩ ඉවත්කිරීමේ කටයුතුවලින් කොටසක් 2021 වර්ෂයේ ඔක්තෝබර් සිට 2022 පෙබරවාරි දක්වා සිදුකර තිබුණු අතර ඒ සඳහා පෞද්ගලික ආයතනයක් වෙතින් පස් සීරුම්, තල්ලු කිරීම් හා පැටවීම සඳහා භාවිතා කරන කුල්ලක් පමණක් සහිත යන්ත්‍රයක් කුලී පදනම මත ලබාගෙන තිබුණි. ඉහත කර්යය සිදුකළ හැකි වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් අංක RS–1373 දරන JCB යන්ත්‍රය හුදලියාව වැඩ බිමට ගෙනගොස් තිබුණද, එම යන්ත්‍රය භාවිතා කර නොතිබුණි. දෙපාර්තමේන්තුවට අයත් පස් සීරුම්/ කැපීම සඳහා භාවිතා කළ හැකි වර්ක්ස් මෝටර් ග්‍රේඩර් යන්ත්‍රයද, අනුරාධපුර වාරිමාර්ග කාර්යාලයෙන් රැගෙන විත් තිබුණු ඩෝසර් යන්ත්‍ර 02 ක් සහ නිකවැරටිය වාරිමාර්ග කාර්යාලයට අයත් ලෝඩර් යන්ත්‍රයක්ද ක්ෂේත්‍රය ආසන්නයේ නවතා තිබුණු නමුත් එම යන්ත්‍රයද වැවෙහි කටයුතු සඳහා භාවිතා කර නොතිබුණි. මේ අයුරින් දෙපාර්තමේන්තුව සතුව ප්‍රමාණවත් යන්ත්‍ර සූත්‍ර ලබා ගැනීමට හැකිව තිබියදී රියදුරන්ට හා එම සහායකයන්ට නිශ්කාර්යව වැටුප් ගෙවමින්, කුලී පදනම්න් පස් කැපුම් කටයුතු සඳහා පුද්ගලික පාර්ශවයන්ගෙන් වාහන ලබාගෙන තිබුණි.

(ආ) දෙපාර්තමේන්තුව මඟින් සිදුකළ වැවේ පතුලේ අඟල් 6 ක පස් ඉවත් කිරීමට අමතරව වැව මධ්‍යයේ දළ වශයෙන් වර්ගමීටර 1000 ක පමණ ප්‍රමාණයක තැනින් තැන අඩි 2 – 2 ½ පමණ ගැඹුරු විශාල වලවල් ඇතිවන අයුරින් පස් සෝදා වැලි ලබා ගැනීමට පස් ඉවත්කර තිබුණු අතර ඒ සම්බන්ධ තොරතුරු කිසිවක් ව්‍යාපෘතිය සතුව නොතිබුණි. වැවෙහි ජලය රැඳී පැවතීමට බාධා නොවන අයුරින්, රොන්මඩ ඉවත් කිරීමට හැකිව තිබුණද ඒ වෙනුවට වැවේ ජලය වසරකට ආසන්න කාලයක් සම්පූර්ණයෙන් ඉවත් කර පස් ඉවත්කර තිබීම හේතුවෙන් ගොවිතැනෙහි නියැළෙන ගොවීන්ට කන්න 3ක් වගා කිරීමට නොහැකි වී තිබුණි.

(ඇ) 2021 වර්ෂයේදී ආරම්භ කරන ලද කුඩාවිලච්චිය ජලාශය පුනරුත්ථාපන ව්‍යාපෘතිය යටතේ කුඩා ජලාශයේ වාන් දොරටු 5 ක් අලුතින් ඉදි කිරීමට නියමිතව තිබූ අතර රාජාංගණය ජලාශයෙන් ඉවත් කරන ලද හොඳ තත්ත්වයේ පැවැති වාන් දොරටු 5ක් අලුත්වැඩියා කර ඒ සඳහා යොදා ගැනීමට තීරණය කර තිබුණි. එම යකඩ ගේට්ටු 5 අලුත්වැඩියාව සඳහා රු.94,073,866 ක ඇස්තමේන්තුවක් පිළියෙල කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට යටෝක්ත ඇස්තමේන්තු මුදලින් රු .මිලියන 10 ක ප්‍රතිපාදන ලැබී තිබුණු අතර ඉන් රු.9,9997,582 ක් වැය කර එක් ගේට්ටුවක් අලුත්වැඩියා කිරීම හා ඇස්තමේන්තු ප්‍රකාරව Sand Blasting Yard එක ඉදිකිරීම සිදුකර තිබුණි. ජලාශයේ ඉදිකිරීම් අවසන් නොකිරීම හා අලුත්වැඩියා කරන ලද ගේට්ටු ජලාශයේ ඉදිකිරීම් සඳහා යොදා නොගැනීම හේතුවෙන් ඒ සඳහා දරන ලද පිරිවැය අනාවරණීක වියදමක් වී තිබුණි.

(ඇ) වේලිඔය අමුණේ වැලි තැන්පත් වීම හා ඉවත් කිරීම

i. 2007 වර්ෂයේ දී ඉදි කර තිබූ වේලිඔය අමුණු තුළ 2017 ආරම්භය වන විට වැලි ඝනමීටර් 500,000 තැන්පත්ව පවතින බව වේලිඔය ප්‍රාදේශීය ඉංජිනේරු විසින් ඇස්තමේන්තු කර තිබූ අතර වේල්ලේ වැලි යොරොව්වි 2017 වර්ෂයන් පසුව විවෘත කොට නොතිබීම හේතුවෙන් ඉන් අනතුරුවද වසර තුනක කාල සීමාව තුළ විශාල වැලි ප්‍රමාණයක් අදාළ ස්ථානයේ තැන්පත් වී තිබුණි. උමාඔය පහළ නිම්න සංවර්ධන ව්‍යාපෘතිය යටතේ වේලිඔය ජලාශයේ සිට කිලෝමීටර 20 ක් පමණ දුරින් පිහිටි කුඩා ඔය ජලාශය ඉදිකිරීම් කටයුතු සිදු කර තිබූ අතර ඒ සඳහා අවශ්‍ය ඇස්තමේන්තු ගත වැලි ප්‍රමාණය කියුබික් මීටර් 109,524 ක් විය. 2017 සිට 2020 දක්වා එහි ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් රුපියල් මිලියන 192 ක් වැයකර වැලි කියුබික් මීටර් 6,239 ක් පුද්ගලික සමාගමක් වෙතින් මිලදී ගෙන තිබුණි. වාරිමාර්ග දෙපාර්තමේන්තුව කුඩා ඔය ජලාශයේ ඉදිකිරීම් කටයුතු ස්වකීය සේවකයින් සහ උපකරණ යොදා වැඩ කිරීමේ ප්‍රසම්පාදන ක්‍රමය යටතේ ක්‍රියාත්මක කර තිබූ බැවින් වේලිඔය ජලාශයේ තැන්පත්ව තිබූ වැලි එම ව්‍යාපෘතියේ යන්ත්‍ර සූත්‍ර භාවිතා කර අවම පිරිවැයක් යටතේ උකහා ගැනීමට හා ඒවා කුඩාඔය ජලාශයේ ඉදිකිරීම් සඳහා යොදා ගැනීමට අවස්ථාව පැවැතිණි. එසේ වුවද කුඩාඔය වැව් බැම්මේ මෙම වැලි අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා ඩ්‍රෙජින් ලංකා පුද්ගලික සමාගම වෙත වේලිඔය අමුණේ වැලි ඉවත් කිරීම සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුව අනුමැතිය ලබාදී තිබුණි.

ii. අදාළ සමාගම 2018 වර්ෂයේ සිට ඉවත්කළ වැලි ප්‍රමාණය පිළිබඳ කිසිදු වාර්තාවක් ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය විසින් පවත්වාගෙන ගොස් නොතිබුණි.

iii. දෙපාර්තමේන්තුව සතු භූමි තුළින් ඛණිජ ඉවත් කිරීමේදී ගාස්තු අයකිරීමට විධිමත් ක්‍රමයක් හඳුන්වාදී නොතිබූ අතර වැලි කියුබ් එකක් සඳහා රුපියල් 150 බැගින් අය කරන ලෙස මොණරාගල වාරිමාර්ග අධ්‍යක්ෂක වෙත දැනුම් දී තිබූ නමුත් ඉවත් කළ වැලි සඳහා කිසිදු මුදලක් අය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) මොණරාගල දිස්ත්‍රික්කයේ කඩිනම් වාරිමාර්ග සංවර්ධන වෙල්ලස්ස නවෝදය ව්‍යාපෘතිය

2016 ජනවාරි 20 දිනැති අංක 15/2034/729/008 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව සඳහා එළඹ තිබූ අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව මොණරාගල දිස්ත්‍රික්කයේ කඩිනම් වාරිමාර්ග සංවර්ධන වෙල්ලස්ස නවෝදය ව්‍යාපෘතිය 2016 වර්ෂයේ සිට ක්‍රියාත්මක කර තිබුණි.

(i) එහිදී වාරිමාර්ග පද්ධතිය පුනරුත්ථාපනය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබූ රු. මිලියන 950 යටතේ අනුඥාත කර තිබූ රු.මිලියන 1,600 ක ඇස්තමේන්තුවලට අමතරව අමාත්‍ය මණ්ඩලය තීරණයට පටහැනිව, විධිමත් අනුමැතියකින් තොරව, මොණරාගල වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලය රු. මිලියන 1,700.5 ක වටිනාකමින් යුතු ව්‍යාපෘති 47 ක් ක්‍රියාත්මක කිරීම සඳහා මූලික කටයුතු සිදුකර තිබුණි.

(ii) 2016 සිට 2019 දක්වා කාලය තුළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා දී තිබුණද 2020 ජනවාරි සිට 2022 සැප්තැම්බර් දක්වා ව්‍යාපෘති කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා රු. 403,036,448 ක් වැය කර තිබූ අතර රු. මිලියන 1,025 ක මුළු මුදලක් වැයකර තිබුණි . ඒ අනුව අනුමත වැය සීමාව ඉක්මවා රු. මිලියන 650 ක ඇස්තමේන්තු අනුඥාත කිරීමටත් එම සීමා ඉක්මවා රු. මිලියන 75 ක් වැය කිරීමටත් මොණරාගල වාරිමාර්ග අධ්‍යක්ෂ කටයුතු කර තිබුණි.

(iii)මෙම ව්‍යාපෘතිය යටතේ මොණරාගල කලාපයට අයත් වැව් කිහිපයක රළපනාව සකස් කිරීම සඳහා රු. 9,570,000 ක් වැයකර කළුගල් කියුබ් 2,482 මිලදීගෙන තිබුණද මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කාල සීමාවට සමගාමීව 2016 වර්ෂයේ සිට මේ දක්වා ක්‍රියාත්මක උමාඔය පහළ නිම්න සංවර්ධනය හා දෙබරආර ඇළ ව්‍යාපෘති යටතේ ඇළ මාර්ග හා උමං මාර්ග ඉදිකිරීමේදී කළුගල් විශාල ප්‍රමාණයක් කැනීම් කර තිබුණද එම කළුගල් භාවිතයට ගැනීම තුළින් පිරිවැය අවම කරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) හිඹිලියාකඩ වාරිමාර්ග යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය

හිඹිලියාකඩ වාරිමාර්ග යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා 2022 වර්ෂය තුළදී දෙපාර්තමේන්තුවට අයත් යන්ත්‍රෝපකරණ 8 ක් යන්ත්‍ර ක්‍රියාකරුවන් 8 දෙනෙකු මඟින් 2022 වර්ෂයේ පැය 970.6 ක් පමණක් ක්‍රියාත්මක කර අමතරව පුද්ගලික අංශයෙන් කුලී පදනම මත ලබාගත් යන්ත්‍රෝපකරණ සඳහා බාහිර සැපයුම්කරුවන්ට රු.24,523,761 මුදලක්ද ගෙවා තිබුණි. එසේ වුවද එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන ස්ථානයට කිලෝමීටර 10 ත් 51 ත් අතර දුරකින් මිනිපේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයට අයත් යන්ත්‍රෝපකරණ 9 ක් නවතා දමා තිබුණද ඒවා යොදා ගැනීමට ඇති හැකියාව සලකා බලා නොතිබුණි. එම යන්ත්‍ර වර්ෂය තුළ ක්‍රියාත්මක කර තිබුණේ යන්ත්‍ර පැය 987ක් පමණක් විය.

3.8 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

සමාලෝචිත වර්ෂයේ අධ්‍යක්ෂ ජනරාල් වෙත නිකුත් කර තිබූ විගණන විමසුම් 05 ක් සඳහා වාර්තාවේ දිනය දක්වා පිළිතුරු ලබාදී නොතිබුණි.

3.9 කළමනාකරණ දුර්වලතා

(අ) ජල යෝජනා ක්‍රම වැව් හා ජලාශවල අනවසර ඉදිකිරීම් හා වගාකිරීම්.

i. දෙපාර්තමේන්තුවට අයත්ව පවතින ජල යෝජනා ක්‍රම, වැව් හා ජලාශ 387 කින් වැව් හා ජලාශ රක්ෂිත ප්‍රදේශ 116 ක රක්ෂිතයන්හි අනවසර පදිංචි හෝ වගාකිරීම් සිදුකර තිබුණි. 1946 අංක 32 දරන වාරිමාර්ග ආඥා පනතේ 65 වන වගන්තියේ හා වාරිමාර්ග රක්ෂිත සීමා, දෙපාර්තමේන්තු ඉඩම් ආරක්ෂා කිරීම හා නිදහස් කිරීම සඳහා වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් විසින් 2014 දෙසැම්බර් 01 දින නිකුත් කර තිබූ අංක 08/2014 දරන දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ විධිවිධානයන් අනුගමනය කර මේ සම්බන්ධව නෛතික ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

ii. ඇතැම් ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලවලට අයත් වැව්/ජලාශ සම්බන්ධයෙන් වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්ගේ 2014 දෙසැම්බර් 01 දිනැති අංක 08/2014 දරන චක්‍රලේඛයෙහි 1 හා 3 ඡේද ප්‍රකාරව දෙපාර්තමේන්තුව මඟින් පාලනය වන වැව් හා ජලාශවල රක්ෂිත ප්‍රදේශ සීමා හඳුනාගෙන එහි වපසරිය පිළිබඳ තොරතුරු පවත්වාගෙන ගොස් නොතිබුණි. පෞරාණික වටිනාකමක් සහිත තිස්ස වැවේ වැව් රක්ෂිතය තුළ කුඹුරු වගාකර තිබුණද එකී අනවසර වගාකිරීම් සම්බන්ධයෙන් උක්ත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කිරීමකින් හා අනුමැතියකින් තොරව අනවසර වගාකිරීම් වැවේ සීමාවෙන් පිටතට සිටිනසේ වැව තුළ ඇළක් කපා බැම්මක් ඉදිකර වැව වටා පාරක් සකස් කරමින් පැවතුණි.

iii. 1946 අංක 32 දරන වාරිමාර්ග ආඥා පනතේ 285 වැනි පරිච්ඡේදයේ 64 වැනි වගන්තිය අනුව වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ඒ යටතේ පාලනය වන ප්‍රධාන හා මධ්‍ය පරිමාණ ජල යෝජනා ක්‍රම ප්‍රධාන ගංගා ද්‍රෝණි ජලපෝෂක හා රක්ෂිතයන්හි ආරක්ෂාව, අනවසර ඉදිකිරීම් හා වගා කටයුතු පාලනය, ජලය අපවිත්‍ර කිරීමෙන් වලක්වා ගැනීම, අනවසර ජල භාවිතය පාලනය කිරීම හා වාරිමාර්ග යෝජනා ක්‍රමයන්හි නඩත්තුව කළ යුතු වුවද ඒ සම්බන්ධ විධිමත් නියාමනයක් සිදුකිරීමට අවශ්‍ය නිර්ණායක නිකුත්කර නොතිබුණි.

(ආ) ජල සම්පත් සංවර්ධනය සහ ගංවතුර පුරෝකථනය සඳහා භෞතිකව මිනුම් ලබා ගන්නා ජල මාපක 42 ක්, පර්යන්ත ජල මාපක 52 ක් හා ස්වයංක්‍රීය වැසි හා ජල මාපක 106 ක් ස්ථාපිත කර තිබුණද ඒවා භාවිතයෙන් දත්ත එක් රැස් කරන හා සාරාංශ කරන ආකාරය, දත්ත හා පිළියෙල කරන ලද තොරතුරු ගබඩා කර තබා ගන්නා ආකාරය, දත්ත හා තොරතුරු ඉල්ලුම් කරන පාර්ශව වෙත තොරතුරු ලබාදෙන හා තොරතුරුවල නිරවද්‍යතාවය තහවුරු කරන ආකාරය, ආපදා කළමනාකරණයේදී අනෙකුත් ආයතන සමඟ සම්බන්ධීකරණය වන ආකාරය, තොරතුරු ප්‍රසිද්ධ කරන ආකාරය යනාදිය සම්බන්ධයෙන් වගකිව යුතු

දෙපාර්තමේන්තුවේ ජල විද්‍යා හා ආපදා කළමනාකරණ අංශය විසින් පිරිවිතර හා ක්‍රමවේද නිශ්චය කර නොතිබුණි.

(ඇ) 2017 ජූලි 18 දිනැති අංක අමප/17/1456/729/017 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව ගල්ගමුව වාරිමාර්ග අභ්‍යාස ආයතනයේ ජාත්‍යන්තර මට්ටමේ පුහුණු පාඨමාලා හා වැඩමුළු පැවැත්වීම සඳහා 2017 වර්ෂයේ දී අනුමැතිය ලබා ගෙන තිබූ නමුත් පසුගිය වසර 06 තුළම ජාත්‍යන්තර මට්ටමේ පුහුණු පාඨමාලා කිසිවක් පවත්වා නොතිබුණි.

4. යහපාලනය

4.1 දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක මහාපරිමාණ හා මධ්‍යපරිමාණ ව්‍යාපෘති 19 ක් සඳහා රු. මිලියන 158,242 ක්ද වෙනත් ව්‍යාපෘති 7 ක් සඳහා රු. මිලියන 43,375 ක්ද ඇස්තමේන්තු කර තිබූ අතර මෙම ව්‍යාපෘති සඳහා 2022 දෙසැම්බර් 31 දිනට පිළිවෙලින් රු. මිලියන 60,056 ක් හා රු.මිලියන 15,787 ක් වැයකර තිබුණි. මේ අතරින් ව්‍යාපෘති 17 ක් සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කර නොතිබුණි.

4.2 කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2018 මැයි 21 හා 2019 ජූනි 24 දිනැති අංක DMA/PRF/10/2019/01 දරන විගණන මාර්ගෝපදේශ ලිපි අනුව දේශීය හා විදේශීය මූල්‍යනය සහිතව ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති කාර්යාලවල විගණන හා කළමනාකරණ කමිටු ස්ථාපනය කර අවම වශයෙන් වර්ෂයකට කමිටු රැස්වීම් හතරක්වත් පැවත්විය යුතු වුවද 2022 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ දේශීය හා විදේශීය අරමුදලින් ක්‍රියාත්මක ව්‍යාපෘති 26 විසින් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.

5. මානව සම්පත් කළමනාකරණය

(අ) දෙපාර්තමේන්තුවේ අනුමත ස්ථිර කාර්ය මණ්ඩලය 7007ක් හා තථ්‍ය කාර්ය මණ්ඩලය 5387ක් වූ අතර ඊට අමතරව දෛනික වැටුප්, ඉටුකළ කාර්ය හා වෙනත් ගෙවීම් පදනම් මත සේවා ගිවිසුම් යටතේ විවිධ කටයුතු සඳහා බාහිර පුද්ගලයින් බඳවාගෙන ගෙවීම්කර තිබුණි. 2022 දෙසැම්බර් 31 දිනට එවැනි කාර්ය මණ්ඩලය 334 ක් වූ අතර ඉන් 04 කාර්යාලවලට අනුයුක්ත කර තිබුණි.

(ආ) දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 7.2.1.2(ආ) 1 වගන්තිය අනුව III වන ශ්‍රේණියේ සෘජු බඳවා ගැනීම් සඳහා වෘත්තීය සුදුසුකම ලෙස ගල්ගමුව වාරිමාර්ග අභ්‍යාස ආයතනයෙන් වාරිමාර්ග ඉංජිනේරු ඩිප්ලෝමාව හදාරා සහතිකයක් ලබා තිබීම පිළිගෙන ඇති අතර එම පාඨමාලාව NVQ 6 මට්ටමේ විය යුතු විය. සේවා ව්‍යවස්ථාව අනුමත කර වසර 05 ක් ගතවී ඇතත් අදාළ ඉංජිනේරු ඩිප්ලෝමාව සඳහා NVQ 6 මට්ටම අනුමත කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

එම්.ඩී. සුදර්ශනී අමරතුංග
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට